

# ධර්ම වාහිනී

# ධර්ම වාහිනී

## ශ්‍රී සත්‍ය සායි බාබා

**ප්‍රකාශනය**

ශ්‍රී සත්‍ය සායි සේවා මධ්‍යස්ථානය
ගම්පහ

**මුද්‍රණය**

නිශ්ශංක ඕෆ්සෙට්
ගම්පහ

"ධම්ම වාහිනී" ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය හා ප්‍රකාශනය සඳහා අවශ්‍ය අවසරය ඉන්දියාවේ, ආන්ද්‍ර ප්‍රදේශ්හි, පුට්ටපර්තිහි පිහිටි ප්‍රශාන්ති නිලයම්හි ශ්‍රී සත්‍ය සායි ග්‍රන්ථ හා ප්‍රකාශන මණ්ඩලය විසින් ගම්පහ ශ්‍රී සත්‍ය සායි සේවා මධ්‍යස්ථානයට දී ඇත. ශ්‍රී සත්‍ය සායි ග්‍රන්ථ හා ප්‍රකාශන මණ්ඩලයේ පූර්ව අවසරය නොමැතිව මෙම ග්‍රන්ථයේ එන කොටසක්, ඡේදයක් හෝ උධෘතයක් කුමන ආකාරයකින් හෝ උපුටා ගැනීම, ප්‍රචාරය කිරීම හෝ යොදා ගැනීම හෝ නොකළ යුතුය.

**ප්‍රකාශනය**

ගම්පහ ශ්‍රී සත්‍ය සායි සේවා මධ්‍යස්ථානය, අංක 180, යක්කල පාර, ගම්පහ

**පරිවර්තක**

ආර්. ලයනල් දහනායක
61, ඒ/2, පැරකුම් මාවත,
බණ්ඩාරවත්ත, ගම්පහ
දුරකථනය - 033-22637

**පළමු මුද්‍රණය** : 2003

ISBN - 955-8711-00-4

මෙම සිංහල පරිවර්තනය ශ්‍රී ලංකාවේ ශ්‍රී සත්‍ය සායි සේවා සංවිධානයේ ග්‍රන්ථ පරිවර්තන අනුමත කිරීමේ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## පරිවර්තකගෙන්............

ශ්‍රී ලංකාවේ වෙසෙන සිංහල භාෂාව පමණක් දන්නා සායි බැතිමතුන් සඳහා හැකිතරම් ශ්‍රී සත්‍ය සායි දහම අඩංගු පොත් මුද්‍රණය කිරීමට උදව් දෙන්නැයි යනුවෙන් ශ්‍රී ලංකාවේ සත්‍ය සායි සේවා සංවිධානය විසින් කරන ලද සඳහන අනුව අප විසින් ශ්‍රී සත්‍ය සායි බාබා තුමා විසින් ලියා ඇති "ධම්ම වාහිනී" නම් ග්‍රන්ථයේ සිංහල පරිවර්තනයක් සකස් කළෙමු. මෙවැනි භාරදූර කටයුත්තකට අත ගැසීමට ලැබීම භාග්‍යක් කොට සලකමු.

මෙම පරිවර්තනය සකස් කිරීමෙහිලා අපට උනන්දු කළ ගම්පහ ශ්‍රී සත්‍ය සායි සේවා මධ්‍යස්ථානයේ ගරු සභාපති නිතිඥ තිස්ස කරුණාරත්න මහතාට අපගේ ස්තුතිය හිමිවේ.

මෙය පරිවර්තනය කිරීම හා ප්‍රකාශනය සඳහා ශ්‍රී සත්‍ය සායි ග්‍රන්ථ හා ප්‍රකාශන භාරකාර මණ්ඩලයෙන් අවශ්‍ය අවසරය ලබා ගැනීම සඳහා උනන්දුවෙන් ක්‍රියා කළ ශ්‍රී ලංකාවේ සත්‍ය සායි සේවා සංවිධානයේ ප්‍රධාන සම්බන්ධීකරන නිලධාරී එම්. වන්නියාසේකරම් මහතාටද අපගේ කෘතඥතාවය පිරිනමමු.

මෙහි සෝදුපත් කියවා බැලීමට සහාය දුන් වෛද්‍ය ශිෂ්‍ය සචින්ද ප්‍රශාන්ත මොරායස් තරුණ මහතාටද, පිටකවරය සකස් කිරීම හා කොම්පියුටර් ටයිප් සෙටින් කළ ගම්පහ යක්කල පාරේ "අධිකාරී කොම්පියුටර් ග්‍රැෆික්ස්" ආයතනයටද, ඉතා උනන්දුවෙන් මෙය මුද්‍රණය කර දුන් ගම්පහ "නිශ්ශංක ඕෆ්සෙට්" හි නියුතු සැමටද කෘතඥ වෙමු.

ආර්. ලයනල් දහනායක
පරිවර්තක

# ප්‍රස්තාවනාව

ප්‍රශාන්ති නිලයම් වලින් නිකුත් කරනු ලබන "සනාථන සාරථී" මාසික සඟරාවට භගවාන් ශ්‍රී සත්‍ය සායි බාබා තුමා විසින් "ධම් වාහිනී" පෙළ යටතේ ලියන ලද ලිපි මෙම කුඩා පොතෙහි අඩංගුය. ඒවා මෙහි සටහන් වනුයේ ඉංග්‍රීසි බසින් නමුදු තෙලුගු බසින් වූ මුල් ලිපි පැහැදිලි හා රසවත් බව කිව යුතුය. ඉන්දියානු සංස්කෘතියේ මූලික අභිප්‍රායයන් ඉංග්‍රීසි බසින් ප්‍රකාශ කිරීම දුෂ්කර වන්නේ ඉංග්‍රීසි භාෂාව පරිවර්තකයාටත් සමහර විට බොහෝ පාඨකයින්ටත් ආගන්තුක වන හෙයිනි. ඉන්දියානු භාෂාවන්හි පොදු ව්‍යවහාරයේ පවත්නා බොහෝ වචන සඳහා සතුටුදායක සමාන වචන ඉංග්‍රීසි වාග් මාලාවේ නොමැත. එමනිසා බාබා තුමාගේ පැහැදිලි තෙලුගු වලට මිශ්‍රවී ඇති නොපැහැදිලි වීමක් වේනම් පාඨකයාගෙන් සමාව අයැදිමි.

මෙම පොත පිළිබඳව මෙසේ කිව යුතුය. එය මෙකල ජීවත්වන කෝටි සංඛ්‍යාත ස්ත්‍රී පුරුෂයින්ගේ සදාචාර ධම් සහ හැසිරීම තිසි පරිදි හසුරුවන දේව ආශ්චර්යයෙහි සත්‍ය වචනය වේ. එම නිසා එය සැළකිලිමත්ව හා භක්තිමත්ව අධ්‍යයනය කිරීම වටනේය. ආචාර ධම්යන්හි තත්ත්වය පහත වැටුනු විට සහ මිනිසා ඔහුගේ ශ්‍රේෂ්ඨ ඉරණම අමතක කළ විටද දෙවියන් මිනිසුන් අතරට පැමිණ මනුෂ්‍ය වර්ගයා නිවැරදි හා පවිත්‍ර මාර්ගයට කැඳවාගෙන යන බව දෙවියන් විසින් ප්‍රකාශ කර ඇත. දෙවියන් පැමිණ ඇත. මගපෙන්වීම පිළිගන්නවුනට එතුමෝ මාර්ගය පෙන්වන්නෝය. නියම මාර්ගයෙන් ඉවත් වූ අයට ඔවුන්ගේ මාර්ගය නැවත සොයාගන්නා ලෙස එතුමෝ ඉල්ලන්නෝය. බාබා තුමාගේ ප්‍රේමයට හා ප්‍රඥාවට සීමා නොමැත්තේය. එතුමාගේ අනුග්‍රහයට අවශිරයක් නොදැනේ. එතුමා බරපතල වැඩ ගන්නා ස්වාමියෙකු නොවේ. අපගේ ශුභසිද්ධිය හා අව්‍යාජ අභිවෘද්ධිය සඳහාවූ එතුමාගේ අනුග්‍රහය අති ශක්තිමත්ය.

ඔබගේ විශේෂ ලක්ෂණයන් මහා සේවා උපකරණයක් ලෙස විදහා හැරීමට ආරාධනය කෙරෙන මෙම පොත ලිවීම සඳහා බාබාතුමා උනන්දු කරවූ මාතෘ ප්‍රේමයත්, මෙහි ඇති සෑම නියමයකටම රැකුල් දුන් පිතෘ ආධිපත්‍යයත්, සෑම ප්‍රකාශයක්ම බැබලීමට ලක් කෙරෙන ගුරු ආලෝකය සහ දෙවියන්ගේ අති උදාර සාරවිකතාවත් මෙම පොතෙන් ඔබට එළිදරව් වේවා.

**එන්. කස්තූරි**

**සම්පාදක : සනාථන සාරථී**

# ධම් වාහිනී

## පළමුවෙනි පරිච්ඡේදය

මිනිසාට සාමයෙන් ජීවත්වීම සඳහාද, ලෝකයට සාමය භුක්ති විඳීමට හැකිවීම සඳහාද මිනිසා ධම්යට කැපවිය යුතු අතර, සෑම විටම මිනිසා ධම්යෙහි හැසිරිය යුතුය. ඔහුට ධම්ානුකූල දිවිපෙවෙතකින් බැහැරව නියම සාමය අත්කර ගැනීම හෝ දේව අනුග්‍රහය දිනාගැනීම හෝ කළ නොහැක. මනුෂ්‍ය ප්‍රජාවගේ ශුභ සිද්ධියේ අත්‍යාවශ්‍යම ධම්ය වේ. එය සෑම කල්හිම ස්ථිරවූ සත්‍යය වේ. ධම්යට මනුෂ්‍ය ජීවිතයේ පරිවර්තනයක් ඇති කළ නොහැකි වූ විටදී, අරගල සහිත විපර්යාසයන්ගෙන් පීඩාවන ලෝකය කටුක වේදනාවන්ගෙන් හා භීතියෙන් ශිරිහැරයට පත්වන්නේය. ධම්යේ කාන්තියට මනුෂ්‍ය සබැඳියාවන් ආලෝකවත් කිරීමට නොහැකි වූ විටදී මනුෂ්‍ය වර්ගයා ඝන අන්ධකාරයෙන් වැසී යන්නේය.

ධම්යේ මූර්තිය දෙවියෝය. දෙවියන්ගේ අනුග්‍රහය දිනාගත හැක්කේ ධම්යෙනි. දෙවියෝ සදාකාලයටම ධම්ය පෝෂණය කරන්නෝය. දෙවියෝ සෑම විටම ධම්ය තහවුරු කරන්නෝය. දෙවියෝ ධම්ය වෙති. වේද, ශාස්ත්‍ර, පුරාණ සහ ඉතිහාස වලින් ධම්යේ මහිමය මහ හඬින් ප්‍රකාශ කෙරේ. නොයෙකුත් ආගම්වල ධම් ග්‍රන්ථයන්හි, භක්තිවන්තයින්ට හුරු පුරුදු භාෂාවෙන් ධම්ය විස්තර කර ඇත. ධම්යේ දෘෂ්ටාන්තය වශයෙන් දැක්වෙන "ධම් නාරායන" ව සියලුම මනුෂ්‍යයන් විසින් සියලු කල්හිදීම ගරු බුහුමන් දැක්වීම යුතු කමකි. ධාර්මික ක්‍රියාවලිය නමැති දිය පාර කිසි දිනක නොසිඳිය යුතුය. එහි සිසිල් ජලය ගලා යාම නැවතුන විටදී ව්‍යසනය නිසැකය. සරස්වති ගංගාව ගස් මුල් පෝෂණය කරමින්, උල්පත් පුරවමින් පොළොව තුලින් ගලා බස්නා සේ, ධම්ය පැවතෙන හෙයින් මනුෂ්‍ය ප්‍රජාව මෙම තත්ත්වයට පත්ව ඇත. සැපවත්ව, සතුටින් හා සැනසිල්ලෙන් කාලයක් ජීවත්වීම සඳහා මනුෂ්‍ය වර්ගයා පමණක් නොව පසුන් හා තිරිසනුන්ද ධම්යෙහි හැසිරිය යුතුය.

එමනිසා, ලෝකයට සන්තුෂ්ටිය භුක්ති විඳීමට හැකිවන සේ ධම් ජලය නිරන්තරයෙන් ගලා යාමට සැලැස්විය යුතුය. මෙකල ලෝක කරළියෙහි විපත්තීන් උමතුවෙන් නර්තනය කරනුයේ, යුක්තිය පැහැර හැරීමත්, ධාර්මික ජීවිතයේ ඉතා වැදගත් දේ පිළිබඳව විශ්වාසයක් නොමැති වීමත් නිසාය. එබැවින් ධම්යේ හරය මිනිසා විසින් පැහැදිලිව අවබෝධ කරගත යුතුය.

ධම්ය යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද? ධම්යේ සාරය කුමක්ද? ධම්යෙහි ඇලී සිටීමෙන් මිනිසාට - සාමාන්‍ය මිනිසාට - විනාශ නොවී ප්‍රීතිමත් ජීවිතයක් ගතකළ හැකිද? ජීවිත කාලය තුල මෙම සැකයන් විසින් මිනිසාගේ සිත ස්වභාවයෙන්ම ව්‍යාකූල කරනු ලබයි. ඒවා විසඳීම අවශ්‍ය වන අතර ඉක්මණින්ද

කළ යුතුය.

ධර්මය යන වචනය සඳහන් කළ විගසම සාමාන්‍ය මිනිසා එහි අදහස වශයෙන් ගනුයේ දන් දීම, වන්දනාකරුවන්ට ආහාර සහ නවාතැන් දීම ආදිය, යමෙකුගේ පාරම්පරික වෘත්තියේ හෝ කර්මාන්තයේ යෙදී සිටීම, නීති ගරුක බව, හොඳ සහ නරක පිළිබඳ වෙනස්කම් සැලකීම, යමෙකුගේ සහජ ගතියෙහි ස්වභාවය හෝ සිතෙහි පුදුම හෝ විකෘතභාවය ගැන සෙවීම, තමාගේ ප්‍රියමනාප ආශාවන් එලගැන්වීම ආදිය වේ.

ඇත්ත වශයෙන්ම, ධර්මයෙහි නිමල මුහුණුවර බොහෝ කාලයක සිට හඳුනා ගැනීමට පවා නොහැකි ලෙසට කෙලෙසා ඇත. අලංකාර භූමි සහ වනෝද්‍යාන නොසැලකිල්ල නිසා වල් බිහිවන අතර, ඒවා පහසුවෙන් හඳුනාගැනීමට නොහැකි ආකාරයට ලැහැබ් බිම් හා කටු පඳුරු සහිත කැලෑ බවට පත්ව ඇත. ලෝභී මිනිසුන් විසින් අලංකාර වෘක්ෂයන් කපා දැමීම නිසා භූමි දර්ශනයන් වෙනස්වී ඇත. කාලයාගේ ඇවෑමෙන්, මිනිසුන් නව තත්ත්වයන්ට පුරුදු වන අතර, වෙනස්වීම්ද පහත වැටීම්ද ඔවුනට නොවැටහේ. ධර්මයටද මෙය සිදුවී ඇත.

වේදයන්හි, ශාස්ත්‍රයන්හි සහ පුරාණයන්හි විස්තර කර ඇති ධර්මයෙහි සංක්ෂේප තොරතුරු පිළිබඳව සෑම මනුෂ්‍යයෙකු විසින්ම දැනගත යුතුය. අපොහොසත් බුද්ධිය, අසීමිත උද්වේගය සහ දූෂ්‍ය වූ තර්ක කිරීම් නිසා වූ වැරදි වැටහීම් ඇති හෙයින් ඒවාට අධික ලෙස බාල දේ මිශ්‍ර කර ඇති අතර ඒවායේ මහිමය කණගාටුදායක ලෙස පිඩාවට පත්ව ඇත. පැහැදිලි නිල් අහසින් පොළොවට වැටෙන වැහිබිඳු පැහැය වෙනස්වී කිලිටි වන්නා සේ, පැරණි සෘෂිවරුන්ගේ නිර්මල පණිවුඩය, ඔවුන්ගේ විශිෂ්ට ක්‍රියාවන්හි ආදර්ශය, ඔවුන්ගේ ක්‍රියාවන් පසුපස ඇති දීප්තිමත්, ඔපවත් පෙළඹවීම් ආදී සියල්ලම අශිෂ්ට අර්ථ කථකයින් හා උගතුන් විසින් ඒවායේ මුල් අලංකාරය අශෝභන හාස්‍ය උපදවන විකට චිත්‍ර බවට පත් කොට ඇත.

ළමුන් සඳහා ලියන ලද පොත්වල පාඨයන් පැහැදිලි කිරීමට චිත්‍ර ඇත. නමුත් ළමෝ ඔවුන්ගේ කාලය චිත්‍ර බලමින් ගත කරන අතර එම චිත්‍ර වලින් පැහැදිලි කිරීමට අදහස් කරනුයේ කුමක්ද යන්න අමතක කරති. එමෙන්ම ගැඹුරින්ම අව්‍යාජවූ මහා සත්‍යයන් පැහැදිලි කිරීම සඳහා ඇති පූද පූජා ඇත්ත වශයෙන්ම නියම සත්‍යයන් බවට අපරීක්ෂාකාරීන් හා නූගතුන් විසින් වැරදි ලෙස තේරුම් ගෙන ඇත. ඒවායින් පැහැදිලි කිරීමට අවශ්‍යවූ සත්‍යය ඔවුන් විසින් නොසලකා හැර ඇත. මහමග ගමන් කරන්නෝ මග අසල ඇති නවාතැන්පලවල මොහොතක් විඩා හරිති. නමුත් ඔවුනට සෙවන දුන් එම නවාතැනට නොසැලකිල්ල නිසා හෝ වැරදි පරිහරණය නිසා හෝ හානි පමුණුවති. එමෙන්ම උදාසීනයන් හා දුෂ්ට මිනිසුන් වේද සදාචාරයේ මුහුණුවර වෙනස් කර, වේදයන් විසින් උගන්වනුයේ ඔවුන්ගේ ක්‍රියාවන්ම බවට ලෝකයා මුළාවට පත්වනසේ විශ්වාස කිරීමට සලස්වති.



ධර්මය එසේ හිංසාවන්ට භාජනය වූ විටද, දෙවියන්ගේ සතුරන් අතින් ධර්මයේ මුහුණුවර විරූපී බවට පත්වූ විටද මහා දෙවියෝ, දෙවියන්ගේ සහ දේවත්වයට පත්වූවන්ගේ හඬට කන්දී, ධර්මයේ සහ කර්මයේ සෙපත්‍රයෙහි, එනම් ආදර්ශයෙන් හා ක්‍රියාවෙන් යුක්තිය සහ සත්‍යය යළි ස්ථාපනය කොට ලෝකය ව්‍යසනයෙන් බේරා ගන්නා ලදී.

වර්තමානයේ පැවතෙන අඥ භාවය සුව කළ හැක්කේ කවරෙකුටද? රාගය, තරහව, තණ්හාව, මුළාව, උඩඟුකම සහ වෛරය යන ගති විසින් මිනිසා ව්‍යසනයට ඇද දමනු ලබන සයගති ඇති අරිපද්වර්ග මෘගයා විනාශ කළ යුතුය. ධර්මය යළි ස්ථාපනය කළ හැක්කේ මේ ආකාරයට පමණි.

දෙවියන් ධර්මය ලෙස වේදයන්හි සඳහන් කර ඇති අතර, බුදුන්වහන්සේ විසින් විඥානයයයි හඳුන්වන ලදී. එසේ වූයේ, සෝමක නම් අසුරයාගේ කාලයේ මෙන්ම එකලද "වේදය" යන වචනයට කිසිවෙකුත් නොකැමති වූ හෙයින්ද වේදය පිළිපැදියවුන් එය "වේදය" යනුවෙන් හැඳින්වීමෙන් වැළකුන හෙයින්ද වේ. මරණයට බියවන්නන්ගේ එවැනි හැසිරීම් පිළිගත හැක. එසේ වුවද බුදුන්වහන්සේ වේදයට ගරු කළ සේක. උන්වහන්සේ සෑම විටම දෙවියන් සිතට නාවද්දාගෙන සිටියහ. බොහෝ විට බුදුන්වහන්සේ දෙවියන් නැතැයි යන විශ්වාසය ඇත්තෙකු, එනම් "නස්තික" ලෙස හඳුන්වන ලදී. බුදුන්වහන්සේ නස්තික වූයේ නම්, අස්තික, එනම් දේවවාදීහු කවරහුද? බුදුන්වහන්සේගේ මුළු ජීවිතයම ධර්මයේ කථාන්තරයකි. ධර්මයේ සහ කර්මයේ මාර්ගයට විරුධවූ කෙනෙකු ලෙස සමහරුන් විසින් ශංකරව හඳුන්වනු ලැබිය. නමුත් ශංකර විරුද්ධත්වය පෑවේ, ආශාවන් ඉෂ්ට කිරීමේ අදහස් පෙරදැරි කරගෙන කරන ලද ධර්මයට සහ කර්මයට විය. ඔහු ඇත්ත වශයෙන්ම ධර්මයේ සහ කර්මයේ මාර්ගයද මූලික සත්‍යය අවබෝධකර ගැනීමේ වෑයම පෙළඹවීමේ මාර්ගයද පහදා දුන් මහා ඇදුරාණෝ විය.

සත්‍යය මත පදනම්වූ ධර්මයට සහ කර්මයට ශංකරගේ තුබූ ඇල්මත්, වේදයන්හි ඉතා වැදගත් දෙය කෙරෙහි බුදුන්වහන්සේ තුළ තුබූ විශ්වාසයත් අගය කළ හැක්කේ උසස් දෘෂ්ටිය ඇත්තවුනට පමණි. යමෙකු එසේ නොමැතිව අර්ථ කථනයන් කිරීමේදී නොමග යනු ඇත. යම්කිසි උස් ස්ථානයකට නැඟීමට එම උස තරම්ම වූ හිණිමගක් අවශ්‍යය. එසේ නොවේද?

යමෙක් ඔහුගේ මමත්වය යටපත් කරන්නේද, ආත්මාර්ථකාමී ආශාවන් පාලනය කරන්නේද ඔහුගේ තිරිසන් සිතිවිලි සහ ආවේගයන් විනාශ කර ශරීරය තම ආත්මය වශයෙන් සැලකෙන ස්වාභාවික නැඹුරුව අත්හරින්නේද, ඔහු ඇත්ත වශයෙන්ම ධර්මයේ මාර්ගය තුළ සිටී, ධර්මයේ අරමුණ නම්, රළ මුහුද සමග එක්වීම, ආත්මය පරමාත්මය සමග එක්වීම බව ඔහු දනී.

සියලුම ලෞකික ක්‍රියාවන්හිදී ශිෂ්ටත්වයට හෝ යහපත් ගුණධර්ම විධින්ට විරුද්ධව කටයුතු නොකිරීමට වගබලාගත යුතුය. අභ්‍යන්තර ආධ්‍යාත්මික පෙළඹවීම් වලට ද්‍රෝහී නොවිය යුතුය. සෑම විටම බුද්ධිය විසින් කරනු ලබන යෝග්‍ය නියමයන්ට සැලකිල්ල දැක්වීමට සූදානම් විය යුතුය. ඔබ අන් කෙනෙකුට බාධා පමුණුවන්නේදැයි බලමින් ඔබගේ පියවර ගැන සැලකිලිමත් විය යුතුය. විවිධාකාරයෙන් දිලිසෙන්නාවූ දේ තුල සැඟවී ඇති සත්‍යය අනාවරණය කර ගැනීමට සෑම විටම පරීක්ෂාකාරී විය යුතුය. මිනිසාගේ මුළු යුතුකමද ඔබේ ධර්මයද මෙයයි. මේ සියල්ලම් බ්‍රහ්මන් (සර්වම් ඛල්විදම් බ්‍රහ්මම්) බව ඔබට වටහා දෙන ඔබේ ඥාන ශක්තිය නැමැති දැල්වෙන ගින්නෙන් ඔබේ මමත්වයේ ලක්ෂණයන් සහ ලෞකික බැඳීම් අළු බවට පත් කෙරේ. බ්‍රහ්මන් සමඟ එක්වීම නමැති මධු පානයෙන් ඔබ මත් විය යුතුය. ධර්මයේ පෙළඹවීමෙන් ඇතිවන ධර්මයේ සහ කර්මයේ අවසාන අරමුණ එය විය යුත්තේය.

"ඥානය නමැති අල්තාරය මත අඥානය සහ අහංකාරය පුද කර එහි ධර්මය ස්ථාපනය කරන්න" වේදයේ පණිවුඩය මෙයයි. ආත්මය පරමාත්මය සමග එක්වීම සඳහා ඉඩ සලසන, සෑම තැනකම ව්‍යාප්තව පවතින මූලික බ්‍රහ්මන් දෙසට යොමුවන දෘෂ්ටිය පුළුල් කරන, ආත්මාර්ථකාමී නොවන සෑම ක්‍රියාවක්ම ධාර්මික ක්‍රියාවකි. එවැනි සෑම ක්‍රියාවක්ම, බ්‍රහ්මඥානය නමැති සාගරය වෙත ගලායන පවිත්‍රතාවය නමැති ගංගාව පෝෂණය කරන කුඩා දිය පාරකි. ඔබේ සියලු ක්‍රියාවන් සහ ක්‍රියාකාරකම් විශ්වයේ ව්‍යාප්තව පවත්නා පරමාත්මයට පිදුම් කිරීමේ පිළිවෙත් වේ. කැපවීමකින් හා පරිත්‍යාගශීලී ලීලාවෙන් කරනු ලබන කුමන ක්‍රියාවක් වුවද යථාර්ථාවබෝධයට යොමු කෙරෙන ධර්මයේ අවයවයක් වේ. භාරතීය ජීවන ක්‍රමයේ ව්‍යුහය මග පෙන්වන්නේ සෑම මොහොතක්ම හා වචනයක්ම, සෑම සිතිවිල්ලක් හා ක්‍රියාවක්ම පාරිශුද්ධත්වයට පත්කොට යථාර්ථාවබෝධය කරා ගන්නා පියවරක් බවට පරිවර්තනය කිරීමටය.

අතීත ධර්මකර්මයන් වටහාගත හැක්කේ ඒවායින් අභවන අභිප්‍රාය තුළට ඇතුල් වීමෙනි. ආධ්‍යාත්මික ක්ෂේත්‍රයේ විශේෂ අර්ථ දැක්වීම් ඇති ශිල්පීය යෙදුම් ඇත. ශාස්ත්‍රයන්හි ඉගැන්වීම් නිවැරදිව අවබෝධ කරගැනීම සඳහා මේවා පැහැදිලිව තේරුම්ගත යුතුය. අපි නිදසුනක් ගනිමු, පැරණි කාලයෙහි මනුෂ්‍යයන් විසින් යාඥා උත්සව පවත්වන ලදී. එම යාඥාවන්හිදී පශු නොහොත් තිරිසනුන් බිලිදීම කරන ලදී. නමුත් තිරිසන් සත්වයා සංකේතයක් පමණි. කැලි වලට කැපිය යුතුව තුබුනේ කථාකල නොහැකි ඒ තිරිසන් සත්වයා නොවේ. මිනිසා විසින් තිරිසනාගේ ජීවිතය දංගෙඩිය මතදී කෙලවර නොකලද ඌ ගතකරන්නේ කැපවීමකින් යුත් ජීවිතයකි. අතුණු අස්කොට පුද කරන තිරිසනා ඊට වෙනස්ය. ආධ්‍යාත්මික වචන මාලාවේ තිරිසනා යනුවෙන් අදහස් කරනුයේ "ශරීර සචේතනික බව" "මමත්ව සචේතනික බව" වේ. ඝාතනය කළ



යුත්තේ එයයි. මහා දෙවියෝ පශුපති නොහොත් ගෝවින්ද යනුවෙන් හැඳින්වේ. පශුපති යනු සියලු ජීවින්ගේ මහා දෙවියෝය. පශු යන්නෙහි අදහස ජීවය වේ. ගෝවින්ද යනු දෙනුන්ගේ නොහොත් ජීවින්ගේ ආරක්ෂකයායි. "ගෝ" යනු ජීවයයි. ජීවයන් රැකබලා ගැනීමේ මෙහෙය ඇඟවීම සඳහා දෙනුන් රැකබලා ගැනීමෙහි මූර්තිමත් වනුයේ ක්‍රිෂ්ණගේ ලීලයකි.

ගායත්‍රියන්හි ගැඹුරු අභ්‍යන්තරික අර්ථ තිබේ. ධර්මයේ අභිප්‍රාය වනුයේ, බාහිර ස්වභාවයට ජීවියාගේ ආශාව සහ එමගින් ඇති කරන මායාව නැති කොට, එහි නියම ස්වභාවය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට සැලැස්වීමෙන් හෝ දැනට යථාර්ථය වශයෙන් සලකා ඇතිදේ යථාර්ථය නොවන බවට අනාවරණය වීමට සලස්වා එහි අව්‍යාජ අනන්‍යතාවය එළිදරව් වීමට සැලැස්වීමය.

මෙම අදහස් තරුණ මහලු යන් සෑම විසින්ම දැනගත යුතුය. නිදසුනක් වශයෙන් ශිව දේවාලය ගන්න. ශිව දෙවියන්ගේ ප්‍රතිමාව ඉදිරියේ නන්දි නම් ගවයාගේ පිළිරුව තිබේ. එම පූජ්‍ය ගවයා ශිවගේ වාහනය නිසා එය එහි තිබෙන බව කියනු ලැබේ. නමුත් ඇත්ත වශයෙන්ම ගවයා නොහොත් පශු යනුවෙන් අදහස් කරනුයේ ජීවය වන අතර, ශිව සංකේතය "ලිංගම්" වේ. මේ දෙක එකට මිශ්‍ර වියයුතු හෙයින් "ජීවය සහ ශිව වන ගවයා සහ ලිංගම් අතරින් කිසිවෙකු ගමන් කිරීම නොකළ යුතු බව" කියවේ. නන්දිගේ අංදෙක අතරින් ශිව දැකිය යුතු බව කියනු ලැබේ. මෙයට හේතුව විමසීමේදී මිනිසුන් දක්වනුයේ "ලිංගම් දැකීමේ අනෙකුත් ක්‍රමයන්ට වඩා මෙම ක්‍රමය වඩා පවිත්‍ර බව" වේ. එහි අභ්‍යන්තර අදහස නම් "ඔබ ජීවය තුල ශිව දැකිය යුතුය" යන්නය. පශු සහ පශුපති එකම දෙයකි. නන්දි සහ ඊශ්වර නන්දීශ්වර වේ. මේ දෙකම එක වස්තුවක් හැඳින්වීමේ ක්‍රම දෙකක් පමණි. දාස භාවයේ සිටින විට එය නන්දි නම් වේ. බැඳීමෙන් මිදුනු විට ඊශ්වර වී නන්දීශ්වර බවට පත්වේ. එවිට එයට වැඳුම් පිදුම් කරන අතර එසේ ගරු කිරීම සුදුසු වේ. පශුපති වෙත පශු පුද කළ විට ජීවා වෙන් වෙන් වශයෙන් හැඳින්වීම ඉවත් වේ. නියම යාඥාව එයයි. එම වැදගත්කම මෙකල අමතක කොට ඇත.

අද මෙම සංකේතාත්මක ක්‍රියාවන් පිළිගත නොහැකි තරමට වෙනස් වී ඇත. අද ක්‍රියාමාර්ගයන් හා ඉහත කාලයේ මූල ධර්මයන් දුරස්තර වී ඇත. ලෞකික ජීවිතයේ සුළු කාරණයක් පවා ආධ්‍යාත්මික පරිපූර්ණත්වය වන උසස් භාවය කරා ගෙනයාමට උද්‍යෝගී කරන්නක් විය යුතුය. එවිට සාමාන්‍ය ජනතාව පවා පියවරෙන් පියවර අරමුණ කරා ලඟා කරවිය හැක. සෑම ක්‍රියාවකම පිළිවෙල සහ අරමුණ විමසා නොබලා කරගෙන යන විටදී එය යල් පැනගිය විහිළුවක් බවට පත්වේ. කලෙක ප්‍රාන්ලාදද මෙසේ කියා තිබේ. "මමත්වය විනාශ කිරීමට නොහැකි හෙයින්, ඒ වෙනුවට කථාකළ නොහැකි තිරිසනා විනාශ කිරීම මිනිසාට පහසුය. තිරිසනුන් විනාශ කිරීම තමෝ

ගුණය විදහා දැක්වීමකි. එය වහල් භාවයේ මාර්ගය වේ. දෙවියන් කරා යන විමුක්ති මාර්ගයේ සාත්වික යාඥාව වනුයේ මමත්වය නමැති තිරිසන් සත්වයා බිලි කිරීමයි".

මෙලෙස ඉහත කාලයේ පරමාර්ථ මෙකල පාරමාර්ථ බවට පෙරළී ඇත. (පරමාර්ථ යනු උසස්ම අරමුණ වේ. පාරමාර්ථ යනු අඥානයාගේ අරමුණ වේ.) මෙසේ, එක් කලෙක අර්ථවත්ව තුබූ සෑම පැරණි ක්‍රියා මාර්ගයක්ම හඳුනාගැනීමට නොහැකි ලෙස අගිෂ්ඨ වී ඇත. අතුපතර නොයෙක් දිසාවන්ට විහිදී ඇත. දැන් ගස මුලින්ම උදුරා දමා අළුතින් ගසක් සිටුවීම කළ නොහැක. එමනිසා තිබෙන ගස ඍජුව වැඩෙන සේ අතු කපා ක්‍රමවත්ව වැවෙන්නට සැලැස්විය යුතුය. උසස්ම අරමුණ නිතර සිහියේ තබාගතයුතු අතර පහත්ම තත්ත්වය දක්වා එය බාල නොකළ යුතුය.



# දෙවෙනි පරිච්ඡේදය

ධර්මය මුළු ජීවමාන ලෝකයේම දෙවිය සමග කිට්ටුවෙන්ම සම්බන්ධ වී ඇති හෙයින් එය කිසිත් විශේෂ සමාජයකට හෝ ජාතියකට සීමා කළ නොහැක. එය කවරදාකවත් තිවා දැමිය නොහැකි ආලෝක ධාරාවකි. එහි ශෙපත් ක්‍රියාවලියට අවහිර පැමිණවිය නොහැක. ක්‍රිෂ්ණා විසින් අර්ජුනට ගීතාව උගන්වන ලදී. නමුත් ක්‍රිෂ්ණා එයින් අදහස් කලේ මුළු මනුෂ්‍ය වර්ගයාමය. අර්ජුන ඒ සඳහා නිදහසක් වශයෙන් යොදා ගත්තා පමණි. එම ගීතාව අද මුළු මනුෂ්‍ය වර්ගයාම යහමගෙහි යොමු කරවන්නේය. එය එක් විශේෂ කුලයක්, ආගමක් හෝ ජාතියක් පමණක් සඳහා නොවේ. එය සෑම තැන්හිම සිටින මනුෂ්‍යයින්ගේ ජීවන හුස්ම වේ.

විශ්වාස කළ අයවළුන් විසින් සමහරවිට මනු ධර්මය ලෙසද, අනුගමනය කළවුන් විසින් සමහරවිට වර්ණ ධර්මය ලෙසද, ජීවිතයේ යම් කිසි කාල සීමාවක භාවිතා කළ නිසා සමහරවිට ගෘහස්ථ ධර්මය ලෙසද, ධර්මය ධර්මය විසින්ම නොයෙක් ආකාරයෙන් පැහැදිලි කෙරේ. නමුත් මේවා මූලික න්‍යායයන් නොව ක්‍රියාවෙහි යෙදිය හැකි අප්‍රධාන කරුණු වේ. මවිසින් විස්තර කරනුයේ දිව්‍යමය ධර්මය වන ආත්ම ධර්මය වේ. ප්‍රායෝගික ධර්ම නොහොත් ආචාර ධර්ම නිසා භෞතික ලෝකය සමග සබඳකම් පැවැත්වීමේදී අවශ්‍ය තාවකාලික කරුණු සහ ප්‍රශ්න වලටද, ශාරීරික අවශ්‍යතාවයන්ටද අදාළ වේ. එම නියමයන්හි උපකරණය වන මනුෂ්‍ය ශරීරයවත් ස්ථිර නොවන හෙයින් මෙම ධර්මයන් සදාකාලික විය හැක්කේ කෙසේද? ඒවායේ ස්වභාවය සත්‍ය බව දැක්විය හැක්කේ කෙසේද? වහා නැසෙනසුළු දෙයින් සදාකාලික දෙය පැහැදිලි කළ නොහැක. අසත්‍යය තුල සත්‍යය අනාවරණය නොවේ. අන්ධකාරයෙන් ආලෝකය ලබාගත නොහැක. සදාකාලිකත්වය මතුවිය හැක්කේ සදාකාලිකත්වය තුලින් පමණි. සත්‍යය උපදිනුයේ සත්‍යයෙන්ම පමණි. එමනිසා, ලෞකික ක්‍රියාවන් හා එදිනෙදා ජීවිතයට සම්බන්ධ ධර්මයේ විෂය මූලක ධර්ම ශාස්ත්‍රයන් ඒවාටම වැදගත් වුවද, ඒවා අනුගමනය කළ යුත්තේ අභ්‍යන්තරික මූලික ආත්ම ධර්මය පිළිබඳ දැනීම සහ විඥානය ඇති කරගෙනය. අභ්‍යන්තරික හා බාහිර පෙළඹවීම් සහයෝගීව ක්‍රියා කොට සුමිහිරි අභිවෘධිය වූ ප්‍රමෝදය ලැබෙනුයේ එවිටය.

ඔබේ එදිනෙදා කටයුතු වලදී, සනාතන ධර්මයෙහි නියම වටිනා දේ ප්‍රේමයෙන් පිරුණු ක්‍රියාවන්ට පරිවර්තනය කළ විට, අභ්‍යන්තරික සත්‍යය වන ආත්ම ධර්මය කෙරෙහි ඔබේ යුතුකම ඉටු කළා වන්නේය. සෑම විටම ආත්ම පදනම මත ඔබේ ජීවිතය ගොඩනගන්න. එවිට ඔබේ දියුණුව නිසැකය.

අද උත්සාහය වී ඇත්තේ දෙවියන් ශෛලමය කිරීමටය. නියම කටයුත්ත ශෛලමය වස්තුව දෙවියන් ලෙස දැකිය යුතු වෙද්දී, එවැනි උත්සාහය සත්‍යය දෙසට යොමු වන්නේ කෙසේද? පළමුවෙන්ම දේවත්වය පිළිබඳව භාවනා කොට දේවත්වයේ ආකාරය විඥානයට කාවද්දා ගත යුතුය. එසේ එම ක්‍රියාවලියේදී ගල තුල දෙවියන් සිටින බව සිතා ගල දෙවියන් ලෙස දර්ශනය වන තෙක් ශෛලමය බව අමතක කළ යුතුය. ඒ ආකාරයෙන්ම, මූලික ධර්මය, ආත්මයේ මූලික සිද්ධාන්තය එකම භාවය ලෙස ඔබගේ විඥානයට කාවද්දා ගත යුතුය. ඉන් පසු භක්තිය හා දෘෂ්ටියෙන් පරිපූර්ණව විවිධ වස්තූන්ගෙන් හෙබි ලෝකය, එහි ආකර්ෂනයන් හා බලපෑම් පිළිබඳව ක්‍රියා කළ යුතුය. උත්කෘෂ්ට වශයෙන් සලකන දේ අවබෝධ කරගත හැක්කේ මේ ආකාරයෙන් පමණි. මෙසේ කලහොත් සත්‍යාවබෝධයෙහි බාලවීමක හෝ ආත්ම ධර්මයෙහි දීප්තිය නැතිවීමක හෝ බියක් ඇති නොවේ.

ගලක් දෙවියන්යයි සිතා වැඳුම් පිදුම් කලහොත් කුමක් වේද? අසීමිතවූ, සදාකල්හි පවත්නා සැම තැනකම ව්‍යාප්ත වස්තුව වූ පරමාත්මය සවිස්තරව, විශේෂ වශයෙන් එම ඝන වස්තුවෙහි මැවී පෙනේ. එමෙන්ම, පොදු, සාධාරණ හා ඝෝරවූ ධර්මය එක් තිරසාර ක්‍රියාවලියක් තුලින් දැකිය හැක, පරීක්ෂා කළ හැක. මෙය කළ නොහැකිය යන අදහසින් මුලාවට පත් නොවන්න. ඔබේ සිතෙහි අවුල් භාවය සහ බිය පමණක් වර්ධනය කරන, අත්කර ගැනීමට අසීරු බොහෝ දේ ඔබ විසින් අත්කරගෙන නොමැත්තේද? මිනිසා ඥානවන්ත නම්, ඔහුගේ සිතෙහි ශාන්තිය උදා කෙරෙන, වඩා වටිනා දේ ඒ වෙනුවට ඔහුට අත්කර ගත නොහැක්කේද?

නොබැඳි මිදුනු භාවයෙන් සිටීම ඔබ උපතින් ලත් අයිතිවාසිකමකි. ඔබ ඇත්ත වශයෙන්ම මිදුනා වන්නේ නොබැඳුනු පොදු ධර්මයෙන් ආලෝකවත්වූ මාර්ගයේ ගමන් කලහොත් පමණි. ඔබ ආලෝකයෙන් ඉවත් වුවහොත් බැඳීම් වලට ග්‍රහනය වී හසුවේ. සිතිවිලි හා වදන්වල සීමාවන් ඇති කරන, ක්‍රමවත් බව හා සංවරය ඇති කරන ධර්මයට මිනිසෙකු ස්වාධීන භාවයට පත් කළ හැක්කේ කෙසේද යනුවෙන් සමහරු සැකයක් මතු කරනු ඇත. "ස්වාධීනත්වය" යන නාමය ඔබ දී ඇත්තේ එක්තරා වහල් භාවයකටය. නියම ස්වාධීන භාවය ලබාගත හැක්කේ මුලාව නොමැති විටද, ශරීරය සහ ඉන්ද්‍රියයන් එක්කොට නොසලකු විටද, විෂය මූලක ලෝකයට දාසත්වයක් නොමැති විටද පමණි. මෙම දාසත්වයෙන් මිදී නියම අවබෝධයෙන්ම ස්වාධීනත්වයට පත්වුවෝ ගණිනින් ඉතා සුළුය. ශරීරය තමාය යන සිතිවිල්ල ඇතිව කරනු ලබන සියලුම ක්‍රියාවන්හි වහල් භාවය ඇත. එවිට මිනිසා ඉන්ද්‍රියයන්ගේ කෙළිබඩුවක් වන්නේය. මෙම ඉරණමින් මිදුනු අය පමණක් නිදහස්ය. ධර්මය යොමු වනුයේ එම "නිදහස" වන උත්කෘෂ්ට තත්ත්වයටය. එම තත්ත්වය නිතර සිතෙහි තබාගෙන දිවි පැවැත්මේ ක්‍රියාවන්හි යමෙකු යෙදේද ඔහුට නිදහස් භාවයට, මුක්තපුරුෂ භාවයට පත්විය හැකිය.



ඔබ විසින්ම බැඳීම් ඇතිකරගෙන තිබෙන හෙයින් බැඳුන තත්ත්වයට ඔබ පත්ව ඇති අතර ධාර්මික මාර්ගයෙන් ඉවත්ව ඇත. එය සැම විටම එසේ වේ. වෙනත් අයෙකු විසින් ඔබව බැඳ තැබීම කළ නොහැක. එසේ කරනුයේ ඔබ විසින්මය. දෙවියන් සර්ව ව්‍යාපී යන විශ්වාසය මුල් බැසගෙන තිබෙන විට ඔබද දෙවියන් බව වැටහෙන අතර ඔබ කිසි විටෙක බැඳ තැබිය නොහැක. එම විශ්වාසය වැඩීම සඳහා ඔබ විසින් ආත්මානන්දය දැඩිව ග්‍රහනය කළ යුතුය. ආත්මයේ මූලාධාරය සත්‍ය භාවයය. එම අවිවාදී ඥානය නිශ්චිත ඥානයය. එම අධිතාලම රහිතවූ කෙනෙකු සැකයේ, බලාපොරොත්තු රහිත බවේ සහ මුලාවේ ඉලක්කය වේ. එවැන්නෙකු හා සම්බන්ධ වීමට ධර්මය නමැති කරුණ කත නොකැමැත්තිය.

එම නිසා පළමුවෙන්ම නිදහස් භාවය ලබාගැනීමට වැයම් කරන්න. එනම් ප්‍රායෝගිකව ජීවත් වීමට මුල පිරිමක් ලෙස ඔබේ පෞද්ගලිකත්වයෙහි හරය වශයෙන් ආත්මයෙහි විශ්වාසය ඇති කරගෙන එම හරය තුලට සේන්දු වීමට අවශ්‍යවූ විනය ඉගෙන හුහුණු කරන්න. එම සුදුසුකම අත්කරගෙන, ලෞකික ක්‍රියාවන් හැසිරවීම සඳහා නියම කර ඇති ධර්මය අනුගමනය කරමින් එම ක්‍රියාවන්හි නිරත විය හැකිය. එවිට ඔබ යහපත් පුරුෂයෙකු "ධර්ම පුරුෂයෙකු" වන්නේය. භෞතික විෂය මූලක ලෝකය මුළු ජීවිතයම ලෙසත්, ශරීරය ආත්මය ලෙසත් සලකන අය දෙවියන් ගල බවට පත් කළාසේ නිෂ්ඵල ජීවිතයක් ගත කරති. ගල දෙවියන් බවට පත් කිරීම වඩා පූජනීය වූද, යහපත් වූද කාර්යය වේ. එමෙන්ම ඔබේ සැම කාර්යයකදීම ආත්ම ධර්මය දැකීමෙන්, එම කාර්යය පූජනීය බවට හරවා උසස් කොට එහි ඇති බැඳ තැබීමේ ලක්ෂණය ඉවත් කෙරේ. ලෞකික ජීවිතයේ යුතුකම් නියම සත්‍ය ධර්මයට සැලකිල්ලක් නොමැතිව ඉටු කලහොත්, එය දෙවියන් ගල සේ සැලකීම මෙන්ම අශුද්ධ වේ. සත්‍ය ධර්මයෙන් වෙන්ව පිළිපදින ලද ආචාරධර්මයෙහිද, ආචාර ධර්මයෙන් වෙන් කරන ලද සත්‍ය ධර්මයෙහිද යන කරුණු දෙකෙහිම ප්‍රතිඵල නිෂ්ඵල වේ. මේ දෙකම වෙන්කල නොහැකි ලෙස එකට බැඳී පවතින අතර ඒවා එපරිදිම සැලකිය යුතුය. ජ්‍යෙෂ්ඨ නිලධාරියාට කණිෂ්ඨ නිලධාරියාගේ සේවය අවශ්‍ය වන්නා සේම කණිෂ්ඨ නිලධාරියාට ජ්‍යෙෂ්ඨ නිලධාරියාගේ උපකාරය අවශ්‍යය. එසේනම් බැඳුනු අය හා නිදහස් අය කවුරුන්ද? දෙදෙනාම සතුට හා සැපත ලබාගැනීමේ ආශාවෙහි බැඳුනු අය වෙති. ආත්මයේ මූලික රහස හඳුනාගන්නා තෙක් බැඳුනු ස්වභාවයේ බාහිර ගතිය නොනැසී පවතී. එම රහස හඳුනාගත් විට ඉන්ද්‍රියයන් සහ බාහිර ලෝකය කෙරෙහි වන වහල් බවේ බර අඩුවේ. එවිට බාහිර ලෝකය තුල හැසිරීමේ ධර්මතාව සමග අභ්‍යන්තරික දේවත්වය සමග වන අතර සියලුම පෙළඹවීම් එකමුතුව සහයෝගයෙන් ක්‍රියා කෙරේ.

වේදාන්ත, ආධ්‍යාත්මික ශාස්ත්‍ර, ධර්මය යන මේ සියල්ල මිනිසා දාසයෙකු ලෙස නොව දෙවියන් ලෙස ජීවත්වීමට උනන්දු කරවන්නෝය. එවිට සියලුම ක්‍රියා කාම්‍යකර්ම (ලාභය අපේක්ෂාවෙන් කරනු ලබන ක්‍රියා) නොව ධර්ම

කර්ම වෙති. යම් ක්‍රියාවක මෝස්තරය වෙනස් කළ පමණින්ම බැඳීම්වල බාධාවන් මගහැරිය නොහැක. ඒවා මගහැරිය හැක්කේ දේහයෙන් දේවත්වයටද, මවන ලද දෙයින් මැවුම්කරු වෙතද දෘෂ්ටිය වෙනස් කිරීමෙනි. ඉන්නිසා යහපත් ගතිගුණයන්ද ශක්තිමත් වේ. කිසියම් රැකියාවක යෙදී සිටීම දාස භාවය බවද, කිසියම් නියමිත කටයුත්තක නොයෙදී නිවහනේ සිටීම නිදහස බවද සමහරු දරණ මතයකි. මෙය බුද්ධි ඌනතාවයේ ලක්ෂණයකි. රැකියාවක නිරත වූ විට කෙනෙකු උසස් නිලධාරියාට කීකරු විය යුතුය. නිවසේ රැ දී සිටීමේදී වුවත්. කෙනෙකුට නෑදැයන්ගේ ඉල්ලීම් හා බලකිරීම් වලින් ගැලවී සිටිය හැකිද? යමෙකු යහළුවන් සමඟ පමණක් සිටියදී ඔවුන්ගේ මනාපයන් අනුව ක්‍රියා කිරීම ඔහු විසින් පැහැර හැරිය හැක්කේද? යමෙකුට යටත්පිරිසෙයින් තමාගේ ශරීරය රැකබලා ගැනීමේ අවශ්‍යතාවයෙන් හා තමාගේ සැපපහසුකම් සපයා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වී සිටිය හැක්කේද? එසේ නම් බැඳීම් නමැති සිරකුටුවේ සිටියදී මිනිසා විසින් නිදහස අත්විඳිය හැක්කේ කෙසේද? එක් ආකාරයක දඩුවමක් හා තවෙකක් අතර වෙනස කුමක් වුවත් මුළු ජීවිතයම සිර මැදිරියකි. ආත්මය ශරීරය සමඟ සම්බන්ධ ලෙස සැලකීමේ චෛතසික ස්වභාවය තිබෙන තාක් කල් එය එසේ වන්නේය.

"ශරීරය පදනම් කරගෙන මමත්වය ඇතිවූ විට, එයින් අදහස් වනුයේ නරකය නොහොත් නිරය වේ." යනුවෙන් ශංකර එක් අවස්ථාවකදී පවසා ඇත්තේ ඒ නිසාය. මේ ආකාරයේ මමත්වය දේවත්වයට පටහැනි තවත් ආකාරයක චෛතසික ස්වභාවයකි. පොළොව මතින් සියළුම කටු හා බොරළු ඉවත් කළ හැක්කේ කාහටද? ඒවා මග හැරීමට ඇති එකම මග නම් පාවහන් පැළඳ ගමන් කිරීමයි. වේදාන්ත දර්ශනය නොහොත් වේදාන්ත දර්ශන වාදය සම්බන්ධයෙන්ද එසේමය. සත්‍යයට නොහොත් සත්‍යතාවයට දෘෂ්ටිය යොමුකොට ඔබේ ආවශ්‍යක ස්වභාවය වන බ්‍රහ්මන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය ඇති කරගෙන ඔබේ සතුටට ගැලපෙන ආකාරයට බාහිර ලෝකය හැඩගැස්විය යුතුය යන ආකල්පය මගහැර, සත්‍ය ධර්මයට එළඹිය හැකිය. මමත්වය මැඩ ස්ථිර විශ්වාසයෙන් යුතුව මෙසේ ප්‍රකාශ කරන්නා මිදීමට පත්වූවෙකි. "සියලු ආකාරයේ වහල් භාවයේ ගබඩාව වූ මෙම ශරීරයේ වහලා මම නොවෙමි, ශරීරය මගේ වහලාය. සෑම දෙයකම ස්වාමියා හා විධානය කරන්නා මම වෙමි, ස්වාධීනත්වයේ මූර්තිය මමය." සියලුම යුතුකම් පිළිබඳ නියමිත සිද්ධාන්තයන් මෙම මමත්වය විනාශ කිරීමේ ක්‍රියාවලියට ආධාර විය යුතුය. එම සිද්ධාන්තයන් මමත්වය පෝෂනය කිරීමට හා මමත්වයෙන් අපිරිසිදු වීමට සැලැස්විය යුතු නැත. ස්වාධීනත්වයට මාර්ගය එයයි. යම් පුද්ගලයෙකු තම පුත්‍රයා සමඟ ජීවත්වීම දුඃඛිත බව සිතා දියණියගේ නිවසට ගොස් ජීවත් වන්නේ නම් එය ස්වාධීනත්වය දිනා ගැනීමක් නොවන්නේය. එය එක් ආකාරයක



මමත්වය පෝෂණය කිරීමක් පමණි. මෙසේ ඉන්ද්‍රියයන් පිනවීමේ සතුට සෙවීම ධර්ම තත්ත්වයට උසස් කළ නොහැක්කේය.

එසේ වුවත් නිවසක් අවශ්‍ය වන්නේ ඇයි? දෙවියන් පිළිබඳව මෙනෙහි කිරීමෙන් උපදින දිව්‍ය සැපත භුක්ති විඳීමටත්, බාධාවකින් තොරව දෙවියන් පිළිබඳව භාවනා කිරීමට අවස්ථාවක් ලබාගැනීමටත්ය. අනෙකුත් දේ කෙසේ වෙතත් මේවා නොසලකා හැරිය නොහැකිය. යමෙකුගේ නිවැරදි ධර්මය වියයුත්තේ පරමාත්මය සමඟ සම්බන්ධවීමේ දිව්‍ය සැපත තුලින් නියම විමුක්තියට පත් වීමය. එම තත්ත්වයට පත් පුද්ගලයෙකු භයානක සිරගෙයක දමන ලද වුවද බන්ධනයට පත් කළ නොහැක. අනෙක් අතට ශරීරයේ වහලෙකු වූ පුද්ගලයෙකුට තණපතක් වුවත් මරණයේ ආයුධයක් විය හැකිය. නියම ධර්මය වනුයේ ආත්ම ප්‍රමෝදයෙහි පිහිටීමද අභ්‍යන්තරික දෘෂ්ටියෙහි නිමග්න වීමද, යමෙකුගේ සහජ ස්වභාවය පරමාත්මයෙන් වෙනස් නොවන බවට ස්ථිර විශ්වාසය තබා ගැනීමද, සියල්ලම බ්‍රහ්මන් බව ප්‍රත්‍යක්ෂ කර ගැනීමද වේ. මේ සතර සත්‍ය ධර්ම වේ. මෙම භෞතික ජීවිතයේදී විශේෂ පුද්ගලයන් වශයෙන් ක්‍රියා කිරීමේ පහසුව සඳහා (ආත්ම සත්‍යයේ අභ්‍යන්තර ධර්මය සමඟ මිශ්‍රවූ) සත්‍ය, ශාන්තම්, ප්‍රේම සහ අහිංසා හතර එසේ නම් කර ඇත්තේ, පරමාත්මයේ දෘෂ්ටාන්ත වශයෙන් පෙනී සිටින එම විශේෂ පුද්ගලයන්ට ඒවා එදිනෙදා ජීවිතයේදී අනුගමනය කළ හැකිවන ලෙසටය. ඉහත කාලයේ මෙන් මෙකලද ධර්මය අනුගමනය කිරීමේ සම්ප්‍රදාය විය යුත්තේ, හැම ක්‍රියාවකදී හා සිතිවිල්ලකදීම මෙම උසස් මූලධර්මයන්ට අනුකූල වීමය. මෙකල සත්‍ය, ශාන්තම්, අහිංසා සහ ප්‍රේම වනුයේ, දෘෂ්ටිය අභ්‍යන්තර සත්‍යයට යොමුකොට ආත්මයේ නොනැවතී නිමග්න වීමත් තමාගේ අව්‍යාජ ස්වභාවය පිළිබඳව මෙනෙහි කිරීම හා සියලු දෙයම එකම දෙය වූ බ්‍රහ්මන් බව දැන සිටීම පමණි. මූලධර්මය හා ප්‍රභවය වන මේවා එකලස් කොට එකමුතු කළ යුතුය. එය ආත්ම ධර්මය වශයෙන් නම් කළ හැක්කේ එවිට පමණි.

ඔබේ ක්‍රියාව හෝ ඔබ තෝරාගෙන ඇති නාමය හා රූපය කුමක් වුවද කාරියක් නැත. යකඩ හෝ රන් යන කුමන ද්‍රව්‍යයකින් සැදුවද දම්වැල දම්වැලම වේ. එසේ නොවේද? එසේම කාර්යය කුමන ආකාරයක වුවත් ආත්ම ධර්මය අධිතාලමද, ආත්ම තත්ත්වය මූලයද වන තාක් කල් එය සැකයෙන් තොරවම ධර්මය වන්නේය. එවැනි කටයුතු නිසා පුද්ගලයෙකු ශාන්තියෙහි ඵලයෙන් සුඛිත කෙරේ. ආත්මාර්ථකාමී භය හෝ තණ්හාව නමැති රළ විසින් පුද්ගලයකු නිවසේම අප්‍රසිද්ධ විවේකයට හෝ වනයේ හුදෙකලාවට හෝ වෙනත් රහස්‍යස්ථානයකට හෝ ගසාගෙන යද්දී දුකින් මිදීමට කිසිසේත් නොහැක්කේය. දරණ ගසා සිටියද නාගයා නාගයකු වීම නොනවතී. එවිටද ඌ නාගයෙක්මය. ආත්මයේ සත්‍ය භාවය නමැති මූලික මූල ධර්මයෙන් එදිනෙදා ක්‍රියාවන් පෙළඹවූ විට සෑම ක්‍රියාවක්ම ධර්මයේ මුද්‍රාවෙන් මුද්‍රා තැබෙන්නේය. නමුත් පහසුව සහ ආත්මාර්ථයෙන් ක්‍රියාවන් පොළඹවනු ලැබූ විට ධර්මය මිථ්‍යා ධර්ම වේ. කොපමණ

සිත්ගන්නා සුළු වුවත් එය වෙනත් ආකාරයක බන්ධනයකි. සිරකරුවන් භාරව සිටින්නන් විසින් සිර මැදිරියක සිටින සිරකරුවන් සමූහයක් පෙළගස්වා අධිකරණයට හෝ ආහාර ගන්නා ශාලාවට හෝ තල්ලු කරන්නා සේ ඉන්ද්‍රියයන්ගේ පෙළඹවීම් විසින්, බන්ධනයට පත් තැනැත්තා දුඃඛිත ස්ථානයට හෝ සහන ස්ථානයට හෝ තල්ලු කරනු ලබන්නේය.

"ඒ යහළුවෙකි" නොහොත් "මේ සතුරෙකි" යන හැඟීම පවා වැරුද්දකි. මෙම මුලාව අත්හැරිය යුතුය. ප්‍රේමයේ මූර්තිය වන දෙවියෝ එකම නිත්‍ය හිතෛෂියා සහ ඥාතියාය, සහායකයාය, මගපෙනවන්නා සහ ආරක්ෂකයාය. මෙය දැනගෙන එම දැනීම තුළ ජීවත් වන්න. අවබෝධය නමැති මූලාධාරය මත ගොඩනගන ලද ධර්මය මෙයයි. ධර්මය නැමැති මූලාධාරය මත තනන ලද ජීවිතය එයයි. මෙම මූලික පදනම ගැන නොසලකා බාහිර ඔපය ගැන සිත යොමු කළහොත් පත්වියයුතු ස්ථානයට පත්වීම අසීරු වන්නේය. ලෝකයට ඇති බැඳීම විනාශ කළ හැක්කේ දෙවියන්ට සම්බන්ධය දැක්වීමෙන් පමණි. ඔබ මෙතාක් කල් සැම විටම කර ඇත්තේ ඔබේ බැල්ම අහස දෙසට යොමු කිරීම හෙයින්, භූමිය නොපෙනෙන්නේ යැයි චෝදනා නගන්නේ ඇයි? භූමිය දෙස නෙත් යොමු කොට අහසේ ප්‍රතිබිම්බය පෙනෙන ජල තලය දෙස බලන්න. එවිට ඔබට ඉහළ අහසත් පහළ භූමියත් එකවරම දැකගත හැක. එමෙන්ම ඔබ (අභ්‍යන්තර ආත්ම මූලධර්මය පුහුණු කිරීම වන) සත්‍ය ධර්මයෙහි ඇලී සිටීමට නම්, සියලුම ක්‍රියාවන්හි ආත්මයේ මහිමය පිළිබිඹු වන ආකාරය දැකිය යුතුය. එවිට දෙවියන් කෙරෙහි ඇති ඇල්ම විසින් ලෝකයට ඇති ආශාව පිරිසිදු පිදුමක් බවට පරිවර්තනය කෙරේ. අභිමතාර්ථය වෙනස් කිරීම හෝ පහත් කිරීම හෝ නොකළ යුතුය. එනම් වැදගත් කරුණු පීඩා නොවී තබාගත යුතුය. ඉල්ලීම නිසා ප්‍රතිඵල ඇති කරන නොයෙකුත් නම් හා රූපකායයන් මත ධර්මය රඳා නොපවතී ඒවා එතරම් මූලික නොවේ. එය වැඩි වශයෙන් රඳා පවතිනුයේ එය හසුරුවන ලද හා යොමු කරන ලද පෙළඹීමේ හේතුව සහ හැසිරීම මතය.



## තුන්වෙනි පරිච්ඡේදය

මූලික අවිද්‍යාව නොනැසී පවතින තාක් කල් යමෙකුට සිතෙහි අවුල්සහගත බවින් ගැලවීමට නොහැක. වැඩි පහසුකම් සඳහා වන ආශාව විසින් පොළඹවන ලද නිසා හෝ පැන නැගෙන අස්ථිර ආශාවන් සන්තර්පණය කිරීමේ අවශ්‍යතාවයන් නිසා හෝ රැකියාව වෙනස් කිරීම පමණකින් නිත්‍ය තෘප්තියක් නොසලසයි. එය අඳුරු කාමරයක ඇති ගෘහභාණ්ඩ නැවත සකස් කිරීමකින් පමණක් කාමරයේ පිළිවෙළ දියුණු කිරීමට බලාපොරොත්තු වීම වැනිය. එසේ වෙතත්, එහි පහනක් දැල්වුවහොත් එම නැවත පිළියෙල කිරීම නොමැතිව කාමරය තුළින් ගමන් කිරීම පහසුය. ගෘහභාණ්ඩ වලට අතගැසීම පවා සේන්ම අවශ්‍ය නොවේ.

එමෙන්ම, මෙම අන්ධකාරයෙන් පිරුණු ලෝකයෙහි, කුමන හෝ බාධාවක නොගැටී සත්‍යවාදීව, නිවැරදිව හා සමාදානයෙන් යුතුව එහා මෙහා යාම අසීරුය. එසේනම් ඔබේ බලාපොරොත්තු ඉටුකරගත හැක්කේ කෙසේද? පහන දල්වන්න! යථාර්ථය අනාවරණයට එයට ඉඩදෙන්න. ඥානාලෝකය ලබාගන්න. එයින් සියළුම බාධාවන් දුරුවනු ඇත. ධර්මයට අනුව ජීවත්වන බව ඔබ කියා සිටිනු ඇත. නමුත් ඔබේ මූලික වැරුද්ද නම් ඔබේ ක්‍රියාවන් කැපවීමෙන් නොකිරීමයි. එසේ කරන ලද නම් එය ධර්මයේ අව්‍යාජ සලකුණෙන් මුද්‍රා තැබෙනු ඇත. යම් චතුර පුද්ගලයෙකු සැකයක් මතු කොට මෙසේ ඇසීමට ඉඩ ඇත. "ක්‍රියාව දෙවියන්ගේ නාමයට කැප කොට දිවි හානි කිරීමට හා සොරා කිරීමට අපට හැකිද?" සිහිවිල්ලෙන්, වචනයෙන් හා ක්‍රියාවෙන් පිරිසිදු නොවී පුද්ගලයෙකු ඔහුගේ සියලුම ක්‍රියාවන් දෙවියන්ට කැප කළ යුතුය යන හැඟීම ඇතිකරගන්නේ කෙසේද? ප්‍රේමය, උපේක්ෂාව, ඍජු භාවය, අහිංසාව යන මේවා දෙවියන්ට සේවය කරන්නා තුළ තිබෙන ගුණයන් වේ. කුරකම හා දයාවක් නොමැති බව එම ගුණයන් සමඟ එක්ව පවතින්නේ කෙසේද? කැපවීමේ ලක්ෂණය සඳහා අවශ්‍ය පරාර්ථකාමී බව, ආත්ම පරිත්‍යාගශීලී ස්වභාවය සහ ආධ්‍යාත්මික විශිෂ්ඨත්වය ලබාගැනීමට නම් පුද්ගලයෙකු විසින් සත්‍ය, ශාන්තම්, ප්‍රේම, අහිංසා යන සිව් ලක්ෂණයන් ඇති කරගත යුතුය. මේවායින් තොරව කිසිම ක්‍රියාවක් නමින් පමණක් සඳහන් කිරීම පිළිගත යුතු දෙයක් නොවේ.

ධාර්මිකත්වය පැහැදිලි වන ක්‍රියාවන් අමරණීය වන අතර ඒවා අමරණීය බව දන්නා අයට පමණක් එම ක්‍රියාවන් සිදු කළ හැක. මිනිසාගේ ශ්‍රේෂ්ඨතම ආචරණය එයයි. එම තත්ත්වයට පත්වනු වෙනුවට ඔහු උත්සාහවත් වනුයේ ධර්මයට පටහැනි ක්‍රියාවන් කිරීමටය. සදාකාලික පුත්‍රයෙකුගේ තත්ත්වයේ සිට නිෂ්ඵලත්ව පුත්‍රයෙකුගේ තත්ත්වයට, අමෘත පුත්‍ර තත්ත්වයේ සිට අන්ධ පුත්‍ර තත්ත්වයට, සැම තත්හිදීම මිනිසා පහත වැටේ. ඔහු අමෘතය අතින් දරා සිටිමින් ඉන්ද්‍රියයන් පිනවීම නමැති විෂ පානය කරන්නේය. විශ්වයේ මූලික

ආත්ම සත්‍යය ගැන මෙනෙහි කිරීමේ ප්‍රිතිය නොතකන ඔහු මෙම භෞතික ලෝකයේ බාහිර ආයිත්තම්වල හෝ ලක්ෂණයන්හි පටලැවී සිටී. මෙම ඉරණමින් මිනිසා විනාශවී ඇති බව පිළිබඳව කෙනෙකුට කළ හැක්කේ කණගාටු වීම පමණි.

ගීතාවෙහිද මෙසේ ප්‍රකාශ කර ඇත. "ඒකාන්ත අමරණීයත්වයේ, සදාකාලික ධම්යේ සහ නිත්‍ය ප්‍රමෝදයේ දිව්‍ය සැපත වන බ්‍රහ්මන් මම වෙමි". එම ශ්ලෝකය XIV වැනි පරිච්ඡේදයෙහි වේ:

බ්‍රහ්මනොහි ප්‍රතිෂ්ඨා - අහං අමෘතස්‍ය අව්‍යයස්‍ය ච

සාසවතස්‍ය ච ධම්ස්‍ය සුඛස්‍ය - අයිකාන්තිකස්‍ය ච

උපනිෂද්වල විස්තර කර ඇති අමෘත ධම්ය එය වන අතර ගීතාව උපනිෂද්වල සාරය වන හෙයින් ගීතාවෙහිද එයම අවධාරණය කෙරේ. ධාර්මික ජීවිත ක්‍රියා මාගීය හුස්ම වේ. ස්වයං අවබෝධයට මාගීය එයයි. එම මාගීයේ ගමන් කරන්නෝ දෙවියන්ට ප්‍රියයහ. සත්‍යවාදී සැම දෙනා සමගත්, ධාර්මික ක්‍රියා ඇති අය සමගත් දෙවියෝ වාසය කරන්නෝය. ආත්ම ධම්ය පුරුදු කිරීමට උපකාරී වන නියම ගතිගුණයන් ගීතාව අර්ජුනට උගන්වනුයේ ඒ නිසාය. මේවා XII වැනි පරිච්ඡේදයේ 13 සිට 19 දක්වා වූ ශ්ලෝකවල විස්තර කර දක්වා ඇත. ගීතාව නමැති දිය උල්පතින් අධිකව පානය කළ අයට මේවා මතකයට නැගෙනු ඇත. මේ සම්බන්ධ ශ්ලෝකයන්ගෙන් වැදගත්ම ශ්ලෝකය වනුයේ,

සෙ තු ධම්‍යාමෘතම් ඉදම් යථොක්තම් පර්‍යුපාසතෙ

ශ්‍රද්ධානා මත් පරමා භක්තාසෙත අතීව මත් ප්‍රියාඃ

මෙම ශ්ලෝකයෙන් ප්‍රකාශ කරනුයේ කොතරම් උදාර අදහසක්ද? පුද්ගලයෙකු විසින් දියුණු කරගතයුතු ගුණාංගයන් දක්වන ශ්ලෝක පෙළෙහි අවසාන ශ්ලෝකය එයයි. මුළු ශ්ලෝක සමූහයම එහි හඳුන්වනුයේ ධම්‍යාමෘතම්, අමරණීයත්වයට යාහැකි ධාර්මික මග, ලෙසිනි. මෙම ගුණාංගයන් ඇති අය, එකම අවසාන අභිමතාර්ථය දෙවියන් බව විශ්වාස කරන අය, එක හිතින්ම දෙවියන්ට සම්බන්ධවී ඇති අය, දෙවියන්ට හිතවත්ම හා කිට්ටුම අය බව දෙවියන් විසින් ප්‍රකාශ කොට ඇත.

මෙහි යොදා ඇති ධම්‍යාමෘතම් යන වචනය බලන්න. ඒ පිළිබඳව ඕනෑකමින් සිතා බලා එයින් සිත ප්‍රබෝධමත් කරගන්න. දෙවියන්ගේ අනුග්‍රහය නමැති අමෘතය ලැබීමට සුදුසු වන්නේ දෙවියන්ගේ ධම්යට අනුකූල වන අය පමණි. දෙවියන් කෙරෙහි භක්තිය ඇති බව සාමාන්‍ය මිනිසා විශ්වාස කරයි. නමුත් දෙවියෝ ඔවුන් කෙරෙහි ප්‍රේමය දක්වන්නේද යන්න ඔවුහු නොවිමසති. මෙය සොයා ගැනීමට බලවත් සේ ආසා කරන්නෝ විරලයහ. ආධ්‍යාත්මික



ජයග්‍රහනයේ නිවැරදි මිම්ම එයයි. එකම පුද්ගලයා යටත් වැසියන්ට නම් රජුය, දෙමව්පියන්ට නම් පුත්‍රයාය, සහුරන්ට නම් සතුරාය, භාර්යාවට නම් ස්වාමිපුරුෂයාය, පුත්‍රයාට නම් පියාය. ඔහු නොයෙක් භූමිකාවන් රඟ දක්වයි. එහෙත් ඔහු කවරෙක්ද යන්න ඔබ ඔහුගෙන් විමසූ විට ඔහුගේ විශේෂ ලක්ෂණ වශයෙන් මේවායින් එකම සම්බන්ධකමක් හෝ සඳහන් කළහොත් ඔහු වැරදිය. ඒ ඒවා ශාරීරික සම්බන්ධයන්ට හෝ ක්‍රියාවන්ට අදාළව පවතින ලක්ෂණ හෙයිනි. ඒ සියල්ලම ශාරීරික නැකමට හෝ වෘත්තියට සම්බන්ධය ගතවන වචන වේ. තාවකාලික තත්ත්වයන්ට සම්බන්ධ නම්ය. නැතහොත් ඔහු හිස, පාද, අත් ආදී වන බව කිව නොහැක්කේ ඒවා ශරීරයේ අවයවයන් වන හෙයිනි. ඔහු සියලුම අවයවයන්ට වඩා සත්‍ය වේ. මූලික බ්‍රහ්මන් සහවා ගන්න අසත්‍යතාවයන් වන රූපයන් හා නාමයන් ඉක්මවා සිටී. ඔහු හඳුන්වනුයේ "මම" යනුවෙනි. එම භාවය පිළිබඳව මෙනෙහිකර බලා එම "මම" ඇත්ත වශයෙන්ම කවුදැයි අනාවරණය කරගන්න.

ඔබගේ භාවය විග්‍රහ කිරීම සහ තේරුම් ගැනීම මතරම් අසීරු වන විට, වෙනත් භාවයන් ගැන නිශ්චිත වශයෙන් මතයන් ප්‍රකාශ කරන්නේ කෙසේද? ඔබ "මම" සහ "ඔබ" යනුවෙන් සඳහන් කරනුයේ ශරීරයටය, පෙනුමටය. ඒවා සත් (පවත්නේ) නොවේ. ආත්මය ඒකත්වයය, එය බෙදිය නොහැක. ඒ මත සදහම්වූ ධම්ය නිර්මල ධම්ය වේ.

"ඔබ 'ආත්ම' 'ආත්ම' යනුවෙන් කියන්නේය. මෙම ආත්මයේ රූපය නොහොත් ආකාරය කවරේද?" යනුවෙන් සමහරු අසති. නමුත් ආත්මයට රූපයක් ගතහැක්කේ කොහින්ද? එය සදාකාලිකය, වෙනස් නොවන්නේය, අමරණීයය. එය යහපත් භාවයය, යුක්තියය, පරෝපකාරයය. එය නිත්‍යය, නොකැලැල්ය. එය යම්කිසි නාමයකට හෝ රූපයකට සීමා කළ නොහැක. එය තේරුම්ගත හැක්කේ කම්දේහ - එනම්, ක්‍රියාවල ප්‍රතිඵලය නිසා ලබාගත්-ශරීරය තුළ උදාවන ඥානය විසිනි. ශරීරයටද නාමයක් හා රූපයක් ඇත. එම නිසා ශරීරයෙන් කෙරෙන සැම ක්‍රියාවකම ආත්ම ධම්ය, ආත්ම විඥානය තුළ සදහම්වූ ආත්ම ධම්ය, විද්‍යමාන විය යුතුය.

ආත්මය, පුරුෂ හෝ ස්ත්‍රී හෝ නොවේ. එය ගව හෝ බැටළු හෝ අශ්ව හෝ අලි හෝ පක්ෂි හෝ වෘක්ෂ හෝ නොවේ. එය එවැනි වගී කිරීම් ඉක්මවා සිටී යනුවෙන් කියැවේ. මෙම වෙනස්කම් හා ප්‍රභේදයන් පැන නගිනුයේ ක්‍රියාවන් සදහම් කරගෙනය. ආත්මය වෙනස්කිරීම් වලට භාජනය කළ නොහැක. ඒ පිළිබඳව එක් කරුණක් සත්‍ය ලෙස පිළිගත හැක. එනම් එය එයම බවය. මේ සියල්ලෙහිම සාරාංශය නම් ආත්මය පරමාත්මයය, පරමාර්ථයය. අනෙකුත් ඒවා විශේෂයය, නොවැදගත්ය, අසත්‍යය, ව්‍යාජය, ඇගවිය හැකිය, හඳුනාගත හැකිය.

පල්ලැක්කියක් අරගන්න. එවැන්නකට පරිවර්තනය කිරීමට පෙර එය දැව සහ ලෑලි බවට පත්ව පල්ලැක්කියක් වූ ගසකි. රූපාකාරයේ සෑම වෙනසක් සමඟම නාමයද වෙනස් වූයේය. පල්ලැක්කියක වාඩිවූ කෙනෙකු තමා ලී කැබැල්ලක හෝ ගසක වාඩිවී සිටින්නේයයි නොකියයි. වස්තූන් වෙනස්වීම් වලට භාජනය වේ. ඒවා සදාකාලික නොවේ. ඒවා "සත්" එනම් සත්‍ය නොවේ.

වස්තූන් වෙන් කොට හඳුනාගත හැක්කේ ඒවායේ නාමය හා රූපය මගින් පමණි. ඒවා විස්තර කළ හැක්කේ ඒවායේ විශේෂ ලක්‍ෂණ වලින් පමණි. ඒ ඒවා නිර්මාපිත හා තාවකාලික වන හෙයිනි.

ඇත්ත වශයෙන්ම පුටුවක් වනුයේ කුමක්ද? එය දැවයෙහි විශේෂිත වෙනස් කිරීමකි. එසේ නොවේද? දැව අස් කරන්න, පුටුවද අතුරුදන් වේ. පුටුවෙහි ද්‍රව්‍යය වූ දැව ගැන සිතන්න. එවිට පුටුවේ "පෙනුම" අතුරුදන් වේ. ධර්මයද එසේමය. වර්ණ ධර්ම, ගෘහස්ථ ධර්ම, වන ප්‍රස්ථ ධර්ම, සන්‍යාස ධර්ම, බ්‍රහ්මචර්‍ය්‍යා ධර්ම යන මේ සියලු ඒ මේ ධර්මයන් පුටුව, බංකුව, පල්ලැක්කිය සේ මූලික ධර්මයේ වෙනස් වූ ආකාරයන්ය. විවිධ වර්ගයන්ගේ ස්වභාවය පිළිබඳව ගැඹුරට යන විට ඒවා වර්ගයන් සේ නොපෙනේ. කායික ධර්මයන් නොපෙනී ගොස් ආත්ම ධර්මය පමණක් ඉතිරිවේ. එමෙන්ම විෂය මූලක ධර්මයන් නොපෙනී ආත්ම ධර්මය පමණක් අසහාය මහිමයෙන් බැබළේ.

ලෞකික වෘත්තීන් සඳහා කායික ධර්ම ඇත්ත වශයෙන්ම වැදගත් වේ. එසේ නොවේයැයි මම නොකියමි. දැව ගෘහභාණ්ඩ වශයෙන් සකස් කොට ප්‍රයෝජනයට ගන්නා සේ, ආත්ම ධර්ම නොහොත් ශාන්ත ධර්ම නොහොත් සත්‍ය ධර්ම යන්න ගෘහස්ථ ධර්ම, වනප්‍රස්ථ ධර්ම, වර්ණ ධර්ම, ස්ත්‍රී ධර්ම, පුරුෂ ධර්ම ආදිය ලෙස හැඩගැස්විය යුතුවේ. සියල්ලේම ඇත්තේ එකම දෙයකි. සෑම වෙන් වෙන් රූපයකම ද්‍රව්‍යය වෙනස් නොවේ. ද්‍රව්‍යය ඉවර කළහැක්කේ කෙසේද? එය වෙනත් රූපාකාරයකට හැරවීම සහ එහි පෙනුම වෙනස් කිරීම කළ හැකි අතර, වෙනස් අරමුණු සඳහා ප්‍රයෝජනයට ගන්නා විට නොයෙකුත් වෙනස් ආකාරයන් වෙන් වෙන්ව නම් කෙරේ. ලීයක් කපා ඉරා එකට සම්බන්ධ කරන්නාසේ, වෙනස් අරමුණු සඳහා, ආත්ම ධර්මය ටිකෙන් ටික නිරීක්‍ෂණය කොට, නොයෙක් ඛණ්ඩයන්ට වෙන් කළ හැක. එහෙත් එය ආත්ම ධර්මයම වේ. එම "ලීයෙන්" නොයෙක් ආකාරයේ ධර්මයන් උපදවාගන්නා තෙක් එහි වරදක් නැත. කෙසේ වෙතත් ගෘහ භාණ්ඩ කිසි සේත් මුල් ගස බවට පත් කිරීම සඳහා නැවත සකස් කළ නොහැකි බැව් මතක තබාගන්න. ලෞකික ක්‍රියාවන්හිදී එම ආත්ම ධර්මය අදාළ කරගන්න. නමුත් ලෞකික ධර්මයන් ආත්ම ධර්මය ලෙස නොහඳුන්වන්න. එසේ කළහොත් සිදුවන්නේ උත්තරීතර දෙය වන පරමාත්මයට ද්‍රෝහී වීමකි.

ධර්මය නම් සදාචාර මාර්ගයය, සදාචාර මාර්ගය ආලෝකය වන්නේය. ආලෝකය ආනන්දය වේ. පවිත්‍රතාවයෙන්, සාමයෙන්, සත්‍යයෙන් සහ ස්ථිර



ගීතාවයෙන් ධර්මය විදහා දැක්වේ. ධර්මය යනු යෝග වීම, සම්බන්ධතාව, එක් වීම වේ. එය සත්‍යය වේ. එහි ගුණයන් වනුයේ යුක්තිය, ඉන්ද්‍රියයන් පාලනය, ධාර්මිෂ්ඨ හැඟීම, ප්‍රේමය, උදාරත්වය, යහපත්කම, භාවනානුයෝගී බව, අනුකම්පාසහගත බව, අහිංසාව වේ. කාලාන්තරයක් තිස්සේ නොනැසී පැවතුනු ධර්මය එසේය. එය පුද්ගලයෙකු විශ්ව ප්‍රේමයට හා සමගියට යොමු කෙරේ. එය ශ්‍රේෂ්ඨ විනය වන අතර අතිශය ප්‍රයෝජනවත් වන්නේය. මේ "එළිදරව්ව" ධර්මය සමඟ ආරම්භ විය. මේ සියල්ල සත්‍යය විසින් තහවුරු කර ඇත. සත්‍යය ධර්මයෙන් වෙන් නොවේ. සූර්යයාට හා චන්ද්‍රයාට ඔවුන්ගේ කක්‍ෂයන්හි පරිභ්‍රමණය වීමට සළස්වන විශ්වයේ බලවේගය සත්‍යය වේ. ධර්මය ඥානය ඇති කරන වේද සහ මන්ත්‍ර වේ. ධර්මය වය්‍යාවය, මාර්ගයය, නීතියය, සදාචාරයට ඇල්ම ඇති තැන සත්‍ය ධර්මය ක්‍රියාවේ යෙදෙනු කෙනෙකුට දැකිය හැක. භගවත් ගීතාවෙහිද මෙසේ කියා ඇත. "ධර්මය තිබෙන තැන ක්‍රිෂ්ණා ඇත, ධර්මය සහ ක්‍රිෂ්ණා යන දෙකම එක්ව සිටින විට විජයග්‍රහණය තිබේ" දෙවියන් මූර්තිමත් කෙරෙනුයේ ධර්මයෙනි. ලෝකය දෙවියන්ගේ ශරීරය වන හෙයින් ලෝකය යනු සදාචාර සමාජයට තවත් නමකි. කිසි කෙනෙකුට එය එසේ නොවේයැයි අද හෝ කිසි කලෙක කිව නොහැක.

# හතරවෙනි පරිච්ඡේදය

නොයෙකුත් යුතුකම්, අයිතිවාසිකම් හා අවශ්‍යයෙන් කළයුතු දේ ගැන මිනිසුන් සඳහන් කරන නමුත් ඒවා මූලික සත්‍ය ධර්ම නොවේ. ඒවා ජීවත්වීමේදී ඇතිවන දුෂ්කරතාවයන් හසුරුවන උපක්‍රම සහ පිළිවෙළ පමණි. ඒවා මූලික නොවේ. මේ සියලුම සදාචාර ධර්මයන් හා මැනවැයි පිළිගත් හැසිරීම්, වර්ග දෙකක ජීවීන්ට හා ස්වභාවයන් දෙකකට එනම්, පුරුෂයින්ගේ හා ස්ත්‍රීන්ගේ අවශ්‍යතාවයන් සපයා දීම සඳහා ඇති වූවකි.

ඒවා සියල්ලෙහිම ව්‍යාප්ත වන ද්විත්වත්වය එනම්, ප්‍රාකෘති සහ පරමාත්ම, ගොරෝසු බව හා සියුම් බව, කුසීත බව හා සචෛතනික බව හඟවන්නේය. මෙම සියලු මැවීම් සිදුවූයේ කුසීත භාවය හා සචෛතනික භාවය එකකට එකක් සම්බන්ධවීමේ හේතුවෙනි. එසේ නොවේද? එමෙන්ම සියලුම නොයෙකුත් සිරිත් විරිත් මෙම දෙකට බෙදීම නිසා මතුවී ඇත. ධර්මයේ විහිදීම හා විස්තර විභාග දැක්වීම ඇතිවී ඇත්තේ පුරුෂ හා ස්ත්‍රී භාවය නිසාවෙනි.

එම නිසා ලෝකයේ ප්‍රායෝගික අභිවෘද්ධිය සඳහා වන ප්‍රධාන ධර්මය වනුයේ මෙම දෙකෙහි සදාචාරාත්මක පැවැත්ම සහ හැසිරීම වේ. කුමන ශාස්ත්‍ර වරයෙකු විසින් කුමක් ඉගැන්වූවද මෙම වෙන් වෙන්ව පවත්නා ලක්ෂණයන් දෙකින් ඔබ්බට යා නොහැකිය.

ඉහත සඳහන් සත්‍ය ධර්මයේ වැදගත්ම යෙදීම් වනුයේ පුරුෂයන් සඳහාවූ පුරුෂ ධර්ම සහ ස්ත්‍රීන් සඳහාවූ ස්ත්‍රී ධර්ම වෙති. අනෙකුත් ධර්ම ශාස්ත්‍රයන් හා විනයයන් අමතර වන අතර, ගෝදාවරී ගඟ ඉදිරියට ගලා යාමේදී හමුවන කුඩා දිය පාරවල් වැනි ඒවා වේ. ඒවා සම්බන්ධ වනුයේ තාවකාලික වත නොයෙකුත් කාරණා, අවස්ථා හා තත්ත්වයන් වලටය. ඔබේ අවධානය යොමු විය යුත්තේ ප්‍රධාන ගංගාවටය. එහි ශාඛාවන්ට නොවේ. එමෙන්ම, ජීවත්වීම සඳහා මගපෙන්වන්නා වශයෙන් ප්‍රධාන පුරුෂ හා ස්ත්‍රී ධර්ම සලකා, දිවි පැවැත්මේදී සුළු සම්බන්ධයක් ඇති ධර්මයන්ට ස්ථිර තැනක් නොදෙන්න.

ස්ත්‍රී ධර්ම : දෙවියන් විසින් තමා වෙතම පවරාගත් මායාවක් ලෙස පැවසෙන දෙවියන්ගේ ස්ව අධිෂ්ඨානයෙන් සූදානම් කොට ගත් ශක්තිය ස්ත්‍රී මූලධර්මය බවද පැවසේ. මෙය, එනම් ස්ත්‍රී රූපය මායාවය. ගැහැනිය පරාශක්ති ස්වරූපය වශයෙන් සැලකෙනුයේ මේ නිසාය. ඇය මිනිසාගේ විශ්වාසවන්ත සහකාරියය ඔහුගේ භාග්‍යයය, දෙවියන්ගේ අධිෂ්ඨානයෙන් මූර්තිමත් වූ නිසා ඇය ගුප්තය පුදුම සහගතය, ආරක්ෂක මූලධර්මයෙහි ආදර්ශයය, මිනිසාගේ නිවසෙහි රැජිනය ඔහුගේ හිතවතියය, නිවසේ ආලෝකයය. ශක්ති ස්වරූපයේ ගණයන් වන කාන්තාවෝ කුමන ආකාරයකින්වත් පහත් නොවෙති. ඔවුන්ගේ ස්වභාවය ධෛර්යමත් කමින්, ඉවසීමෙන් හා ප්‍රේමයෙන් කොතරම් පිරී තිබේද? පිරිමින්ගේ ස්වයං සංවරය ඔවුන්ගේ ස්වයං සංවරයට සමාන කළ හැක්කේ කලාතුරකිනි



ආධ්‍යාත්මික මාර්ගයේ ගමන් කිරීම සඳහා පිරිමින්ට ආදර්ශය හා නායකත්වය දෙනුයේ ඔවුන්ය. පිරිසිදු ආත්මාර්ථකාමී නොවන ප්‍රේමය ඔවුන් තුළ සහජයෙන්ම ඇතිවී තිබේ. අවබෝධයෙන් පූර්ණ, ශිෂ්ටත්වයට පත්, ප්‍රේමයෙන් බැඳී සිටින, ඇගේ වචන හා ක්‍රියාවන් ධර්මයට අනුකූලද යන්න පිළිබඳව විමසිලිමත්ව සිටින කාන්තාවෝ ලක්ෂ්මී දෙව්දුව සේ නිවසට ප්‍රීතිය හා වාසනාව ගෙනදෙන්නෝය. පවිත්‍ර ප්‍රේමයෙන් බැඳී සිටිමින්, ආත්මය පෝෂණය කරන පොත්පත් දිනපතා දෙදෙනා විසින්ම කියවනු ලබන, දෙවියන්ගේ නාමය ගායනා කරමින් දෙවියන්ගේ මහිමය සිහියට නගන ස්වාමිපුරුෂයා හා භාර්යාව වසන නිවස දෙවියන්ගේ නිවස, වෛකුණ්ඨය වේ. ප්‍රේමයෙන් තම ස්වාමිපුරුෂයාට බැඳුනු කාන්තාව ඇත්ත වශයෙන්ම දුර්ලභ සුගන්ධයක් විහිදුවන මලකි. ඇය පවුලට දීප්තිය ගෙනදෙන අගනා මැණිකකි. සදාචාරය උරුමකොටගත් බිරිඳ ඇත්ත වශයෙන්ම කාන්තිමත් රත්නයකි.

කාන්තාවන්ට උතුම්ම දෙය පතිව්‍රතාවයි. එම ගුණයෙන් ලබාගත් ශක්තියෙන් ඇයට කුමන දෙයක් වුවද මුදුන් පමුණුවාගත හැක. එම බලයෙන් සාවිත්‍රිට ඇගේ ස්වාමිපුරුෂයාගේ ප්‍රාණය නැවත ලබාගැනීමට හැකි විය. ඇත්ත වශයෙන්ම ඇය මාරයා සමඟ සටන් කළාය. මහා ප්‍රාඥ අත්‍රිගේ බිරිඳ වූද, අනසූයාගේ මව වූද අනසූයාට ත්‍රිත්වයද ළදරුවන් බවට පත් කිරීමට හැකි විය. තම ලාදුරු රෝගී හිමියාට භක්තිවන්තවූ නලයානිට ඇගේ පතිව්‍රතාවේ ගුප්ත බලයෙන් සූර්යයාගේ ගමන නැවැත්වීමටද හැකිවිය. පතිව්‍රතාව කාන්තාවන්ගේ කිරීටයේ මැණික වේ. මහත් සේ ප්‍රශංසා කළයුතු ඇයගේ සදාචාරය එයයි. එහි යහපත් ප්‍රතිඵල විස්තර කිරීම පවා අසීරුය. එය ඇයගේ ජීවන හුස්ම වේ. පතිව්‍රතාවෙන් හා එයින් ලැබෙන බලයෙන් කාන්තාවකට ඇගේ හිමියා ආපදාවන්ගෙන් බේරාගත හැක. ඇගේ සදාචාරය නිසා පාපයෙන් මිදී, සැකයක් නොමැතිව පතිව්‍රතාවෙන් ස්වර්ගය පවා දිනාගත හැක. දමයන්තිට අවන්තේට්ටම් කිරීමට පැමිණි දඩයක්කාරයෙකු ඇගේ වචනයේ බලයෙන් දවා හළු කළාය. හදිසියේ කුරු ඉරනමට ගොදුරුවූ ඇගේ ස්වාමියා වූ නල රජු ඇය අතහැර ගිය විටදී, වනයේ හුදෙකලා ජීවිතයේ සියලු වේදනාවන් ඇය විඳදරා ගත්තාය.

විළිබිය ඇති බව කාන්තාවනට අවශ්‍යය. ඇයට එය අගය කළ නොහැකි මැණිකකි. කාන්තාවක විසින් විළිබිය ඇති භාවයේ සීමාවන් ඉක්මවා යාම වැළැක්වීමට පටහැනිය. සීමාව ඉක්මවා යාමෙන් බොහෝ විපත්තීන් ළඟාවේ. කාන්තා බවේ මහිමයද විනාශ වේ. විළිබිය නොමැති කාන්තාව සුන්දරත්වයෙන් හා ශිෂ්ටත්වයෙන් හීනය. නිහතමානී බව, සිහිවිලිවල හා හැසිරීමේ පිරිසිදු බව, විනීත බව, උසස් මානසික තත්ත්වයන්ට අවනත බව, සියුම් හැඟීම් ඇති බව, විනීත ස්වභාවයේ සෞම්‍ය බව යන මේ සියලු ගතිගුණයන්ගේම විශේෂ සම්මිශ්‍රණය විළිබිය ඇතිබව වේ. එය කාන්තාවනට සියලුම මැණික් වලට වඩා අනර්ඝ මැණිකකි.

විළිබිය ඇති කාන්තාවට ශිෂ්ටත්වය අවබෝධ කරගැනීමේ සහජ පුරුද්ද ඇති නිසා සැම විටම සීමාවන් තුල සිටින්නීය. කුමන හැසිරීම් ක්‍රමය සුදුසුද කුමන ක්‍රමය නුසුදුසුද යන්න නිරායාසයෙන්ම ඇයට දැනේ. ඇය ධර්මිෂ්ඨ ක්‍රියාවන් හා හැසිරීම්වල පමණක් පිහිටා සිටින්නීය. විළිබිය ඇතිබව කාන්තාවකගේ විශිෂ්ටත්වය මැන බැලීමේ පිළිවෙලකි. කාන්තාවකට විළිබිය නොමැති නම් ඇය ඇගේම කාන්තා භාවයේ යහපතට හානි කරගැනීම හැර තමාගේ පෞද්ගලිකත්වයද පීඩාවට පත් කර ගන්නීය. ඇය ලෝකයා විසින් රැකබලා නොගන්නා හෝ ගරු නොකරන හෝ පිළිගනු නොලබන සුගන්ධය නොමැති පුෂ්පයක් සේ වන්නීය. වෙනත් ආකාරයේ නිපුනත්වයන්ගෙන් කොපමණ පොහොසත් වුවද, විළිබිය නොමැති කාන්තාවගේ ජීවිතය නිෂ්ඵල හා හිස් වන්නේය. විළිබිය ඇති බව ඇය ඉතා උසස් පූජ්‍ය තත්ත්වයට පත් කරන්නේය. විළිබිය ඇති කාන්තාව තම නිවසෙහි සහ පිටතත්, සමාජයේ මෙන්ම ලෝකයේත් ආධිපත්‍යය පවත්වන්නීය.

සමහරු මැදිහත්වී මෙසේ අසත්තට පිළිවන. "විළිබිය ඇති බව වරද යයි විශ්වාස කරන කාන්තාවනුට අද ගරු බුහුමන් ලැබේ. ඔවුහු හිස කෙලින් තබාගෙන එහා මෙහා යති. ලේශ මාත්‍රයකින්වත් නොඅඩුව ලෝකයා ඔවුනට ගරු කරති". ලෝකයේ අද පවතින මෙම ක්‍රියාවන් හඳුන්වා දිමට මට අවශ්‍යතාවයක් නොමැත. ඒ පිළිබඳව සැලකිල්ල දැක්වීමට මට අවශ්‍ය නැත. ඔවුන් එක්තරා ආකාරයක ගෞරව හා සැලකිලි ලබනු ඇති නමුත් එම සැලකිලි යුක්ති සහගත හෝ සුදුසු හෝ නොවේ. නුසුදුසු අයෙකුට ගරු බුහුමන් දැක්වූ විට එය නිග්‍රහයකට සමානය. එය පිරිනැමූ විට භාර ගැනීම එම දිමනාවට අවමන් කිරීමකි. එය ගෞරවයක් නොව ආත්මාර්ථකාමී කැඳරයින් විසින් විළිබිය නැත්තවුන් හට කරන බොරු ප්‍රශංසාය. එය කෙල මෙන් අපිරිසිදු හා අප්‍රසන්නය.

ඇත්ත වශයෙන්ම විළිබිය ඇති කාන්තාව ගරු බුහුමන් වලට හෝ ප්‍රශංසාවට හෝ ආශා නොකරන්නීය. ඇගේ අවධානය සැම විටම යොමු වන්නේ ඇය විසින් ඉක්මවා නොයා යුතු සීමාවන් පිළිබඳව වේ. අයදීමකින් තොරව හා නිතැතින්ම ගරු බුහුමන් හා ප්‍රශංසාව ඇයට ලැබේ. මලෙහි හෝ නෙළුම් මලෙහි පැණි බමරුන්ට ආශා නොකරයි. මල් බමරුන්ට පැමිණීමට ආයාචනා නොකරති. බමරු එම මීහිර විඳ ඇති හෙයින් මල සොයා එති. ඔවුන් පැමිණෙනුයේ ඔවුන් හා මීහිර අතර ඇති සම්බන්ධය නිසාය. සීමාවන් දන්නා කාන්තාව හා ඇය උපදවන ගෞරවය අතර ඇති සම්බන්ධයද එසේමය.

මැඩියෙකු පියුමක් මත හිඳ එසේ සිටින බව ලොවට ප්‍රකාශ කළහොත් ඌ එම මලෙහි ඇති සුන්දරත්වයෙහි වටිනාකම හෝ මීහිරි බවෙහි අගය හෝ දන්නා බව එයින් ප්‍රකාශ වේද? මේවායින් එකක හෝ රසය ඌ විඳ තිබේද? ඌ වාටුවෙන් පියුම වර්ණනා කරන්නට පිළිවන. නමුත් එහි අඩංගුව ඇත්තේ



[illegible] යන බව හඳුනාගෙන තිබේද? කුමක් කෙසේ අගය කළයුතුදැයි නොදන්නා මිනිසුන් විසින් අද කාන්තාවනට පිරිනමනු ලබන ගෞරවය හා සම්මානය මෙබඳු වේ. විනිශ්චය කිරීමේ මිම්ම ඔවුහු නොදනිති. පරම වටිනාකම පිළිබඳ විශ්වාසයක් ඔවුනට නැත. ඇත්ත වශයෙන්ම උතුම් හා යහපත් අයට ඔවුහු ගරු නොකරති. ඔවුන් පිරිනමන දෙය "ගෞරවය" හෝ "සම්මානය" වශයෙන් හඳුන්වන්නේ කෙසේද? එය හැඳින්විය හැක්කේ "රෝගයක්" නැතහොත් හොඳ වචනයකින් නම් "චාරිත්‍ර විධියක්" වශයෙන් පමණි.

"විළිබිය නැති ගැහැණියක" "කාන්තාව" යනුවෙන් හැඳින්වීමට ආත්ම ධර්මයේ [illegible] ධර්මයන් අනුව ඉඩ නැත. ආත්මධර්මය අනුගමනය නොකරන්නෙකුට සම්මානය හෝ ගෞරවය පිරිනැමූවහොත්, එය ප්‍රාණයක් නොමැති සිරුරකට ආයිත්තම් පැටවීමක් වැනිය. මෘත ශරීරයට කරනු ලබන ගෞරවය භුක්ති විඳීමට ශරීරය හැරගිය ආත්මයට නොහැක. එමෙන්ම යථාර්ථය පිළිබඳව නොදත්, ආත්මයේ අන්තර්ගතයෙහි අන්දැකීමක් නැති පුද්ගලයෙකුට ප්‍රසිද්ධිය හා සම්මානය නමැති ඔටුන්න පැළඳුවද එයින් සතුටක් ලැබිය හැක්කේද?

විළිබිය ඇති කාන්තාව එවැනි අර්ථ ශූන්‍ය වැදගැම්මකට නොමැති නොවටිනා දේ ගැන නොසලකනු ඇත. ඇය ඊට වඩා තෘප්තිය ඇති කරන ආත්ම ගරුත්වය ලබාගැනීමට උත්සාහ දරණු ඇත. ඇය නිවසේ ලක්ෂමිය කෙරෙන සෞභාග්‍යය එය වේ. බිරිඳ ගෘහ ලක්ෂමී යනුවෙන් හඳුන්වා ඇත්තේ ඒ නිසාය. එවැනි උසස් භාවයක් බිරිඳකට නොමැත්තේ නම් එම නිවස අශෝභනත්වයේ [illegible]ස්ථානයක් වේ.

නිවසට සහ ආගමට ආධාරකය කාන්තාව වේ. ඇය ආගම් භක්තිය රෝපණය කොට පෝෂණය කරන්නීය. නැතහොත් නිසරු කොට උදුරා දමන්නීය. භක්තිය හා ආධ්‍යාත්මික වැයම සඳහා කාන්තාවනට සහජ හැකියාවක් තිබේ. භක්තිය, ශ්‍රද්ධාව සහ විනීත භාවය ඇති කාන්තාවට මිනිසුන් දේව මාර්ගයේ ගමන් කිරීමට සැලැස්වීමටද ධාර්මික ගුණයන් පුහුණු කිරීමටද සැලැස්විය හැකිය. ඔවුහු අරුණ උදාවීමට පෙර වේලාසනින් අවදි වෙති. නිවස පිරිසිදු කොට ස්නානයෙන් පසු මොහොතකට ජපම් සහ ධ්‍යානම්හි යෙදෙති. ඔවුන්ගේ නිවෙස්වල දෙවියන්ට පූජා පැවැත්වීම සඳහා කුඩා කාමරයක් ඇත. එහි දෙවියන්ගේ පිළිම මෙන්ම මහා ප්‍රාඥයින්ගේද, ගුරුන්ගේ සහ මාර්ගෝපදේශකයන්ගේද පිළිරූ තබනු ඇත. ඔවුන් එම කාමරය විශේෂයෙන් පූජ්‍ය ලෙස සලකන අතර, අවට ප්‍රදේශය උදය සහ සවස පමණක් නොව ආගමික දිනයන් සහ උත්සවයන්හිදිද යාඥාවෙන් පුරවති. සෑරව මේවා කරනු ලබන ගැහැණියට ඇගේ අදේවවාදී පුරුෂයා පවා, දෙවියන්ට කැපවූ ලීලාවකින් යාඥාවන්ට සම්බන්ධ කරවීමෙන් හෝ යහපත් ක්‍රියාවන්හි නිරත කරවීමෙන් හෝ යම් සමාජ සේවා වැඩ පිළිවෙලක යෙදවීමෙන් හෝ පරිවර්තනයකට

භාජනය වීමට සැළැස්විය හැකිය. සැබැවින්ම නිවස පවත්වාගෙන යනුයේ කාන්තාවය. එය ඇගේ මෙහෙවරයි. ඇය සත්‍යයෙන්ම ශක්තිගේ ආදශියයි.

අනෙක් අතට, ස්වාමි පුරුෂයා දෙවියන් කරා යන මාර්ගයෙන් බැහැරව, ආධ්‍යාත්මිකත්වයෙන් ඉන්ද්‍රියයන් පිනවීම දෙසට, ඇඳ ඇම්මට බිරිඳ නැත් කරන්නේ නම් හෝ ආධ්‍යාත්මික වැයමෙන් ප්‍රීතියක් ලැබීම සඳහා උත්සාහ දරණ බිරිඳ වැරදි මාර්ගයේ යන්තියක සේ සලකා එම උත්සාහයන් වලකාලීමට ස්වාමි පුරුෂයා නැත් කරන්නේ නම් හෝ එවැනි යුවලකගේ නිවසට නිවස යන් නාමය දීම නොවටනේය. එය නිවසක් නොව හොල්මන් සහ තපුරු භූතයින් රඟන නිරයකි.

ඇත්ත වශයෙන්ම, කාන්තාව ආත්මය පිළිබඳව දැනීම ඇතිකර ගැනීමට උත්සාහ දරමින් සැම විටම තමා ආත්මය පමණක්මය යන සචෛතනික භාවයේ පිහිටා ජීවත් වියුයුතුය. දිව්‍යමය විඥානයක් ඇති කෙනෙකු වීමට ආශා කරන බව ඇය තුලින් සැම විටම ඔප්පු විය යුතුය. එවැනි කාන්තාව සිටින නිවසද, ස්වාමි පුරුෂයා සහ බිරිඳ උසස් සිතිවිලි සෙවනේ ජීවත් වෙමින් දෙවියන්ගේ නාමයේ මහිමය පිළිබඳව එකට ගායනා කරන, එක්ව යහපත් ක්‍රියාවන්හි යෙදෙන, සත්‍යය, සාමය සහ ප්‍රේමය බලපවත්වන, ආගමික පොත්පත් නිතර කියවන, ඉන්ද්‍රියයන් පාලනය කරමින් හා මැවීම් සමස්ථය පිළිබඳ මූලික ඒකතාව ගැන අවබෝධයේ පෙළඹවීමෙන් මැවීම් සමස්ථයටම සමසේ සැලකිලි දක්වන නිවසද නිසැකවම මිහිපිට දෙව්ලොවකි.

එවැනි ලක්ෂණයන් ඇති බිරිඳට එම නම දීම වටනේය. ඇයගේ ස්වාමිපුරුෂයාට නියම ප්‍රේමය දැක්විය යුතුය. ඇයට ස්වාමිදුව නොහොත් ගෘහිණිය යැයි කිව හැක්කේ එවිටය. ඇය ධම්පතිනිය, භාර්‍යාව, ධම්, අර්ථ, කාම යන්නෙහි උපකරණය සහ සහායිකාව වනුයේ එවිටය. තම ස්වාමිපුරුෂයාගේ සිත හඳුනාගත්, ඔහුට මෘදුව සහ මිහිරිව කථා කරන, ඇය නියම මිතුරෙකි. සමහරවිට ස්වාමිපුරුෂයාට ධම්යේ මාර්ගය පෙන්වා දීමට සිදුවන අවස්ථාවේදී ඇය පියෙකුගේ කාර්යයද ඉටු කරන්නීය. ස්වාමිපුරුෂයා රෝගාතුර වූ විට ඇය මවකි.

කාන්තාව ප්‍රථම ස්ථානය දියයුත්තේ ස්වාමිපුරුෂයාට කරන සේවයටය. ඇයගේ නියම පිදුම එයයි. ඇයගේ යාඥාවන්, වැඳුම් සහ පූජාවන් පසුවට තැබිය හැක. ස්වාමිපුරුෂයාට සේවය නොකොට කරන වන්දනාවෙන් හෝ භාවනාවෙන් පරම සැපත ලැබීමට ඇයට නොහැක.

ඇත්ත වශයෙන්ම ස්වාමිපුරුෂයා දෙවියන් නියෝජනය කරන්නා වශයෙන් පිළිගතයුතු අතර ඔහුට කරන සියලුම සේවා පූජාවක තත්ත්වයට උසස් කළ යුතුය. යුතුකමෙහි නියම මාර්ගය එයයි. ආත්මය උදෙසා සහ එය පරමාත්මය සමග එක්වීම උදෙසා සැම කටයුත්තක්ම ඉටු කළහොත් එවිට එම කටයුත්ත



දෙවියන්ට කැප වන්නේය. එවැනි සියලු ක්‍රියාවලින් ගැලවීම ඇති කෙරේ. [illegible] ඇති නොවේ.

ස්වාමිපුරුෂයා කොපමණ නරක හෝ පහත් හෝ වුවද කම් නැත. බිරිඳ [illegible] ප්‍රේමය මාර්ගයෙන් ඔහු යහමඟට යොදවා නිවැරදි කොට දෙවියන්ගේ ආශීර්වාදය ලබාගැනීමට උදව් කළ යුතුය. ඔහුගේ දියුණුව හෝ අභිවෘධිය ගැන කල්පනා නොකොට ඇයගේ දියුණුව පමණක් වැදගත්ය යන හැඟීම [illegible] නොවේ. අනෙක් අතට ස්වාමිපුරුෂයාගේ ශුභසිද්ධිය, ස්වාමිපුරුෂයාගේ [illegible], ස්වාමිපුරුෂයාගේ ප්‍රාර්ථනාවන්, ස්වාමිපුරුෂයාගේ ගැලවීම යන මේවා [illegible] සර්වරෝග නාශකයක් වන බව ඇයට හැඟී යායුතුය. එවැනි කාන්තාවකට විශේෂ උත්සාහයක් නොමැතිව දෙවියන්ගේ අනුග්‍රහය අනායාසයෙන්ම ලැබේ. එම අනුග්‍රහය නොකඩවාම ලැබේ. දෙවියෝ සියලු [illegible] ඇය සමඟ හිඳිමින් සියලු ආකාරයෙන්ම කරුණාව දක්වන්නෝය. ඇයගේ සදාචාරය හේතුකොටගෙන ස්වාමිපුරුෂයාගේ ගැලවීම සහතික [illegible].

## පස්වෙනි පරිච්ඡේදය

පිරිමින්ට මෙන්ම කාන්තාවන්ටද අධ්‍යාපනය අවශ්‍යය. නමුත්, කාන්තාව සඳහා වන අධ්‍යාපනය ඔවුන්ගේ විශේෂ අවශ්‍යතාවයන් අනුව විය යුතුය. උගත් කාන්තාවෝ ඇත්ත වශයෙන්ම මුළු ලොව සඳහාම ධර්මය වැඩිදියුණු කරවන්නෝ වෙති. නියම අධ්‍යාපනයක් ලබා ගැනීමට දෙමව්පියන්ද ඔවුන් සහයෝගය දිය යුතුය. සමහර කරුණු සම්බන්ධයෙන් කාන්තාවන්ට නිදහස නොදිය යුතුය. එවැනි නිදහස දීමක් මම අනුමත නොකරමි. ඔවුන් ආදර්ශම කාන්තාවන් විය යුතුය. ඒ සඳහා ඔවුන්ගේ අධ්‍යාපනය ඒ ආකාරය හැඩගැස්විය යුතුය.

සීමාවක් නැති නිදහස ධර්මයේ විනාශයයි. හැරත් කාන්තාවෝ එම නිදහ මගින් ඔවුන්ටම හානි පමුණුවා ගනිති. විමංශන බුද්ධියෙන් තොරව සමාජ හැසිරෙන විට ප්‍රතිඵල අනර්ථකාරී වේ. සැබවින්ම ඉහත කාලයේද උග කාන්තාවෝ සිටියහ. නමුත් ඔවුහු ඔවුන්ගේ ධර්මය අත්නොහැරියහ, ආත් ධර්මයෙහි අරමුණ අමතක නොකළහ. විද්‍යා නොහොත් අධ්‍යාපනය ගොඩනැගි යුත්තේ විවේක නොහොත් විමංශන බුද්ධිය නමැති පදනම මතය. සුළභ සාවිත්‍රී, අනසූයා, ගාර්ගි, නලයානි සහ තවත් මවුන් වැනි පතිව්‍රතාවෙ ආදර්ශමත් කාන්තාවෝද, මීරා වැනි දේව බැතිමතියෝද, චූඩලා වැ යෝගිනියෝද යන මේ සියල්ලෝම මෙම භාරත දේශයේ උපත ලද අත ඔවුහු ධර්මයට ඇති ඇල්ම නිසා ධර්මය ශක්තිමත් කළහ. එක් වතාවක සුළ ඇගේ පාණ්ඩිත්‍යයෙන් සහ අත්දැකීම් තුළින් ආත්මය පිළිබඳව දේශන කර ජනක පවා මවිත විය. භක්තියෙන් හා ඥානයෙන් පොළඹවන ලද ත චරිතය හා හැසිරීම ආනුභා සම්පන්න කරගත් එවැනි උතුම් හා ධාර්මි කාන්තාවන්ගේ ආදර්ශය නිසා අද භාරත දේශයේ කාන්තාවන්ගේ හදවත් තු වාම බව, නිහතමානී බව හා භක්තිය බැබලේ.

කාන්තාවන් අද ධෛර්යය උපදවාගත යුත්තේ ඔවුන්ගෙනි. මොවුන් අතීත ජීවත්වූ පරිදි ජීවත්වීමට උත්සහා ගත යුතුය. හින්දු කාන්තාව ඇගේ ම පෙන්වන්නා ලෙස සැම විටම ධර්ම ආදර්ශය තබාගෙන ආධ්‍යාත්මික විනයෙ දියුණු විය යුතුය. අද ප්‍රමුඛත්වය ලබා ඇති භෞතික ලෝකයට සම්බ ඕනෑම විෂයයක් ඇයට ප්‍රගුණ කළ හැක. නමුත් ආත්මයේ ශුභසිද්ධියද අමත නොකළ යුතුය. අභ්‍යන්තර දෘෂ්ටිය දියුණු කරන වේදාන්තයන් අධ්‍යයන කිරීම පිළිබඳව ඇය උනන්දු විය යුතුය. මෙම පුහුණුව නොලද කාන්ත රුකුලක් නොමැතිව අවදානමේ පවතින ගල් පර්වතයක් මෙනි. ඇයටත් අ අයටත් අනතුරකි, ඉතා චපල පුද්ගලයෙකි. එවැනි අධ්‍යයනයන් කළ සුළ සහ අනෙකුත් අය මහත් සේ ප්‍රසිද්ධ වූ බ්‍රහ්මවාදිනූ වූහ. කාන්තාවන් අ එවැනි ශාන්තුවරියන් හා උගත් කාන්තාවන් ඉන්දියාව බිහිකළාය. පණ්ඩිත සහ විද්වත්තු අදහස් පහලකර ගැනීම හා මාගෝපදේශ සඳහා එව කාන්තාවන් කරා යාමට පුරුදුව සිටියහ.



දියුණුවේ අධිතාලම වැටී ඇත්තේ කුමක් මතද? ජාතියේ සමාජයේ සහ සමූහයේ දියුණුව රඳා පවතිනුයේ කාන්තාවන් ලබන සුදුසු අධ්‍යාපනය මතය. එය ආදියේ පැවති නොකිලිටි උසස් බවට පත්කළ හැක්කේ ආත්ම විද්‍යා, ධර්ම යථාර්ථය අවබෝධ කරගැනීමේ විද්‍යාව ප්‍රගුණ කළ කාන්තාවන් මගින් පමණි. ජාතියට නිත්‍ය සමාධිය හා සාමය ඇති වීමට නම් යහපත් චරිතය හා සදාචාර ගතිගුණ අවධාරණය කෙරෙන අධ්‍යාපනයක් තුළින් කාන්තාවන් පුහුණු කළ යුතුය. මෙතල යහපත් හැසිරීම පිරිහීමට හා සමාජ සාමය නොමැති වීමට හේතු වී ඇත්තේ කාන්තාවන් සඳහාවූ අධ්‍යාපනයේ මෙම ගුණ නොසලකා හැරීම නිසාය. අහස සහ පොලොව නවමත් එසේමය. වෙනස සිදුවී ඇත්තේ අධ්‍යාපනයෙන් දෙන ආදර්ශය ධර්මයෙන් අධර්මයට වෙනස්ව ඇති හෙයිනි.

අද අධ්‍යාපනය විද්‍යා වශයෙන් හැඳින්වේ. නමුත් ඒ හැඳින්වීමක් පමණි. අද උගතුන්ගේ ක්‍රියාවන් හා පෞද්ගලික ගති ගැන සලකා බලන විට එම නාමය ඔවුන්ට නොගැලපේ. බාහිර තත්ත්වයන් ගැන නොසලකා ආත්මයේ අභ්‍යන්තර ප්‍රබෝධය පිළිගැනීමට උගත් පුද්ගලයාට හැකි විය යුතුය. ඔහු විසින් ජීවිතයේ අරමුණ වටහාගෙන තිබිය යුතුය. ඔහු යථාර්ථ අවබෝධ විනය පිළිබඳව උතුම් හෝරුම් ඇතිව සිටිය යුතුය. පුරාණ කාලයෙහි සැම ශිෂ්‍යයෙකු විසින්ම ලබා ගැනීමට හැකිකළ "ඩිප්ලෝමාව" වූයේ දෙවියන්ගේ අනුග්‍රහයය. සදාචාරය දියුණු කිරීම, ආත්මය ගැන දැනගැනීම, ස්වාභාවික ඥානයේ උදාර බව, යහපත් හැසිරීම, නිර්මල පුරුදු, ඉන්ද්‍රියයන් පාලනය, සිතෙහි සංවරය සහ දේව ගතිගුණ වර්ධනය යනාදියෙන් ප්‍රවීණ අයට එම ඩිප්ලෝමාව ප්‍රදානය කරන ලදී. කෙසේ වෙතත් අද කරුණු වෙනස්ය. පොත්පත් කිහිපයක් කටපාඩම් කිරීමෙන් අද ඩිප්ලෝමාවක් ලබාගත හැකිය. නවීන පාසල් අධ්‍යාපනය තුළින් පුද්ගලයෙකුට සදාචාරාත්මක හා අධ්‍යාත්මික පුහුණුවක් ලබාගත නොහැක.

සෑම කාන්තාවකටම අධ්‍යාපනය දිය යුත්තේ හොඳ සැලසුමක් අනුවය. ධර්මයේ ප්‍රශ්න අවබෝධ කරගැනීමට ඇයට හැකිවිය යුතුය. රටට සමාජයට හා පවුලට ඇගේ හැකියාවන්ගේ හා ශක්තියේ සීමාවන් තුළ ඇයට හැකි සේවය සහ සහාය දිය යුතුය. කාන්තාවගේ ශිෂ්ටත්වය මත හැර ජාතියක් ගොඩනැගිය නොහැක්කේය. ඉදිරි පරම්පරාව හැඩගැස්වනුයේ අද මව්වරුන් විසිනි. අද පරම්පරාව මෙපමණ අධර්මයෙන් සහ අයුක්තියෙන් පිරී ඇත්තේ, එය හැදූ මව්වරු පරීක්ෂාකාරීව නොසිටි හෙයින් හා බුද්ධිමත් භාවයෙන් යුක්ත නොවූ හෙයිනි. අතීතය අතීතයමය. ඉදිරි පරම්පරාවවත් බේරා ගැනීමට නම් කල්වේලා ඇතිව කාන්තාවන්ට අවවාද කළ යුතු අතර පැරැන්නන් ආදර්ශයට ගැනීමට මග පෙන්විය යුතුය.

අතීතය, වර්තමානය හෝ අනාගතය යන සියලු කාලයටම ප්‍රගතියේ කොඳු ඇටය, ජාතියේ හදවත, එහි හුස්ම කාන්තාවෝය. ඔවුහු ලෝකයේ ජීවන ධර්මය යට පවිත්‍රතාවයෙන් පරිපූර්ණවූ ප්‍රධාන භූමිකාවක් රඟපාන්නාහුය. ඇගේ දූත මෙහෙවර වනුයේ නිවැරදි භාවයේ සහ සදාචාරයේ විධි නියම කිරීමය. ඇය දරුවන්ට සදාචාරය හා ආධ්‍යාත්මය පිළිබඳ පුහුණුව ලබා දිය යුතුය. මව ධර්මානුකූල වන විට දරුවන්ටද එහි යහපත ලැබෙන අතර, ඒ ආකාරයෙන් ඔවුන්ද පරිපූර්ණ වේ. ඇය සදාචාරාත්මක වූ විට දරුවෝද සදාචාරාත්මක වීමට ඉගෙන ගනිති. එමනිසා රටක් දියුණුවේද, පහත වැටේද යන්න තීරණය කරනුයේ කාන්තාවන් අතර අධ්‍යාපන මට්ටම වේ. ඇගේ ක්‍රියාවන් හා පැවැත්ම ඉතා වැදගත් කරුණු වෙති.

මේ සම්බන්ධයෙන් වැඩිහිටියන්ගේ සහ මව්පියන්ගේ වගකීම ඉතා විශාලය. අද සිසුන් ගනිමු. ඔවුන් තුළ ශිෂ්ටත්වයේ අංශුමාත්‍රයක්වත් දැකිය නොහැක. ආධ්‍යාත්මික ගුණය හා ආත්මය පිළිබඳව කථා කිරීම ඔවුන් තුළ හාස්‍යය උපදවයි. මහන්තත්ව වචනත් ඇඳුම් වලට ඇති දාසත්වයත් ඔවුන්ගේ විලාසිතාවන් වී තිබේ. මේ පිරිසිදු සංස්කෘතිය නොවේ. නිවසක පාලනය සම්බන්ධයෙන් වන විට අද උගත් කාන්තාවෝ අසරණයහ. නිවස ඔවුනට භෝජනාගාරයක් පමණි. ඔවුහු ඉතා අසරණව අරක්කැමියා සහ මෙහෙකාරිය වෙතට බලාපොරොත්තු තබා ඇත. උගත් කාන්තාව නවීන නිවස අලංකාර කරන වර්ණාලේපිත බෝනික්කෙකු පමණි. ඇය ස්වාමිපුරුෂයාට බාධකයකි, ඔහුගේ බෙල්ලේ එල්ලී තිබෙන බරකි. සියලුම ආකාරයේ භාණ්ඩ සඳහා මුදල් වැය කිරීමට දැඩි ලෙස ඉල්ලීම් කිරීමෙන් ඔහුට හිරිහැර කරන්නිය. ඇය ගෘහ පාලනයට හවුල් නොවන අතර, අලසකම සහ ආහාර ගෙන ව්‍යායාමයක් නොමැතිව නිදාගනිමින් ඉක්මණින්ම මරණය ගෙන දෙන රෝග සාදා ගන්නිය.

කාන්තාවන්ගේ නොහික්මුණු හැසිරීම් නිසා අද ලෝකය ධර්මය පිරිහීමේ වාතාවරණයක් තුළ වෙලී ඇත. යහපත් චරිතය හා උසස් ගතිගුණ වර්ධනය කර ගැනීමට සැලකිලි නොදක්වා, අස්ථිර සතුට පසුපස යාමෙන් කාන්තාවෝ ඔවුන්ටම හානි කර ගනිති. ඔවුන්ගේ අහංකාරය පෝෂණය කරන ව්‍යාජ නිදහසෙහි ඔවුහු ඇලී සිටිති. රැකියාවක නිරත වීම, උපාධි ලබාගැනීම, ගෞරවය හෝ වෙනස්කම් නොසලකා සියල්ලන් සමගම හැසිරීම, වැඩිහිටියන් ගරු කිරීම පසෙක දැමීම, පවට හා අකුසල් වලට බිය නැති වීම, යහපත් අයගේ හා පූජ්‍යවන්තයන්ගේ අයිතීන් නොසලකා හැරීම, තමා කියන ආකාරයට ක්‍රියා කිරීමට ස්වාමියාට බල කිරීම, තමාගේ වැරදි පිළිබඳව පසුතැවිලි වීමෙන් ලැබෙන ගෞරවය ප්‍රතික්ෂේප කිරීම යන මේවා උගත්කමේ ලක්ෂණයද? නැත. ඒවා අවිද්‍යාවේ භයානක ආකාරයන්ය, පුද්ගලයකු අශෝභනත්වයට හා පිළිකුලට භාජනය කරන නුගත් ආත්මාර්ථකාමී ආකල්පයන්ය.



ස්වාමිපුරුෂයාගේ නිවස පූජනීයයයි බිරිඳට හැඟෙන්නේ නම්, එවිට එම නිවස ඇයට සෑම දක්ෂකමක්ම හා යෝග්‍යතාවයක්ම උරුම කර දෙන්නේය. එම නිවස පරදවන කිසි තැනක් ඇයට නැත. එය ඇයගේ දේව මන්දිරයය, ඇගේ විද්‍යාලය, ඇගේ ක්‍රීඩා භූමියය, ඇගේ දේශපාලන බිම්ය, ඇගේ පරිත්‍යාග භූමියය, ඇගේ ආශ්‍රමයය යනුවෙන් එක්තරා අධි භක්තිමත් කවියෙකු ගායනා කර ඇත.

උගත් කාන්තාවන්ට ඔවුනගේ දක්ෂකම, රුචිකත්වය, කැමැත්ත, ආශාව, පරිසරය, අධ්‍යාපන තත්ත්වය, ජීවන ක්‍රමය, පුහුණුව හෝ පාණ්ඩිත්‍යය අනුව ඔවුන් අවට සමාජයට ප්‍රයෝජනවත් සේවයක් කළ හැක. ඔවුන්ගේ දෙමව්පියන්ගේ, ඔවුන්ගේ පවුලේ හෝ ඔවුන්ගේම කීර්තිය කෙලෙසීම ඔවුන් විසින් මගහැරිය යුතුය. යහපත් චරිතයක් නොමැති කාන්තාව "මියගියෙකු" සේ අනාර්යය. එම නිසා කාන්තාවෝ ලෝකයේ හැසිරෙන විට සෑම විටම පරිස්සම්කාරී විය යුතුය. ඔවුන් වැදගැම්මකට නැති කථා කිරීම හෝ නිදහසේ හැසිරීම මගහැරිය යුතුය. හොඳ නරක තේරුම් ගතහැකි කාන්තාව තම ස්වාමිපුරුෂයාගේ කීර්තියට හා ගරුත්වයට අලංකාරය ගෙනදෙන ක්‍රියාවන්හි පමණක් යෙදෙන්නීය, ඒවා කෙලෙසෙන ක්‍රියාවක් කිසි කල නොකරන්නීය. මෙසේ නියමයන් තිබෙන්නේ ඒ නිසාය. "උගත්කම ප්‍රයෝජනවත් කරන සද්ගුණ නොහොත් සුචරිතය උගතෙකුගේ ලක්ෂණයකි"

කාන්තාවන් අධ්‍යාපනයක් නොලැබිය යුතුය නැතහොත් සමාජයේ නොහැසිරිය යුතුය යනුවෙන් මම ප්‍රකාශ නොකරමි. ඔවුන් කොතැනක හැසිරුණද යහපත් ගතිගුණ දායාදකොට ඇත්නම්, එම යහපත් ගතිගුණයන්ට සෑහෙන යහපත් ක්‍රියාවන් හා පුරුදු තිබේනම්, සනාතන ධර්ම හා සාධන අනුව ක්‍රියා කරන්නේ නම් ඔවුන්ගේ උගත්කම ඇත්ත වශයෙන්ම වටනා අතර එවිට සමාජයට සැබවින්ම යහපතක් වන්නේමය. ඉගෙනීම හා සමාජය ඒවායින්ම හානිකර නොවේ. ඒවායේ ප්‍රතික්‍රියා ඇතිවනුයේ ඒවායින් ප්‍රයෝජනය ගනු ලබන පුද්ගලයන්ගේ ස්වභාවය අනුව වන අතර, ඒ අනුව යහපත් හෝ අයහපත් ප්‍රතිඵල දෙන්නේය. බළලා එකම කටින් බළල් පැටවාද මීයාද අල්ලන්නේය. නමුත් මොනතරම් වෙනසකින්ද? ඌ බළල් පැටවා සුරතල් කරයි. මීයා මරයි. සැබෑම විශේෂයක් නැත. ඌ හැසිරිය යුත්තේ කෙසේදැයි තීරණය කරනුයේ මීයා හෝ බළල් පැටවාය.

[illegible] ආහාරයට යමක් තෝරාබේරා ගැනීමේ ශක්තිය වර්ධනය කළ හැක. [illegible] ආරම්භය පෙළඹවිය හැක. යථාර්ථය සෙවීමට උනන්දු කළ හැක. [illegible] සෙවීම පෙළඹවිය හැක. පරමහංස තත්ත්වයට පත්වීම සඳහා මග [illegible] කළ හැක. අනෙක් අතට එයට සමහරවිට මිථ්‍යාවේ, කෲර කමේ [illegible] මූලයන් පෝෂණය කොට ශක්තිමත් කිරීමට හැක. එයට

වංචා කිරීමේ නව ක්‍රමයන් මිනිසාට පුහුණු කරවිය හැකි අතර, මිනිසාගේ මෙලොව ජීවන වෘත්තිය විනාශ කළ හැක. එයට ප්‍රේමය විප සහිත වෛරයක් පෙරළීමට සැලැස්විය හැකි අතර, සත්‍යය විවාදයට හේතුවක් කරගත හැක.

එමනිසා කාන්තාව විසින් කුමණ විෂයයක් හදාරා ප්‍රගුණ කර තිබුණද කුමන උපාධියක් ලබා තිබුණද, ඇයගේ සවාමිපුරුෂයාගේ හෝ ඇයගේ තත්ත්වය කුමක් වුවද ඇය මෙම සත්‍යයන් තදින්ම ග්‍රහණය කරගත යුතුය. අව්‍යාජ ශෝභාව පවතිනුයේ යහපත් චරිතයෙහිය, සදාචාරය කාන්තාවගේ හුස්මය, විනීත භාවය ජීවන ශක්තියය. සත්‍යයෙහි ස්ථිරව සිටීම ඇයගේ දෛනික යුතුකමය. ඇය ඇයගේ හද තුළ භයෙහි (පවට භය, දෙවියන්ට භය) බිජයන් රෝපනය කළ යුතු අතර නිහතමානී බවේ ශෝභාව දියුණු කරගත යුතුය. ආගමික, සදාචාරාත්මක සහ ඉන්ද්‍රිය ගෝචර කරුණු පිළිබඳ විෂයයන්හිදී ඇය ධර්මයේ විධිමත් නියමයන්ට අනුකූලව සිටිය යුතු අතර ධර්මය සියලුම විද්‍යාවන්හි නියම හරය ලෙස ගත යුතුය. ගෞරවය ආරක්ෂා කරගැනීම සඳහා ඇයගේ ජීවිතය වුවද පූජා කිරීමට සූදානම් විය යුතුය. ඇයගේ පතිව්‍රතාව සහ සවාමි භක්තිය පෝෂණය කොට ආරක්ෂා කළ යුතුය. කාන්තාවගේ අග්‍ර ධර්මය මෙය වේ. කාන්තාවක වශයෙන් උත්පත්තිය ලැබීමේ අදහසම එයයි.



# සයවෙනි පරිච්ඡේදය

මිනිසාගේ පසුබිමට ඔබින ආකාරයට ධර්මයේ මූලධර්මයන් වෙනස් නොවේ. ධර්මය නිත්‍යය. එදා අද සහ සදහටම ධර්මය ධර්මය ලෙසම පවතී. ඇත්ත වශයෙන්ම වෙනස්වන කරුණු අනුව ව්‍යවහාරික ධර්මයෙහි ක්‍රියාමාර්ග සහ විධි වෙනස් විය හැකිය. එසේ වුවද එම ක්‍රියා මාර්ගයන්, සැලසෙන වාසිය අනුව හොඳ ශාස්ත්‍රයන් පදනම් කරගෙන පරීක්ෂාකොට බැලිය යුතුය. එවැනි සිතා බැලීමක් නොකළ යුතුය. ප්‍රත්‍යක්ෂව පෙනෙන දෘෂ්‍යමාන ලාභයන්ට අදාල විෂයට ශාස්ත්‍රයන් සෑම විටම අනුබල නොදෙනවා පමණක් නොව එවැනි ක්‍රියාවන් පමණක් වේදයන් ආදිය විසින් පෙන්වා දීම බලාපොරොත්තු විය නොහැක. එම ක්‍රියා මාර්ග මගින් ධර්මය පරීක්ෂා කර බැලිය නොහැක. පෙළින්ම හෝ ඇසට පෙනෙන ආකාරයට කෙරෙන ඔප්පු කිරීම් කළ නොහැක. ධර්මය තේරුම්ගත හැක්කේ වේද මන්ත්‍ර මගින් පමණක් බවත්, වේද වලින් සොයා දීමට උත්සාහ කරනුයේ පියවි ඇසට පෙනෙන දෙයට එහා සත්‍යයන් බවත් මීමාංසකයන්හි ප්‍රකාශ කර ඇත.

පුද්ගලයන් කෙරෙහි බලාපොරොත්තු ඇතිව ධර්මය අනුගමනය කළ විට ලාභය ලබට හෝ සාර්ථක නොවුනහොත් ධර්මය පැහැර හැරීමටද ඉඩ ඇත. සෑම කෙනෙකුටම එකම අභිප්‍රාය නොතිබෙන්නට පිළිවන. සෑම කෙනෙකුටම එකම ආචාරයන් නොතිබෙන්නට පිළිවන. නිදසුනක් වශයෙන්, නියම කර ඇති ස්නාන, සන්ධ්‍යා, ජප සහ ධ්‍යාන වල ප්‍රතිඵල පිළිබඳව එක් එක් කැනැත්තාට වෙනස් අදහස් ඇති වීමට පිළිවන. සමහරු සවස් කාලයෙහි ශෛව ජනය පැහැරහැර ඒ වෙනුවට විෂ්ණු සහස්‍ර නාම හෝ ශිව සහස්‍ර නාම කියති. 'කාලෙ සන්ධ්‍යා සමාචරෙත්' "සන්ධ්‍යා වන්දනාව නියම කාලයෙහි කරන්න", නියමය එයයි. නමුත් එම නියමයන් එසේ තිබෙද්දී සවස සන්ධ්‍යා අත්හැරීම ධර්මය කඩ කිරීමක් නොවන්නේද? එසේම සෑම වර්ණයකටම නියමයන් තිබේ.

'චාතුර්වර්ණ්‍යම් මයා සෘෂ්ටම් ගුණ කර්ම විභාගශඃ' යනුවෙන් ගීතාවෙහි කියා තිබේ. අදහස ඉතා පැහැදිලිය. "වර්ණ හතර ජීවයේ ලක්ෂණ සහ ක්‍රියාකාරකම් අනුව බෙදා මවිසින් ඇතිකර තිබේ" ඉගැන්වීම එයයි. නමුත් නොයෙකුත් බොරු තර්කයන් හා නිසරු හේතු ඉදිරිපත් කිරීම් කෙරෙහි විශ්වාසය තබා, දෙවියන්ට හා පවට බිය නොමැතිව බොහෝ මිනිස්සු ඔවුනට සිතැති ධර්ම අනුගමනය කරති. ඔවුහු අහිංසක නුගත් මිනිසුන්ද වැරදි මාර්ගයට ඇද දමති. එසේ ලද්දවුන් උසස් තත්ත්වයට පමුණුවා ධර්මය යළි ස්ථාපනය කිරීම සඳහා කලින් කලට දෙවියන් ලොවට පැමිණෙනුයේ ඒ නිසාය. දෙවියන් පහළවීමට එය හේතුවේ. මේ පිළිබඳව ගීතාවෙහි හඬනගා ප්‍රකාශ කොට තිබේ.

"ධම් සම්ස්ථාපනාර්ථාය සම්භවාමි යුගේ යුගේ" මෙහිදී එක් කරුණ පැහැදිලිව වටහාගත යුතුය. දෙවියන් මනුෂ්‍ය වේශයෙන් පහළ වනුයේ ධම් විනාශවී අධම්යේ බලවේගයන් පැවතීම ආරම්භ වූ විටදීය යන බවට ගීතා කියවන" බොහෝ අය තේරුම් ගනිති. නමුත් ධම්ය විනාශ වන බව නිගමනයකට පැමිණීමට පදනමක් නැත. ගීතාවෙහිද එසේ කියා නැත. යො ඇති වචනය "ග්ලානි" වේ. එයින් කියවෙනුයේ ධම්ය අන්තරාවට පත්වී ලකුණු පහළ වූ විට, "එයට වන හානියෙන් එය ආරක්ෂා කිරීම සඳහා ම පැමිණෙමි" යන්නය. ධම්ය විනාශ වූ පසු එය රැකබලාගෙන ආරක්ෂා කිරී සඳහා දෙවියන් පහළ වන බව කියා නැත. ප්‍රානය නිරුඩ වූ වි වෛද්‍යවරයකුගෙන් ඇති ඵලය කිම, එමෙන්ම මනුෂ්‍ය වර්ගයාගේ ජීවන හුස් වන ධම්ය විනාශ වූ විට භවරෝග වෛද්‍යවරයාගේ අවශ්‍යතාවය, එහ දෙවියන්ගේ පහළ වීමෙහි ඇති අවශ්‍යතාවය කුමක්ද? දෙවියන් විසින් ආරක් කළ යුත්තේ කුමක්ද? ධම්යේ විනාශ වීම නොව පහත වැටීම, දුවල වී නැතිවීම සඳහා "ග්ලානි" යන වචනය යොදා ඇත්තේ එහෙයිනි. ධම්ය ජීවියාගේ ජීවන හුස්ම වන හෙයින් ධම්ය ආරක්ෂා කිරීම දෙවියන්ගේ කාර්යය වේ

ධම්ය සාමාන්‍ය කාර්යයක් නොවේ. ධම්ය අනුගමනය නොකරන්නා මියගි කෙනෙකු හා සමානය. ඔහු එය අනුගමනය කරන්නේ නම්, ඔහු දේව ස්වභාවයෙ සිටී. යහපත් උපදෙස් මගින්ද ධම් මාර්ගයෙහි යෑමේදී ඇතිවන මන් බන්ධනී ප්‍රතිඵලයන්ට පෙළඹවීමෙන්ද, ධම් මාර්ගයෙහි නොයන්නන් හට සම්බන්ධක නැති කරන බවට භය ඇති කරමින්ද, අවශ්‍ය පියවරක් වශයෙන් සා දාන, භේද සහ දණ්ඩ යන සම්ප්‍රදායානුකූල ක්‍රමයන් අනුව දඩුවම් පමුණුවමින් මිනිසුන් ධම් මාර්ගයට හැරවීමට දැන් අවශ්‍යව තිබේ. ඉහත කාලයේ මිනිසුන් මරණය ඇතිකරන බවට මහත්සේ තර්ජන තිබුණු විටදී වුවද ධම්ය අනුගමන කිරීම අත් නොහලහ. අද අනෙකුත් අයගෙන් සුළු හෝ බලපෑමක් නොමැතිව මිනිස්සු අධම්ය තුළට ලිස්සා වැටෙති. ඇත්ත වශයෙන්ම, නොයෙකුත් ව්‍යාඛ ආකාරයෙන් ධම්යට අර්ථ කථනයන් දී ඇති අතර, නියම ධම්ය හරිහැ අනුගමනය කරන්නන්ට අවහිර කර ඔවුන් හාස්‍යයට ලක් කොට වියළි ත පත් වලටත් වඩා නරක ලෙස සලකති. ආශාවෙන් ධම්යෙහි ස්ථිරව සිටින්න වංචාකරුවන්, කෛරාටිකයන් සහ අඥානයන් සේ හංවඩු ගසති. ධම්ය හ ධම්යේ මූලධම් කුමක්ද යන්න එවැනි අයුතු චෝදනා නගන්නෝ නොදනිති අහෝ අවාසනාවන්තයෝ ! එම වචනයේ අර්ථය අවබෝධ කර ගැනීමටවත් ශක්තියක් ඔවුන්ට නැත. එහි වචනාර්ථයවත් නොදන්නා මිනිසුන් විසින් ධම් තේරුම් ගන්නේ කොයි ආකාරයටදැයි ඔබටම තීරණය කළ හැක ජාත්‍යන්ධයෙකු වූවෙකුට සූර්යයා හෝ එහි කිරණ ගැන දැනගත හැක්කේ මොනවාද? සූර්ය කිරණ මිනිසුගේ ශරීරයට වැටුනු විට එහි උෂ්ණත්වය ඇත් වශයෙන්ම විඳිය හැක. සූර්යයාගේ ස්වභාවය හෝ රූපාකාරය හෝ තැට හෝ දීප්තිය ආදිය පිළිබඳව අදහසක් ඔහුට ඇතිකරගත නොහැක. එමෙන්



ධම්ය පිළිබඳව වැටහීමක් නැති, ධම්ය කෙරෙහි විශ්වාසයක් නැති පුද්ගලයෙකුට ධම්යට අනුකූලව ජීවත්වීමෙන් ලැබෙන සන්තුෂ්ටිය අවබෝධ කරගත නොහැක. එවැනි පුද්ගලයකු ඉදිරියෙහි ධම්ය විස්තර කිරීම අති බිහිරි පුද්ගලයකු ඉදිරියෙහි හක්ගෙඩියක් පිඹීම වැනි නිෂ්ඵල ක්‍රියාවකි. හක්ගෙඩිය එය පිඹින්නාගේ තොල් මත තිබෙන බව පමණක් ඔහුට දැකිය හැක. එහි සුළු හෝ ශබ්දයක් ඇසිය නොහැකිය. එමෙන්ම ධම්ය පුද්ගලයෙකුට උගන්වන විටදී හෝ වණිනා කරන විටදී ඔහුට එය පිළිබඳ විශ්වාසයක් හා උනන්දුවක්ද එය ප්‍රායෝගිකව පුහුණු කිරීම සඳහා මහත් ආශාවක්ද ඇති බවට දැනගැනීමට පැළඹිළිමත් විය යුතුය. හසුරුවා නිවැරදි කිරීමට නැත් කළ යුත්තේ එවැනි අයවලුන් පමණි. පසුව, ඔවුන්ගේම පලපුරුද්ද තුලින් ඇතිවන පෙළඹවීම් සහ එයින් උපදින සන්තුෂ්ටිය නිසා නුගතුන් වුවද ඔවුන්ගේ හදවත් තුල ධම්යේ බීජ රෝපණය කර ගනිති.

මෙහෙළ, වේද සහ ශාස්ත්‍රයන් පිළිබඳ දැනීමෙහි නිමග්න වූ අය සහ පැරණි ශාස්ත්‍රයන් පිළිබඳ උගතුන්ද ඔවුන් විසින් ප්‍රගුණකරන ලද ග්‍රන්ථයන් කෙරෙහි ඇති විශ්වාසය නැති කරගෙන ඇත. ඔවුන්ගේ අවිනීත මිතුරන් විසින් ඔවුන් නොමගට භාජනය කරනු ලබන හෙයින් ධම්යට තදින්ම ඇලී සිටීමට ඔවුනු බියවී ඇත. විවේචකයන්ගේ වංක තර්කයන්ට නැමුනු ඔවුන් සුළු ලාභ ප්‍රයෝජනයන් තකා ඔවුන්ගේ උරුමය පාවා දී ඇත. ඔවුනු ඒකාදාසි උපවාසය සෞඛ්‍ය ක්‍රමවත් බවට පත් කරන්නක් ලෙසද, කපුරු දල්වා වලනය කිරීම රෝග ජෝතිෂ්‍යට ප්‍රතිකාරයක් ලෙසද ප්‍රානයාම ආහාර දිරවීමට උපකාරී වන්නක් ලෙසද, වන්දනා ගමන් අධ්‍යාපන චාරිකා ලෙසද, පිනට දීම ස්වයං ප්‍රචාරයක් ලෙසද අර්ථ කථනය කර ධම්යේ පවිත්‍ර නියමයන් අවමානයට භාජනය කොට තිබෙන ඇත.

එවැනි මිනිසුන් කරනුයේ ලෝකය මුලා කිරීම පමණි. ඔවුනු ධම්ය නොදන්නා හෝ එහි මූලධම්යන් නොසලකන මෙලච්ඡයෝය. ඔවුන්ට මනුධම්ය ආරක්ෂා කිරීමෙන් යමක් ඉගෙනගත හැක.

ආර්ෂම් ධම්ෝපදෙශම් ච
වෙද ශාස්ත්‍ර අවිරෝධිනා
යස්තර්කේනානුසන්ධත්තේ
ස ධම්ම් වෙද නෙතරඃ

මනු මෙසේ කියා ඇත. "යමෙකුට ධම්ය දැනගැනීමට අවශ්‍ය නම් එසේ කළ යුත්තේ වේද සහ ශාස්ත්‍රයන්ට පටහැනි නොවන තර්ක ක්‍රමයක් අනුගමනය කිරීමෙනි." වේදයන්ට විරුද්ධවූ කිසිම නිගමනයක් තර්කානුකූල විය නොහැක්. නොහොත්, තර්ක නියුක්තයෝජිත වන අතර වේද ආදිය ප්‍රගුණ කිරීමට අදහස් කරන අයට මනු විසින් ඒ නිර්දේශ නොකෙරේ. මෙම තර්කානුකූල කරුණු

ඉදිරිපත් කරමින් අධර්මය අනුගමනය කරන්නවුන් මෙකල තවමත් සිටින අතර ඔවුහු අනෙකුත් අයද වැරදි මාර්ගයට ඇද දමති. බොහෝ කලකට පෙර වේදව්‍යාස මෙසේ ප්‍රකාශ කර ඇත්තේ එහෙයිනි.

න යක්‍ෂ්‍යන්ති, න හොස්‍යන්ති හෙතුවාදවිමොහිතාඃ
නිඃශ්‍රේයසම් කරිෂ්‍යන්ති, හෙතුවාදවිමොහිතාඃ

එයින් අදහස් කරනුයේ, හේතු-ප්‍රත්‍යය සම්බන්ධය සොයමින් හේතු ප්‍රත්‍ය වාදය සහ තර්ක මර්ගය අනුගමනය කරන්නන්, ශුඩ වූ ගින්නට පූජාවන් නොකර පහත් අවමන් සහගත ක්‍රියාවන්හි යෙදෙති යන්නය. කලියුගයෙහි බලාපොරොත්තු විය යුතු තත්ත්වයන් පැහැදිලි කරමින් මහා භාරතයේ අරණ්‍යපර්වයෙහි වෙදව්‍යාස මේ බව කියා තිබේ.

සූර්යයා හා චන්ද්‍රයා ඔවුන්ගේ කක්‍ෂයන්හි තිවැරදිව ගමන් කරනුයේ ධර්මයේ නොහොත් ඍජු භාවයේ මාර්ගය අනුගමනය කරමිනි. දිව්‍යමය බලවේගයන් ඔවුන්ගේ නොයෙකුත් යුතුකම් හා වගකීම් ඉටු කරනුයේ ධර්මයේ හේතුවෙනි. පංච මහා භූතයන් ඒවායේ ස්වභාවයේ මූලධර්මයන්ට බැඳ තබනුයේ ධර්මය විසිනි.

ඔබ විසින් ධර්මය අනුගමනය කරන විට, ඒ නිසා ඔබට හෝ අනෙකුත් අයට හානි පැමිණවීමෙන් වැලකෙමින් හැකි උපරිම යහපත ලබා ගතයුතුය. ඔබ ධර්මය විසින් දෙනු ලබන ශාන්තියේ සහ ප්‍රමෝදයේ දීප්තිමත් ආදර්ශයක් වෙමින් ධර්මයේ තේජස පතුරුවාලිය යුතුය. නිසරු තර්කයන්ගේ මාර්ග අනුගමනය නොකරන්න. සැම දෙයකම දොස් දැකීමෙන් හා අගතියෙන් ඔබේ මොළය අවුල්කර නොගන්න., අනෙකුත් අය කරන හෝ විශ්වාස කරන දෙය පිළිබඳව නොසලකන අතර ඔවුන් ප්‍රකෘතිමත් කිරීමට හෝ ඔවුන්ගේ පියවර මාර්ගය තිවැරදි කිරීමට හෝ තැත් නොකරන්න. ඔබ පිළිබඳ තියම සත්‍යය වන මූලික ආත්මය කෙරෙහි විශ්වාසය තබන්න, ආත්මය අනාවරණය කෙරෙන්නේද නොකෙරෙන්නේද යන ක්‍රියා මාර්ගයට සියලුම පැවතුම් වලින් අවහිරයක් වන්නේද යන්න පරීක්‍ෂා කර බලන්න. එම විශ්වාසයේ සහ පිරික්සුමේ ආලෝකයෙන් ඔබේ දිනපතා යුතුකම් හා චාරිත්‍ර විධි පත්වාගෙන යන්න. එවිට ඔබ වැරැද්දට නොවැටේ. ඔබට බොහෝ සතුටද ලැබේ.

වෘත්තියක යෙදීම මිනිස් ලක්‍ෂණයකි. නැතහොත් වැඩක යෙදීම මිනිස් බවේ ලක්‍ෂණයකි යනුවෙන් කියැවෙන උද්‍යෝගම් පුරුෂ ලක්‍ෂණම් හෝ කර්මම් පුරුෂ ලක්‍ෂණම් වැනි ලෞකික සිද්ධාන්ත සමහරක් තිබේ. නමුත් තියම සිද්ධාන්තය නම් "ධර්මම් පුරුෂ ලක්‍ෂණම්" , "ධර්මය පිළිපැදීම මිනිස් බවේ ලක්‍ෂණයකි" වේ. ධර්ම, අර්ථ, කාම සහ මෝක්‍ෂ යන්නෙහි පුරුෂාර්ථයන් ක්‍රියාවට නංවමින් ධර්ම කර්මයන්හි නොහොත් සිතට කාවැදුනු ධර්මයට අනුකූල වැඩක සැමදෙනාම යෙදිය යුතුය.



කාන්තාවනට පතිව්‍රතා ධර්මය සේ පුරුෂයින්ට බ්‍රහ්මචර්යාව වේ. කාන්තාවන් ඇගේ ස්වාමියා හා ස්වාමි පුරුෂයා ලෙස එක් පුද්ගලයෙක් පමණක්ම සැලකිය යුතු අතර, පිරිමියා විසින්ද එකම ගැහැණියකට පමණක් තමාගේ සහකාරිය සහ බිරිඳ වශයෙන් විශ්වාසවන්ත විය යුතුය. පතිව්‍රතාවේ යුතුකම් සම්පූර්ණ කිරීම සඳහා ඇය විසින් තම ස්වාමි පුරුෂයා දෙවියන් ලෙස සලකා ගෞරව කරමින් ඔහුගේ අභිලාශයන් මුදුන්පත් කිරීමට මෙහෙ කළ යුතුය. එමෙන්ම, ඇය ගෘහ ලක්‍ෂ්මිය වන හෙයින් "නිවසේ ස්වාමිදුව" වශයෙන් ස්වාමි පුරුෂයා විසින්ද බිරිඳට ගරු කළ යුතුය. ඇගේ ප්‍රාර්ථනාවන් අනුව ක්‍රියා කළ යුතුය. මනු "මිනිසා" යන තත්ත්වය ලැබීමට සුදුසු වන්නේ එවිටය. ප්‍රසිද්ධිය හා කීර්තිය, නම්බුව හා අවනම්බුව, අවකල්ක්‍රියාව හා දුෂ්ටකම, හොඳ හා නරක යන මේ සියල්ල පිරිමින්ට මෙන්ම කාන්තාවනටද එක සමානව හා ඒකාකාරීව පවත්නේය. ගැහැණිය පමණක් බැඳ තැබීමට ලක්කොට මිනිසා නිදහස්ව සිටිය යුතුය. යනුවෙන් දෙයක් නැත. දෙදෙනාම එක හා සමානව ධර්මයේ නියමයන්ගෙන් බැඳී සිටිති. ඉහතින් සඳහන් කළ ගති යුගලයන් සතරෙහි ලක්‍ෂණයන් ගැන නොසලකා ක්‍රියා කළහොත් ඔවුන් දෙදෙනාම අධර්මයට වැටෙති. කාන්තාවන් මෙන්ම පිරිමින්ද සමහර කරුණු වලින් බැඳී සිටිති. සමහර දේ කිරීමට පිරිමින්ට අයිතියක් නැත. ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර ඉතා වැදගත් සමහර ප්‍රතිඥාවන් තිබේ.

# හත්වෙනි පරිච්ඡේදය

දෘෂ්‍යමාන සියල්ල ගයත්‍රී ලෙස බැබලේ. වාක් යනු ගයත්‍රී වන අතර වාක්හි දක්වා ඇති පරිදි හා වාක්හි අඩංගු මූලික කරුණු අනුව සියලුම වස්තූන් නොහොත් භූත වාක් වේ. වාක් යනු බිණුම නොහොත් ශබ්දය වේ. ඒවා විස්තර කරනු ලබන්නේ වාක් වලිනි. ප්‍රකාශ කරනුයේ වාක් වලිනි. අභවනුයේ වාක් වලිනි. සියලුම වස්තූන්ද ලෝකයෙහි නොහොත් ප්‍රිත්වියෙහි වේ. කිසිවකට එයින් ඔබ්බට යා නොහැක. මෙම ලෝකය මිනිසාගේ ශරීරය වේ. ඔහුට ඔහුගේ ශරීරයෙන් පැන යා නොහැක. ඔහුට නොනැසී පැවතීම සඳහා ප්‍රාණය ඇත. හුස්ම නොහොත් ප්‍රාණය "හදවත" නොහොත් හෘදය තුල වේ. ප්‍රාණයට හෘදයෙන් පිටතට හෝ ඔබ්බට යාම කල නොහැක.

ගයත්‍රියට පාද සතරක් ඇති අතර ප්‍රභේද සයක් ඇත. ප්‍රභේද නම් වාක්, භූත, ප්‍රිත්වි, ශරීරම්, ප්‍රාණ සහ හෘදය - බිණුම, වස්තූන්, ලෝකය, ශරීරය, හුස්ම සහ හදවත වේ. මේ ගයත්‍රිය විසින් වර්ධනය කරනු ලැබූ "පුරුෂ" ඇත්ත වශයෙන්ම උතුම්ය, පවිත්‍රය, ශ්‍රේෂ්ඨය. ප්‍රකාශ කොට ඇති පරිදි, මේ සියලු බාහිර විවිධත්වය ඔහුගේ ශරීරයේ ඉතා කුඩා කොටසක් පමණි. වස්තූන් නොහොත් භූතවල සංඛ්‍යාව හා ස්වභාවය, වැඩ පිළිවෙල හා අර්ථය අවබෝ කරගැනීම අසීරුය. තවද එය දෙවියන්ගේ මහානුභාව සම්පන්න භාවයෙ හතරෙන් කොටසක් පමණි. ඉතිරි හතරෙන් තුන දෙවියන්ගේ ප්‍රභාස්ව අමරණීය ආකාරය වේ.

ඒ ශෝභාව පිරි රූපයේ අභිරහස වටහා ගැනීමට අපහසුය. ගයත්‍රියෙ දක්වන මෙම පුරුෂ තෙම ඇත්තෙන්ම දක්වා ඇත්තේ බ්‍රහ්මන් වශයෙනි. ඔ මිනිසාගේ අවබෝධය ඉක්මවා යන ආකාශ වේ. ඔහු "බහීර් ධපුරුෂාකාස යනුවෙන් කියැවේ. මේ අවධි වීමේ අවස්ථාවේ උසස් භාවයය, මිනිසාගේ පෞරුෂත්වය අභ්‍යන්තරයෙහි වූ එම පුරුෂ ආකාශ වේ. ඔහු "අන පුරුෂාකාසඃ" වේ. ඒ "ස්වප්න අවස්ථාවෙහි" උසස් භාවයය. ඔහු මිනිසාගේ හෘදය තුලදී ආකාශ වේ. ඔහු එය සම්පූර්ණ කරමින් පරිපූර්ණ කරවයි. "ගැඹුරු නිදි අවස්ථාවය." මේ සත්‍යය දත් තැනැත්තා සම්පූර්ණත්වයට බ්‍රහ්මන් තත්ත්වයට පත්වේ. එනම් අවදි සිහින සහ ගැඹුරු නිදි (ජග ස්වප්න හා සුසුප්ති) යන අවස්ථා තුන හඳුනාගත් තැනැත්තා බ්‍රහ්මන් වේ. ආත්ම ස්වරූපය යන නාමය දරණ පුරුෂ වශයෙන් හැඳින්වෙන මිනි මමත්වයේ ගබඩාවක් වෙමින් එහි විපාක වශයෙන් පවිත්‍රතාවයෙන් තොර අයුක්තිය සෙවීම කොතරම් හාස්‍යජනකද? කොතරම් ඛේදජනකද? මෙකලව එම "පුරුෂ" වශයෙන් හැඳින්වීමට නම් එම මහිමවත් බවේ අංශු මාත්‍රය දායාද වන මාර්ගය අනුගමනය කිරීමට මිනිසා උත්සාහ කළ යුතුය.



එසේ නම් පුරුෂ ධම ලෙස කථා කළ හැක්කේ මොනවාද? මූලික පුරුෂයාගේ ඉතා සුළු මහිමයක්වත් අත්කර ගැනීමට තැත් නොකල පුරුෂයින්ගෙන් පුරුෂ ධම පුහුණු කිරීම පිළිබඳව බලාපොරොත්තු වන්නේ කෙසේද? ඉතා උද්යෝගිමත් සොයා බැලීමකින් පවා එහි අංශුමාත්‍රයක්වත් අද අනාවරණය නොවේ. ඉහත කාලයේ සෘෂිවරු මෙසේ කියා ඇත.

සම්ධ්‍යා හීනො සුචිර්නිත්‍යමනතස් සව් කර්මාසු

යද් අන්‍යත් කුරුතෙ කමො නො තස්‍ය ඵල භාග් භවෙත්

එයින් කියැවෙනුයේ දෙවරක් උත්පත්තිය ලද තැනැත්තා (බ්‍රාහ්මණයා) සන්ධ්‍යා පූජාවන් අත්හැරි විට ඔහු විනාශයට වැටේ යනුයි. සියලු සෘෘතින්හි එසේ සඳහන් වේ. සන්ධ්‍යා පූජා පැහැර හරින අයට වෙනත් ආකාරයේ පූදපූජා සඳහා අයිතිවාසිකම් නැත. ඉහත කාලයේ සෘෂි වරුන්ට දීර්ඝායුෂ, කීර්තිය, තේජස, ඥානය හා දේවත්වයේ ශෝභාව ලැබුනේ සන්ධ්‍යා පූජාවන් පැවැත්වූ හෙයිනි. මෙය මනු විසින්ද පවසා තිබේ. එම නිසා, අප කුමන දෘෂ්ටි කෝනයකින් බලනා බැලුවද, ගයත්‍රිය පිළිබඳව භාවනා නොකරන කුමන බ්‍රාහ්මණයෙකු විසින්වත් එම තත්ත්වය ලැබීමට සුදුසු නොවන්නේය.

ඇත්ත වශයෙන්ම, මෙහිදී බ්‍රාහ්මණ යනුවෙන් අදහස් කරනුයේ බ්‍රහ්ම තත්ව ප්‍රත්‍යක්ෂ කරගත් මිනිසා වන අතර බ්‍රහ්මෝපාසනයට, එනම් බ්‍රහ්මන් පිළිබඳව අඛණ්ඩ භාවනාව පුරුදු කිරීමෙන් පරිශුද්ධත්වයට පත් තැනැත්තාටය. කුලයකට හෝ ආගමකට වුවද කිසිම සම්බන්ධ කමක් මෙහි නැත. නමුත් බ්‍රාහ්මණ යන නම උරුම කරගත් අයට සන්ධ්‍යා නැමැදුම සහ ගයත්‍රිය පිළිපැදීමේ විශේෂ වගකීමක් ඇත.

සත්‍ය වශයෙන්ම සන්ධ්‍යා යනු කුමක්ද? සම් යනු යහපත වන අතර ධ්‍යා යන්න ධ්‍යාන යන්නෙන් බිඳී ඇත. එසේ හෙයින් සන්ධ්‍යා යනු දෙවියන් පිළිබඳව නිවැරදි ධ්‍යානය නොහොත් පරිශ්‍රමයෙන් කරන භාවනාව වේ. එයින් අදහස් කරනුයේ දේවත්වය පිළිබඳ චිත්ත ඒකාග්‍රතාවයය. දෙවියන් කෙරෙහි සිත යොමු කිරීම පිණිස ක්‍රියාවන් පාලනය කළ යුතුය. එම පාලිත ක්‍රියාවලිය සඵල වීමට නම් සත්ව, තමස් හා රජස් යන ගුණයන්හි බාධාවන් ජයගත යුතුය. මෙම ස්වාභාවික පෙළඹවීම් වල මුහුණුවර මතුවී ඒවායේ මාර්ගයේ පසක් කිරීමට යොමු වන විට එම බලපෑම් නැති කිරීමට දෙවියන්ට යාඥා කළ යුතුය. දෙවියන් කරා යාමට උත්සාහ දරණ මිනිසාගේ මූල්ම යුතුකම එය වේ. උදය සාත්වික ස්වභාවයේ කාල සීමාවය, "මධ්‍යාහ්නය" රාජසික ස්වභාවයය, "සන්ධ්‍යා" කාලය තාමසික ස්වභාවයය යනු ස්වභාව ධර්මයේ නියමය වේ. නිම්දිරියේදී කැළඹීම් හා දොම්නස් වලින් නිදහස් වූ නිදි සුවයෙන් අවදිව ඇති හෙයින් සිත සන්සුන්ව නිර්මලව තිබේ. සියල්ලන්ම දන්නා පරිදි එම

කාලයේදී හා එම මානසික තත්ත්වයේදී දෙවියන් පිළිබඳව භාවනා කිරීම ඉතා ඵලදායී වේ. ප්‍රාථ: - සන්ධ්‍යා නියමකර ඇත්තේ මේ නිසාය. නමුත් මෙම වැදගත්කම නොදැන, පැරැන්නන් නියම කර ඇති නිසාම මිනිස්සු තේරුමක් නැතිව පුරුද්දට අනුව චාරිත්‍රය පවත්වති. මිනිසාගේ දෙවන යුතුකම වනුයේ, සන්ධ්‍යා පිදුම, එහි අභ්‍යන්තරික හා ගැඹුරු අර්ථය වටහාගෙන කිරීමය.

දවස ඉදිරියට යනවිට මිනිසා රජෝ ගුණය වන ක්‍රියාශීලී උත්සාහවත් භාවයෙන් යුතුව, දිනපතා කාර්යයන්හි හා පරිශ්‍රමයන්හි යෙදෙයි. දිවා ආහාරය ගැනීමට පෙර නැවත වරක් දෙවියන් පිළිබඳව භාවනා කිරීමට නියම කර ඇති අතර තම කාර්යයන් හා ජීවායින් ලැබෙන ප්‍රතිඵල දෙවියන්ටම කැප කළ යුතුය. ඔහුට ආහාර අනුභව කළ හැක්කේ මෙම භක්තිවන්ත ක්‍රියාවෙන් හා කෘතඥතා පූර්වක මෙනෙහි කිරීමෙන් පසුවය. මාධ්‍යාත්තිකම් වන මධ්‍යාන්න වන්දනාවේ අදහස මෙයයි. මෙම පිළිවෙත අනුගමනය කිරීමෙන් රජෝ ගුණය සත්ව ගුණය විසින් යටපත් වී පාලනය වේ. සියලුම මිනිසුන්ගේ තෙවැනි යුතුකම මෙයයි.

ඊළඟට තෙවැන්න වන තමස් ස්වභාවයට යටත් වීමට මිනිසාට සිදුවී ඇත. සවස් කාලය එළඹෙන විට මිනිසා කඩිමුඩියේ නිවසට ගොස් කුස පිරෙනතුරු අනුභව කළ විට නින්ද ඔහුව යටත් කරගන්නේය. නමුත් ඔහු විසින් ඉටුකළයුතු තවත් යුතුකමක් ඇත. ආහාර ගෙන නිදාගැනීම කම්මැලියන්ගේ සහ අලසයින්ගේ ඉරණමයි. ගුණයන් අතරින් ඉතාමත්ම නරක ගුණය වන තමස් ගුණය විසින් මිනිසා පාලනය කරනු ලබන විට එම ගුණයේ වෙලීම් වලින් මිදීම සඳහා, දෙවියන්ට ප්‍රශංසා කරන්නවුන්ගේ සමාගමයේ සිටිමින් යාඥාවේ යෙදීමට විශේෂ උත්සාහයක් කර, දෙවියන්ගේ මහිමය පිළිබඳව කියවමින්, යහ ගුණ වගා කරමින් හා යහපත් චර්යාවේ රීතීන් අර්ථවත්ව සිතේ දරාගෙන මිනිසා කටයුතු කළ යුතුය. නියමකොට ඇති සවස් කාලයේ සන්ධ්‍යා වන්දනාව මෙයයි.

එම නිසා, නින්ද නමැති හිස් ස්වභාවයේ සිට මතුවන සිත ක්‍රමානුකූලව හා බුද්ධිමත්ව පුහුණු කළ යුතුය. භාවනාවෙන් ලැබෙන ප්‍රමෝදය හා බාහිර ලෝකය පිළිබඳව නොදැනුවත්ව සිටීමෙන් ලැබෙන ප්‍රීතිය දිනපතා කෙරෙන ශාරීරික තින්දෙන් ලැබෙන සැපතට වඩා විශිෂ්ඨ හා නිත්‍ය බැව් සිතට දැනීමට සැලැස්විය යුතුය. මෙම ප්‍රමෝදය, මෙම ප්‍රීතිය සියල්ලන් විසින්ම අත්දැක ප්‍රත්‍යක්ෂ කරගත හැක. විමංශන බුද්ධියෙන් මෙය අවබෝධ කරගත හැක. මිනිසාගේ සිවුවන යුතුකම මෙයයි.

තමාගේ ජීවිතය පවතිනා තුරා දිනකට තෙවරක් සම්ධ්‍යා පිළිපදින්නාවූ මිනිසා ඇත්ත වශයෙන්ම උසස්ම වර්ගයට අයත් වන්නේය. ඔහු සඳහටම ශ්‍රෙෂ්ඨය, ඔහු ප්‍රාර්ථනා කරන සියල්ලම මුදුන්පත් වේ. සියල්ලටම වඩා ඔහු ජීවිතය පවතිද්දීම විමුක්තියට පත්වී ඇත්තේය. ඔහු ජීවන්මුක්ත වේ.



සම්ධ්‍යාව සාමාන්‍ය ක්‍රියා පිළිවෙලක්, අනුගමනය කළ යුතු බොහෝ වූ චාරිත්‍ර වලින් එකක් ලෙස නොගැනීමට වගබලාගත යුතුය. මෙය කළයුතු වන්නේ එහි වැදගත්කම වටහාගෙන අභ්‍යන්තර අදහස තදින් මෙනෙහි කරගෙනය. පුද්ගලයෙකු විසින් ගයත්‍රි මන්ත්‍රයෙහි අර්ථය පැහැදිලිව අවබෝධ කරගත යුතුය. එහි සඳහන්වන ප්‍රභාශ්වර සත්වයා - එනම් ආත්ම ස්වරූපය සහ තමා අතර ඇති නොවෙනස් බව අත්විඳීම අවශ්‍ය වේ. ගයත්‍රිය නොතකා හරිනුයේ එහි අදහස නොදත් අය පමණි.

මනු මේ පිළිබඳව විශේෂ අවධාරණයෙන් මෙසේ ප්‍රකාශ කොට ඇත. බ්‍රාහ්මණයින්ගේ ජීවන හුස්ම ගයත්‍රිය බැව් ඔහු විසින් ප්‍රකාශ කොට ඇත. එය ඔහුගේ ප්‍රකාශය පමණක් නොවේ. සත්‍යය වන්නේද එයයි. මිනිසාගේ බුද්ධිය ආලෝකමත් කොට පොෂ්‍ය කරන ප්‍රභාශ්වර තත්ත්වය පිළිබඳව කෙරෙන භාවනාවට වැඩි ආධ්‍යාත්මික අභිවෘද්ධිය කුමක්ද? පාපයට ඇති ලැදිකමෙන් සිත මුදවා ගැනීම සඳහා කරනු ලබන යාඥාවට වඩා යහපත්ව ඵලදායී වනුයේ කුමක්ද?

මිනිසාට සදාචාරය වගා කිරීම හැර වෙනත් සන්නාහයක් නොමැත. බ්‍රාහ්මණයෙකු ගයත්‍රියට ඇලී සිටින තාක් කල් සහ එහි අදහසින් සිත උද්‍යෝගමත් වන තාක් කල් ඔහුගේ තත්ත්වය විනාශ නොවන බව මනු පවසයි. ඔහුට වේදයන් අධ්‍යයනය කිරීමට ශක්තියක් නොමැත්තේ, නම්, ජීවිතයේ අවසානය දක්වාම ගයත්‍රිය කටපාඩමින් කියවීමත් එය අනුගමනය කිරීමත් කළයුතු බව මනු විසින් කියා තිබේ. ගයත්‍රියට වඩා අනඝ වස්තුවක් නොමැති බව ස්මෘති වලින්ද පැවසේ.

ආත්ම බලයට ලෝකයේ සියලුම කාර්යයන් ඉෂ්ට කළ හැක. එම බලය ලබාගැනීම කිරීම සඳහා ගයත්‍රිය අභ්‍යන්තර ශක්තිය දෙන හෙයින් සුදුසු අවස්ථාවේදී අපහසු නොකොට සැලකිල්ලෙන් එය පුහුණු කළ යුතුය. ශරීරය වැඩීම හා සංවර්ධනය සඳහා පිරිසිදු සාත්වික ආහාර ඉතා අවශ්‍යය. එසේ නොවේද? එමෙන්ම භාවනා නොහොත් නිර්මානාත්මක කල්පනා ශක්තියෙන් මිනිසාගේ අභ්‍යන්තරික උද්දීප්තිය ශක්තිමත් කිරීමට සූර්යයාගේ කාන්තිය ඇදගත යුතුය.

ආත්ම බලය වැඩිවන විට ඉන්ද්‍රියයන්ද ක්‍රියාත්මක වී ඵලදායී මාර්ගයන්ට යොමුවේ. එය පිරිහෙන විට ඉන්ද්‍රියයන්ද පිරිහී ඔබද පිරිහේ. එබැවින් එම අවධියේදීම සූර්ය ශක්තිය ඇදගතහොත්, නියම කලට රෝපනය කරන ලද බීජ මෙන් අස්වැන්න සවිර වේ. සූර්යයා උදාවී පොලොව ශෝභාවෙන් නැවී යද්දී අන්ධකාරය විසින් සැඟවීම ඇතිකොට ව්‍යාකූලත්වය ඇති කළ හැක්කේද? එම කාන්තිය අපට කාවැදුනු විට දුක පැවතිය හැකිද? බ්‍රහ්මන්ගේ ශිෂ්‍ය ලුප්පමින් ලැබෙන ශක්තියෙන් අප තොරවිය හැක්කේ කෙසේද? උසස් ආශාපොරොත්තු ඇති සියල්ලන්ගේම ශුභ සිද්ධිය සඳහා මෙම ක්‍රියාවලියේ

ශිල්ප ක්‍රමය ආදිමයන් විසින් දක්වා ඇත. එය ඉගෙන පුහුණු කරන්න. ඔවුන් ගිය මාර්ගයෙහි සත්‍යතාවයට ඔබගේ අත්දැකීමෙන් ඔබටම සාක්ෂි දැරිය හැක.

උපනයන ආගමික චාරිත්‍රයේ අදහස කුමක්ද? ඔබ එම දිනයේදී මුල පිරූ මන්ත්‍රය කුමක්ද? එම මන්ත්‍රය පමණක් අධ්‍යයනය කළ යුත්තේ ඇයි? වෙනත් ගුප්ත වචන මාලාවන්ට සම වැදගත්කමක් දී නැත්තේ ඇයි? මෙම කරුණු පිළිබඳව සිතා බැලීමේදී ගයත්‍රිය මන්ත්‍රවල රාජෝත්තමයා බැව් ඔබට වැටහෙනු ඇත. පූජා විධි නව අර්ථයන්ගෙන් දිප්තිමත් වන බවද, පූජා විධි හා සීමා කිරීම් බොහෝ අර්ථවත් බවද ඔබට වැටහේ. පැරැන්නන්ගේ ක්‍රියාවන් හා ක්‍රියාකාරකම් වටිනා බව වැටහේ. ඒවායේ වැදගත්කම දැනගැනීමට ඔබ උත්සාහ නොකළහොත් ඒවා සිතිවිල්ලට පමණක් සීමාවූ මගපෙන්වීම් වශයෙන් ඔබ ඒවාට අර්ථ කථනය දෙන අතර, ජීවිතයේ වගකීම් වලින් බැහැරව සිටීම සඳහාවූ ප්‍රයෝගයන් සහ උපක්‍රමයන් තුලට ඔබ වැටෙනු ඇත. ඔබ අයුක්තියට සහ නිෂේධයට, අන්‍යායට සහ අධර්මයට අයුවේ.

ගයත්‍රි යන වචනයේ නියම තේරුම කුමක්ද? කිසිවෙකුත් මෙකල එය දැනගැනීමට උත්සාහ කර ඇත්ද? දෙව්දුවක් හෝ නියමිත වචන මාලාවක් යන්න අදහස් කිරීමට එම වචනය ගැනේ. වාක් වලින් පටන්ගෙන ගය-ස් නොහොත් ප්‍රාන නොහොත් ඉන්ද්‍රිය ආරක්ෂා (ත්‍රා) කරන යතු ගයත්‍රිය වේ. ඒ හැර මෙසේද කියා තිබේ. 'ගායාන්තම් ත්‍රායතෙ යස්මාද් ගයත්‍රි, තෙන තත්‍යතෙ'. එනම් ගායනා කරන, ගරු කරන, නැවත නැවතත් කියවන, පිළිබඳව භාවනා කරන අයවලුන් ගලවාගනු ලබන දෙය ගයත්‍රිය වේ. විශ්වාමිත්‍ර වැනි රාජර්ෂි වරයෙකු බ්‍රහ්මර්ෂි බවට පත් කරන ලද්දේ මෙම පූජනීය මන්ත්‍රය වේ. වේද මාතාව, එනම් මව වන වේදයද ඇයට පුදපූජා පවත්වන්නවුනට ප්‍රසාදය දක්වන්නීය. එම දෙව්දුව පිළිබඳව බ්‍රාහ්මණයන්හි සහ ධර්මසූත්‍රයන්හි ශ්‍රේෂ්ඨ භාෂාවෙන් සවිස්තරව දක්වා ඇත. ඔබ මේවා පැහැදිලිව අවබෝධ කරගන්නේ නම් උදව්වක් නොමැතිව එය ප්‍රත්‍යක්ෂ වශයෙන් දැනගත හැක.

එවැනි ගැඹුරු ගුප්ත කරුණු වලින් යුක්තවූ ධර්මය, මෙකල උවමනාවෙන්ම හේතු මවමින් අර්ථකථනය කර ඇත්තේ නොයෙක් පහත් හැඟීම් වලිනි. ධර්මයේ පරිහානියට හේතු වී ඇත්තේ ඒ නිසාය. එම නිසා, සනාථන ධර්මය සහ ධර්මයේ පදනම වන ආත්මික සත්‍යයට අව්‍යාජ වන අර්ථකථන මූලධර්මයන්ට නව පනක් දීම අත්‍යවශ්‍යය. එසේ නොවූ විට හඳුනාගත නොහැකි තරමටම අර්ථය වෙනස් වන අතර පුද්ගලයින්ගේ හිතුවක්කාර අදහස් පවතිනු ඇත. සෑම ක්‍රියාවකම ස්වභාවය කුමක් වුවත් එය ධර්මය ලෙස මුද්‍රා තැබේ.



# අටවෙනි පරිච්ඡේදය

මිනිසාගේ ජීවිතය හසුරුවන ආශ්‍රම හතරකි. බ්‍රහ්මචර්‍ය්‍යා, ගෘහස්ථ, වනප්‍රස්ථ හා සන්‍යාස. මේ සියල්ලටම පදනම වී ඇත්තේ ගෘහස්ථාශ්‍රමය වේ. එය අනෙක් ආශ්‍රමය වනුයේ අනෙකුත් තුනටම ගෘහස්ථ ආධාර වන නිසාය. සියල්ලන්ටම වඩා වැදගත් වනුයේ ගෘහස්ථ වේ.

සියලුම ජීවීන්ගේ පැවැත්ම වාතය මත රඳා පවත්නා සේම, අනෙකුත් ආශ්‍රම තුනම ගෘහස්ථ මත රඳා පවතී. ගෘහස්ථ අනෙක්වා පෝෂණය කිරීම හා ඒවාට පිළි පැළඳවීම කරනවා පමණක් නොව, වේදයන් අධ්‍යයනය කිරීම සඳහා පහසුකම් ඇති කිරීමද කරයි. මෙම කාරණය මනු විසින් ඔහුගේ ධර්ම ශාස්ත්‍රයන්හි අවධාරණයෙන් ඉතා පැහැදිලිව දක්වා තිබේ. ගෘහස්ථටද මෝක්ෂයට පත්විය හැකි බව ඔහු ප්‍රකාශ කර ඇත. ඒ සඳහා අවශ්‍ය වනුයේ ඔහුගේ ආශ්‍රමයට නියම කර ඇති ධර්මය ඉතා නිවැරදිව අනුගමනය කිරීමය. සෑම අනෙකුම කුමන ආශ්‍රමයකට අයත් වුවද, එම ආශ්‍රමයේ ධර්මය කෙරෙහි ස්ථිරව සිටින්නේ නම් නිසැකයෙන්ම ඔහු මෝක්ෂයට පත් වන්නේය.

ධර්මය කෙරෙහි ස්ථිරව සිටින ගෘහස්ථ උසස්ම වර්ගයේ මිනිසා වන බව මහාභාරතයෙහිද, නරදපරිව්‍රාජකෝපනිෂද්හි සහ වෙනත් එවැනි ග්‍රන්ථයන්හි සමහර ශාස්ත්‍රවන්හි සඳහන් කර ඇති අතර, සියලුම දෙය අත්හල ප්‍රාඥයින් පමණක් මිදීමට සුදුසු බව වෙනත් ග්‍රන්ථයන්හි සඳහන් කර ඇත. එම නිසා, සියල්ලෙහිම පදනම හා ආධාරකය වන ගෘහස්ථාශ්‍රමය යොදාගත හැක්කේද නැතහොත් සියල්ල විශ්වයේම බුහුමන ලබන නිවිරිත්ති මාර්ගය වන සන්‍යාස ආශ්‍රමයෙහි වෙසීම සුදුසුද යන්න පිළිබඳව සැකයක් පැන නැගීමට ඉඩ ඇත. පිදීමට සුදුසු ගෘහස්ථ සහ අධි භක්තිමත් පරමහංස අතර ආත්මීය සම්බන්ධයක් තිබේ. එම නිසා ඔබ කුමන ආශ්‍රමයකට අයත් වුවද ඔබ අතින් වැරදි නොකෙරේ. ඔබ එක් ආශ්‍රමය සඳහා නියම කර ඇති ධර්මය ඔබ විසින් නිවැරදිව අනුගමනය කරමින් ඔබගේ අභිවෘද්ධිය සඳහා දැඩි කැපවීමකින් කටයුතු කලහොත් ආශ්‍රමයන් ඔබව මෝක්ෂය නොහොත් විමුක්තිය කරා යොමු කරවන්නේය. එක් එක් ආශ්‍රමය ඒ ඒ අවස්ථාවේදී වැදගත් වේ. අවශ්‍ය විමර්ශනය නම් පුද්ගලයාගේ හැසිරීම, ඔහුගේ ක්‍රියා මාර්ගය වේ. යමෙකු සදාචාරයෙහි යෙදී සිටින්නේ නම් සෑම ආශ්‍රමයක්ම පූජනීය වේ. සෑම ආශ්‍රමයක්ම ප්‍රශංසනීය වේ. ශාස්ත්‍රයන්හි නිගමනය එයයි.

සමන්ගේ මූලික සත්‍යය වශයෙන් ආත්ම ඥානයෙන් එනම් ආත්මය පිළිබඳ දැනීමෙන් සම්පන්න වූ අය උත්පත්තිය හා මරණය නමැති සාගරය තරණය කොට නිසැකයෙන්ම විමුක්තිය කරා පැමිණේ. අනෙක් අතට, තමන්ට නියම

කර ඇති හාරහාර සහ ආගමික චාරිත්‍ර විධි පිළිබඳව නොදැන, වේදයන් උපනිෂද් හා ගීතාව අධ්‍යයනය කර නොමැතිව බාහිර පිරිසිදු කමින් හ පෙනුමෙන් පමණක් සැහීමට පත්වන්නවුන් නිසැකයෙන්ම දුකට භාජනය වෙති

විනයන් අතර නිත්‍යානුෂ්ඨාන නොහොත් දිනපතා යෙදී සිටීම සඳහා නිය කර ඇති ආගමික චාරිත්‍ර හා හාරහාර වීම් ඉතා වැදගත් වේ. ඉහළම තප ඉහළම ධර්මය එයයි. මෙම කාරණය පිළිබඳව, සියලුම උපනිෂද්හි හරය ව ගීතාවෙහි කියා ඇති දෙයට ඔබ සැලකිල්ල දක්වා ඇත්ද? ආධ්‍යාත්මි ක්ෂෙත්‍රයෙහි ක්‍රියාශීලි වන අය, ඔවුන් කුමන ආශ්‍රමයක සිටියද, ඔවුන්ගේ කුලය කුමක් වුවද, දෙවියන් වෙතට පැමිණෙනු ඇත. මනු විසින් කියනුයේ එයයි. "ඔවුහු විඥාන සම්පන්න වෙති" සියලුම ආශාවන්ගෙන් මුක්ත, ඉන්ද්‍රි සම්බන්ධවූ ලෝකය හිමිකර ගැනීමට හෝ ඉන් ප්‍රයෝජන ලැබීම සඳහා සු හෝ ආශාවන් නැති, මමත්වයට හෝ යම් යම් දේ හිමිකර ගැනීමට ආශා නොමැතිව සැම විටම බ්‍රහ්මම් පිළිබඳව සිතීමේ ප්‍රමෝදයෙන් සිටින තැනැත්ත අල්පමාත්‍ර දුකකින් වුවද ඇත් වන්නේය, ඔහු උත්තරීතර ප්‍රීතියෙන් හ ශාන්තියෙන් යුක්ත වන්නේය. මිනිසා ඔහුගේ අවසාන අවස්ථාවේදීවත් ඔහුගේ මූලික ස්වභාවය වන බ්‍රහ්මන් පිළිබඳව තම බුද්ධිය යොමු කරන්නේ න සැකයක් නොමැතිව සාර්ථකව ඔහුට එය හා එක්විය හැක.

එවැනි පුද්ගලයින්ට "ස්ථිරප්‍රඥා" තත්ත්වය නිත්‍ය වශයෙන්ම ස්වාභාවි වන්නේය. මිනිසාගේ සියලුම ආපදාවන්ට "මම බ්‍රහ්මන් වෙමි" යන නිත්‍ය හැඟී සව් රෝග නාශකය වන්නේය. මෙම "අහම් බ්‍රහ්මාස්මි" යන හැඟීම තුළින් විමුක්තිය උදාවේ. එම හැඟීම වර්ධනය කොට අත්දැකීම ලැබීම මිනිසාගේ නියම යුතුකම වන්නේය. කුසිත නොහොත් 'ජව' මූලධර්මයෙන් පොළඹවන ල අඥානී පුද්ගලයා ශරීරය ඔහු බව විශ්වාස කරයි. සුළු තර්ක කිරීමක් හ විමසීමක් කළ හැකි පණ්ඩිතයාට ශරීරයෙහි ජීවියා "මම" යයි හැඟේ. නමු අනාත්මය ආත්මයෙන් වෙන්වන බව දනහැකි ප්‍රඥාසම්පන්න වූවෝ "අහ බ්‍රහ්මාස්මි" යන්න සත්‍යය බව දකිති. එම පිළිගැනීමෙන් ඔවුහු බැහැරව නොය

"බ්‍රාහ්මණ" වැනි කුලද, සුදු සහ කළු වැනි වර්ණද, බ්‍රහ්මචර්ය වැනි ආශ්‍රම යනාදී මේ සියල්ලම ශාරීරික තත්ත්වයන්ය, ඒවා ආත්මයට ආවේණි ගුණාංගයන් නොවේ. ඒවා අවස්ථාව හා තත්ත්වය අනුව නියම කර ඇ ඒවා බන්ධන සහිත මෙම ලෝකයට අයත් වන අතර එම ලෝකයට සම්බන් කාරණා විසින් පාලනය වන්නේය. ඒවා ලෝකයේ නිසි පැවැත්ම සඳහා දේ කැමැත්ත විසින් නියම කර ඇත. ලෞකික සීමාවන්ගෙන් බැඳුනු සැ තැනැත්තෙකු විසින්ම ඒවා පිළිපැදිය යුතුය. සීමාවන්ට හා ව්‍යාප්තවීම් වල සම්බන්ධ නොවූ අයවළුන්ට, එනම් ලෞකික බැඳීම් ඉක්මවා ගිය අයවළුන් ඒවා වැදගත් නොවේ. බ්‍රහ්මනිෂ්ඨයෙහි යෙදී සිටින, මූලික සත්‍යය ග්‍රහණ



රගත් අය ඒවා එපමණ පිළිනොපදිනුයේ එහෙයිනි. ඔවුහු කුලයකට බැඳී ැත. සියලුම දෙය මූලික සත්‍යය වශයෙන්ම ඔවුහු දකිති. එසේ නම් කුලය ශයෙන් සැලකෙන දෙයට ඔවුහු කෙසේ සැලකිල්ල දක්වන්නේද? නමුත් එම වස්ථාවට පත් වන තෙක් විශේෂත්වයක් නොමැතිව කුලයේ සහ ආශ්‍රමයේ ගමයන් පිළිපැදිය යුතුය. "ශරීර සචේතනික" අය සඳහා වූ ධර්මය - දේහ ර්මය මෙය වේ.

ආත්ම ධර්මය වටහාගත් මහා සාෂීන් සත්, චිත්, ආනන්ද යනු ආත්මයේ මූලික ලක්ෂණ බව ප්‍රකාශ කළහ. එම නිසා සත්, චිත්, ආනන්ද වන බ්‍රහ්මන් ත්ත්වයට එම මහා ඥානීන් පත්ව ඇති බව සඳහන් කළ හැක. ආත්මය ගීම සඳහා වූ දෘෂ්ටියෙහි නිර්මලත්වයම විමුක්තිය සඳහා සැහේ. අවශ්‍ය දෙය යයි, කුලය හෝ වර්ණය නොවේ. එම නිර්මල දෘෂ්ටිය ලබාගත හැක්කේ කෙසේද? පිළිතුර නම්, ධර්මය එනම් කුලය සහ ආශ්‍රමය විසින් යෝග්‍යයැයි ා ඇති ධර්මය, පුහුණු කිරීමෙනි. දර්ශනය වසා සිටින නොපැහැදිලි තත්ත්වය ා අවුල නොමැතිව ආත්මය අවබෝධ කර ගැනීම සඳහා ධර්මය උපකාරී වේ. ර්මය අනුව ක්‍රියා කිරීමේදී ඔබ පලපුරුද්දෙන් පරිපූර්ණ වේ. එම පලපුරුද්දෙන් ත්‍යය තහවුරු වේ. සත්‍යය පැහැදිලිව අනාවරණය වී දෘෂ්ටිය විසින් විමුක්තිය ාදේ. ආත්මය වසන් කෙරෙන එවැනි අභ්‍යන්තරික බාධාවන්ගෙන් තොර පුද්ගලයින් කුමන කුලයකට හෝ ආශ්‍රමයකට හෝ අයත් වුවද, ඉන් ඇති ාරියක් නැත. ඔවුහු විමුක්තියට පත් වෙති. ගැලවීම පිළිබඳව කථා කරන ව ශාස්ත්‍රයන්හි බොහෝසේ වර්ණනා කරනුයේ මෙම අන්තඃකරණ සුධී වේ.

බැඳීම් හා වෛරය ඇති අයට, වනයේ ජීවත් වුවද උපද්‍රවයන්ගෙන් ගැලවීමට නොහැක. ඉන්ද්‍රියයන් ශාලනය කළවුන් ගෘහයෙහි වාසය කළද ඔවුන්ට ගෙවීන් විය හැක. හානිකර හෝ සදොස් නොවන ක්‍රියාවන්හි යෙදෙන්නේ ම් ඔවුන් ඥානීන් වශයෙන් හැඳින්වීම සුදුසුය. බැඳීම් වලින් මිදීමේ තත්ත්වයට ැවීම සඳහා නිවස තපෝ වනය වන්නේය. දරුමුණුබුරන් ඇති කිරීමෙන් ෝ පිනට දීමෙන් හෝ ධනයෙන් හෝ යාඥාවන්ගෙන් හෝ යෝගයෙන් හෝ විමුක්තිය දිනාගත නොහැක. විමුක්තිය සඳහා අවශ්‍ය වනුයේ තමා පරිශුද්ධ ීමය.

වැරදි සහ වැරදි ක්‍රියාවන් කවරේද යන්න තීරණය කිරීම සඳහා ාස්ත්‍රයන් පමණක්ම සාක්ෂ්‍යය වේ. ජීවිතයේ අවස්ථාව කුමක් වුවද, ආශ්‍රමය මක් වුවද, යමෙකුට බ්‍රහ්මන් ප්‍රත්‍යක්ෂ කිරීම අභිමතාර්ථය ලෙස ඇත්තේ ම්ද, ස්වස්වරූප, එනම් තමාගේ නියම ස්වභාවය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට ත් කරන්නේ නම්ද, එම පුද්ගලයාට අවිද්‍යාවෙහි තිරය ඉවත් කිරීමට හැකි න අතර තමා බ්‍රහ්මන් බව අවබෝධ වේ. තමාගේ ආත්මය කෙරෙහි අවධානය ා ගැනීම විමුක්තියේ මාර්ගය වේ.

වේදයන් විසින් දෙනු ලබන මෙම ගුරුකම අවබෝධකොට, ජීවිතයේ යම්කි අවස්ථාවක් සඳහා නියම කර ඇති ප්‍රතිපත්තින් අනුව ක්‍රියා කරමින් ඕනෑ කෙනෙකුට, කුමන කුලයකට අයත් වුවද, උත්තරීතර ස්ථානයට, එනම් පරමපා තත්ත්වයට පත්විය හැක. ධර්මයට තදින්ම ඇලී සිටීම සඳහා යමෙකු අධිෂ්ඨානය සහ ශක්තිය ඇත්නම්ද, ඥානය ලබාගැනීමට අපහසුවක් නොමැත් නම්ද, එවැන්නාට සන්‍යාස ආශ්‍රමයට ඇතුළු නොවී ගෘහස්ථයෙකු වශයෙ සිටිමින් වුවද විමුක්තිය ලබාගත හැක.

ජනකචක්‍රවර්ති, අශ්වපති, දිලීප වැනි රාජඍෂිහුද ගෘහස්ථ තත්ත්වයෙ සිටිමින් අභිමතාර්ථය ඉටු කරගත්හ. එම තත්ත්වයේදී දෙවියන්ගේ අනුග්‍රහ දිනා ගැනීම සඳහා ඔවුහු මහත් පරිශ්‍රම දරා අවහිරයන්වූ සියලුම බාධ ඉවත් කිරීමෙහි සාර්ථක වූහ. ඔවුන් විසින් ඉටුකරගත යුතුවූ අභිමතාර්ථ වූයේ දේවත්වයට පත්වීමය. එම නිසා සැක නොසිතන්න. ගෘහස්ථාශ්‍රම බාධාවක් නොවේ.

සංසාර සාගරය තරණය කිරීමේ ආශාවෙන් පොළඹවන ලද වි ස්වාමිපුරුෂයා සහ භාර්යාව යන දෙදෙනාගේ සිත්තුළ එකඟතාවය ඇතිකරග යුතුය. අභිමතාර්ථය කරා යාමේ අධිෂ්ඨානය දෙදෙනා තුළම ශක්තිමත් ස්ථිර විය යුතුය. නැතහොත් පිහිටවනුයේ සන්‍යාස තත්ත්වය වේ. බලන් මධ්‍යාහ්න සූර්යයාද ජායාව නමැති සහකාරියට සම්බන්ධව සිටින්නේය. ක දහසයකින් යුත් චන්ද්‍රයාද, අමෘතය මෙන් වූ සිසිල් කිරණට සම්බන්ධව ඇ නිවසේ ස්වාමිදුවද ප්‍රීති සහගත, ඉවසන සුළු, සංසුන් හා යහපත් විය යු අතර සියලුම සදාචාරයන්ගෙන් යුක්ත විය යුතුය. එවිට එම නිවස ආධ්‍යාත්මි ක්ෂේත්‍රයේද ජයග්‍රාහී නිවසක් වශයෙන් බැබලෙන්නේය.

තම නිවසේදී, ආධ්‍යාත්මික ක්ෂේත්‍රයේ දුෂ්කරතාවයන්ට යමෙකු මුහුණ දු විට සන්‍යාස තත්ත්වය ලබා පැන යා යුතුයයි නියමයක් නැත. බිරිඳගේ සම්පූර්ණ අනුමැතිය නොමැතිව ස්වාමිපුරුෂයෙකු එසේ කළහොත් එ කෙසේවත් ඵලදායී නොවේ. ඔහුට කළහැකි සුදුසුම දෙයනම් බිරිඳද සම නිවස අතහැර ගොස් වනප්‍රස්ථව, එම නව තත්ත්වයෙහි ධර්මය පිළිපදිමි සිටීමය. සැලකුම් ලැබීම සහ රැකබලා ගැනීම අවශ්‍ය දරුවන් සිටින්නේ න එවිටද වනප්‍රස්ථ වීම ශාස්ත්‍රයන්හි අනුමත කර නැත.

දරුවන් තම ආරක්ෂාවෙන් නිදහස් කොට ඔවුන්ට ඔවුන් විසින්ම ජීව වීමට ඉඩහැරිය යුතුය. එමනිසා සුදුසු වුවද නුසුදුසු වුවද, පුද්ගලයෙකු වය 48 වන තෙක් ගෘහස්ථයෙකු වශයෙන් සිටිය යුතු බව ශාස්ත්‍රයන්හි නියම වේ. එසේ සිටිමින්, අවහිරයක් නොමැතිව පරිශ්‍රමයෙන් ස්වධර්ම ඉටුකළ යුතු අවහිර පැමිණියහොත් ඒවාද දෙවියන්ට කැප කොට එම අවහිරකම් දෙවියන් රංගනයක් හා සැලසුමක් ලෙස සන්සුන්ව පිළිගන්න. පිරිමින් හා කාන්තාව යන දෙපාර්ශ්වය විසින්ම යායුතු මග වන ගෘහස්ථ විනය අනුගමනය කිරී වන්නේ එයයි.



# නවවෙනි පරිච්ඡේදය

උසස් සහ පහත්, ධනවත් සහ දුප්පත්, ස්ත්‍රී සහ පුරුෂ යන සියල්ලෝම රෝගයන්ට භාජනය වෙති. එම රෝගයන් සුවකර ගැනීම සඳහා බෙහෙත් ගැනීමට සියල්ලන්ටම අයිතියක් ඇත. එමෙන්ම, සියලුම පුද්ගලයෝද උත්පත්තිය සහ මරණය යන රෝගයෙන් පෙළෙන අතර, බ්‍රහ්මවිද්‍යා නමැති සඵල ප්‍රතිකාරය ගැනීමට සියලු දෙනාටම අයිතියක් ඇත. සියල්ලන්ගේම උරුමය එයයි. ආධ්‍යාත්මික පුහුණුවේදි එක් එක් පුද්ගලයා පත් තත්ත්වය හා දියුණුවූ ප්‍රමාණය අනුවද, බෙහෙත උරාගන්නා ප්‍රමාණය අනුවද "ඒ ඒ පුද්ගලයන් නිරෝගී කමින් එනම්, ශාන්තියෙන් හා සමචිත්තතාවයෙන් දියුණු වේ. නමුත් එක් කාරණයක් මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතුය. බෙහෙත සමඟ දිවි පැවැත්මේ ක්‍රමයද තදින්ම අනුගමනය කළ යුතුය.

බ්‍රහ්ම විඥානය නමැති බෙහෙතට යෝග්‍ය ධර්මයන්ගෙන් සහ භක්තිය, අවබෝධ ඥානය සහ විරාගයද දියුණු කිරීමෙන් රුකුල් දී එය ශක්තිමත් කළ යුතුය. රෝගයන්ට ප්‍රතිකාර කිරීමේදී අවශ්‍ය වනුයේ ආහාර හා වෙනත් දේ සීමා කිරීමය. බ්‍රහ්මඥානය තුළට ප්‍රවේශය පමණක් නොසෑහේ. සම, දම හා වෙනත් යහපත් හා ආධ්‍යාත්මික ශ්‍රේෂ්ඨ භාවයන් නොමැතිව, යමෙකු අධිරාජයෙකු හෝ දාසයකු හෝ වුවද, උසස් හෝ පහත් උත්පත්තියක් තිබුණද අරමුණ කරා යා නොහැක. සෑම කෙනෙකුටම බ්‍රහ්මවිද්‍යාවට උරුම හිමිකම් තිබුණද එය ලබාගත හැක්කේ ඒ සඳහා සුදුසුකම් වලින් සැදී අයට පමණි. ප්‍රතිකාරයන් දරාගැනීමට හා බෙහෙත් ශරීරයට ජීර්ණකර උරා ගැනීමට පුද්ගලයෙකු ශක්තිමත් විය යුතුය. එසේ නොවේද? එම ශක්තිය නොමැති වූ විට රෝගියාට බෙහෙත් ගැනීමට නැකි බවට මහා වෛද්‍යවරයා විසින් සහතික නොකරනු ඇත. රෝගියාගේ තත්ත්වය දුටුවිට ඔහුට බෙහෙත් අත්‍යවශ්‍ය බව හා ඒ සඳහා වියදම් දැරීමට නොහැකි බව සමහර වෛද්‍යවරුනට හැඟුණු විට බෙහෙත් වගී නොමිලයේ දෙනු ලැබේ. සියල්ලන්ටම වඩා උසස් වෛද්‍යවරයා වූ දයාව හා කරුණාවේ නිදානය හා උල්පත වූද දෙවියන් ගැන කියනුම කෙසේද? ශක්තිය හා අවශ්‍යතාවය ගැන සලකා බලන දෙවියෝ බෙහෙත ලබා දීමට පිළියෙල කරන්නාහ.

දැන් එක ගැටළුවක් පැන නගී, කාන්තාවෝ බ්‍රහ්ම විද්‍යා ලබාගැනීම සඳහා උත්සාහ කිරීමට සුදුසුසෝ වෙත්ද? මෙම පැනයට දැනටමත් පිළිතුරු සපයා ඇත. මෙම අවබෝධය ලබාගැනීමට කාන්තාවන් නුසුදුසු වන්නේ නම්, ගීතාවේ ඇති ගුප්ත දේ භූදේවියට විෂ්ණුමූර්ති විසින් උගන්වන ලද්දේ කෙසේද? පරමේශ්වර විසින් ගුරුගීතාව පාර්වතියට උගන්වන ලද්දේ කෙසේද? සාකච්ඡාවන්ට සහභාගීව කරුණු පැහැදිලි කරගැනීම සඳහා ධර සහ පාවිනි

විසින් ප්‍රශ්න ඉදිරිපත් කළ බව "ධරොවාව" සහ "පාර්වතුවාව" යන ප්‍රකාශ වලින් පෙනේ. ඊශ්වර විසින් ආචිතියට යෝග ශාස්ත්‍ර හා මන්ත්‍ර ශාස්ත්‍ර යන දෙකම උගන්වන ලදී. එම නිසා ශාස්ත්‍රයන් විසින් අනුමත කරන ලද මෙය නිවැරදි විය යුතුය. එසේ නොවේද? යාඥවල්ක්‍ය විසින් මෛත්‍රේයට බ්‍රහ්මවිද්‍යා ඉගැන්වූ බවට බෘහදාරන්‍යක උපනිෂද්හි සඳහන්ව ඇත. වේදය කොටස් දෙකකින් යුක්තය. නුගත් අඥානයාට කර්මකාණ්ඩද, විඥානියාට ඥානකාණ්ඩද වශයෙනි. ශාස්ත්‍රයන් පමණක් ගැන සලකා බැලීමේදී ඒවාටද කොටස් දෙකක් ඇත්තේය. ආත්මඥාන අත්දැකීම තුලින් පැහැදිලි කෙරෙන උගතුන්ගේ භාෂිතය හා බුද්ධිමතුන්ගේ භාෂිතය වේ. මේවායින්, බ්‍රහ්මන් හා ආත්මය කුමක්ද යන බව අවබෝධ කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් "කරන්නා" යන අදහස අත්හැරි අයගේ වචනද, ජීවිතයේ විවිධත්වයෙහි එකම ආත්මය අන්තර්ගත බව දන්නා හා වැටහුනු, මගේ සහ ඔබගේ යන්නෙහි වෙනස අත්හල, සියලුම සජීවී හා අජීවී නිර්මානයන්හි ශුභසිද්ධිය අපේක්ෂා කරන්නාවූ, ආත්මය ගැන පමණක් දැන සිටින්නාවූ අයගේ වචනද සත්‍ය හා වටනා වේ.

බෘහදාරන්‍යකයෙහි ගර්ගි හා මෛත්‍රෙයිද, මහාභරතයෙහි සුලභා සහ යෝගිනිද යන කාන්තිමත් ප්‍රඥාවන්තියන් ගැන සඳහන් වේ. කාන්තාවන් ඔවුන්ගේ සදාචාරය පිළිබඳ අවංක භාවයෙන් හා අවපලත්වයෙන් ප්‍රබෝධමත් වී එම මාර්ගයෙහි ගමන් කළ යුතුය. එම උසස් තත්ත්වයට පත්වීම උදාවනුයේ එවිට පමණි. ගෘහස්තාශ්‍රමයෙහි සිටිමින්ම චූදලා, මදලස හා ඔවුන් වැනි වෙනත් කාන්තාවෝ බ්‍රහ්මඥානය ලබාගත්හ. ආධ්‍යාත්මික විනය තුලින් කාන්තාවන් හට ස්ථිර අසම සමවූ මංගල්‍ය බ්‍රහ්මන් තත්ත්වයට එළඹිය හැක. මේ බව යෝගාවශිෂ්ඨයෙහි හා පුරාණයන්හි පැහැදිලි කර ඇත. ශාස්ත්‍රයන් නිසි පරිදි අධ්‍යයනය නොකළවුන් පමණක් සැකයෙන් පසුවෙති. කාන්තාවන් අතරවූ ආධුනිකයන්, ගෘහස්ථයන්, වෛරාගීන් ඔවුන්ගේ පිරිසිදු හදවත් හා පූජනීය හැසිරීම් තුලින් අභිමතය ඉටු කරගත්හ. මෙම දෙක ලබාගැනීමට සියලුම කාන්තාවන් උත්සාහ කළ යුතුය.

"ආචාර්‍ය නොහොත් ආධ්‍යාත්මික මගපෙන්වන්නා කලාවන් හා විද්‍යාවන් උගන්වන ගුරුවරයාට වඩා දස ගුණයක් වටිනේය. පියා ආචාර්යවරයාට වඩා දස ගුණයක් වටනේය. මව පියාට වඩා දහස් ගුණයක් වටනේය." මනුස්මෘතියෙහි මනුගේ ප්‍රකාශය මෙයයි. සියලුම ධර්ම ශාස්ත්‍රයන් එකට බැඳ තබන ග්‍රන්ථය එම ස්මෘතියයි. මූලික පදනම එයයි. මවට කොතරම් බුහුමනක් එහි පුදකර ඇත්තේදැයි බලන්න. ධනයෙහි ආරක්ෂකයා වන ලක්ෂ්මී ස්ත්‍රී දෙවියෙකි. කාන්තාවන්ට ලියුම් ලිවීමේදී "සෑම අයුරකින්ම ලක්ෂ්මීයට සමාන ......... ට" යනුවෙන් පටන් ගැනීම සිරිතකි. කාන්තාවෝ විශාල සම්මාන ලැබීමට සුදුස්සෝය. දේව ශක්තියේ හේතුවෙන් රාමා, ක්‍රිෂ්ණා ලෙසින්ද, ශංකර, රාමනුජ සහ මාධ්ව වැනි ආගමික ගුරුන්ද, බුදුන්වහන්සේ, ජේසුස් ක්‍රිස්තුස් සහ මහම්මත් තුමා වැනි ප්‍රඥාවන්තයින්ද යන සියල්ලෝම කාන්තාවන්ගෙන් උපත



ලැබුවෝ නොවෙත්ද? මේ සියල්ලන්ගේම මවුවරු පුණ්‍ය මහිමයේ මූර්තීන් වූ අතර ලෝකය පරිවර්තනයට භාජනය කළ පුතුන් බිහිකලෝ වූහ. ඔවුන්ගේ අඩිපාරේ යමින්, පිරිසිදු පිදිය යුතු ජීවිත ගතකරන කාන්තාවනට බ්‍රහ්මඥානය ලබාගැනීමට අයිතියක් ඇති අතර එය කිසි කෙනෙකුට වැළැක්විය නොහැක.

ඇත්ත වශයෙන් කියතොත් ආත්මය කාන්තාවන් හා පිරිමින් අතරෙහි ඇත්තාවූ සියලුම වෙනස්කම් වලින් තොරය. එය නිත්‍ය, ශුද්ධ, බුද්ධ, ස්වයම්ජ්‍යෝති වේ. එනම් එය සදාකාලික, නිර්මල චෛතන්‍යයම වන්නේය. එය ස්වයං දීප්තියය. කාන්තාවන්ට පෙරකී පූජනීය කාන්තාවන්ගේ තත්ත්වයට පත්විය හැක්කේ ඔවුන්ට ආත්මය පිළිබඳව දැනුම ඇත්තේනම් පමණි.

විද්‍යාවෙහි (සරස්වතී) ධනයෙහි (ලක්ෂ්මී) සහ ප්‍රඥාවෙහි (පාර්වතී) ආරක්ෂක දෙවිවරු සියල්ලෝම කාන්තාවෝය. එම නිසා කාන්තාවන්ට බ්‍රහ්මන් සමග සම්බන්ධවීම සඳහාවූ ආධ්‍යාත්මික පුහුණුවටද අවසාන මිදීම සඳහාද අයිතියක් නැතිය යන්න විශ්වාස කළ නොහැක. නිදා සිටින සිංහයෙකුට උගේ ස්වභාවය ගැන අමතකය. එමෙන්ම මායාව නමැති වෙලීම් තුළ නිදා සිටින මිනිසාට ඔහුගේ අලංකාරවත් ආත්මය ගැන පරීක්ෂාකාරී බවක් නැත. මෙම අවිද්‍යා අවධියෙහි ඔහු වධාත්ම ඔප් නංවා ගනුයේ අගතින් වන අතර ඔහු රුචි දෙයට ශාස්ත්‍රයන්හි මුද්‍රාව තබාගනී. ශාස්ත්‍රයන් කිසි කලෙක එසේ ප්‍රකාශ කරන්නේ නැත.

මිනිසාට ශාස්ත්‍ර නේත්‍ර වේ. එය මගපෙන්වන, පැහැදිලි කරන, හසුරුවන අක්ෂිය වේ. එහි උපදේශයන් පිළිපදින්න-මිනිසාගේ සම්පූර්ණ යුතුකම එයයි. අද ලෝකය හමුවේ ඇති විශාලම කාර්යය එයයි. ශාස්ත්‍රයන් සම්පූර්ණයෙන් වටහාගත්තේ නම් සැකයක් පැන නොනගී. සාකච්ඡා අවශ්‍ය නොවේ.

ඔබට හිතකර දෙය තෝරාගෙන ඒවා ශාස්ත්‍රයන් මත යෙදීම නොකළයුතුවාත් හැර ශාස්ත්‍රයන්හි නියමයන් වලට විරුද්ධව නොයා යුතුය. ඒවායේ බලයට අභියෝග කිරීම හා ඒවායේ නියමයන් පිළිබඳව සුළුවෙන් කථා කිරීමද පාපකාරී වේ. ලෝකය මෙම කණගාටුදායක අවස්ථාවට පත්ව ඇත්තේ ප්‍රධාන වශයෙන් ශාස්ත්‍රයන් අනුගමනය කිරීම නොසලකා ඇති හෙයිනි. දුඃඛදායක තත්ත්වය, යහපත බිඳවැටීම එයයි.

මොක්ෂයට පත්වීමට අපේක්ෂා කරන්නන්, චරිතය උසස් බවට පත්කරගැනීම සඳහාද හැඟීම් කැප කිරීම සඳහාද ශාස්ත්‍රයන්හි කර ඇති නියමයන් හා සීමාවන් අනුව කටයුතු කළ යුතුය. බ්‍රහ්මඥානයෙහි මෙම මිදීමේ ප්‍රමාණය හීන වූ විට, වෙහෙස මහන්සියෙන් ශාස්ත්‍රයන් ප්‍රගුණ කිරීමෙන් ලබාගත්තා දැනීම වෙහෙසකර දෙයකි. එවැනි උගතුන්, පැණිරස හා ප්‍රණීත ආහාර අනුභූ ලබන මුත් ඒවායේ රස නොදන්නා හැන්ද මෙන් වේ. ශාස්ත්‍රයන්හි සාරය උරා නොගෙන, තමන්ගේ නොදැනීමද තිබියදී අනෙකුත් අයට මග පෙන්වන උගතුන් අන්ධයින්ට මග පෙන්වන අන්ධයින්ට සමාන බව මුණ්ඩකොපනිෂද්හි දක්වා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මග පෙන්වන්නා මෙන්ම මගපෙන්වීමට භාජනය වන්නාද ළිඳට වැටේ.

ශාස්ත්‍රයන් පිළිබඳ දැනීම නොමැති වුවද, ඔබට පලපුරුද්දෙන් හා අභ්‍යාසයෙන් ලබාගත් ඥානය තිබේනම් එමගින් අභිමතාර්ථය ඉටුකරගත හැකි අතර ඔබ හොඳින් දන්නා මාර්ගයෙහි අනෙකුත් අයද ගමන් කරවිය හැක. උදාසීනයන්ට ශාස්ත්‍රයන් අනවශ්‍යය. එමෙන්ම සෑම විටම කුමන තත්ත්වයක් යටතේ වුවද බ්‍රහ්මන් හා එම දිව්‍ය සැපතෙහි වූ රසයෙහි නිමග්න වී සිටින පූජනීය පුද්ගලයාටද ශාස්ත්‍රයන්හි අවශ්‍යතාවයක් නැත. ඇත්ත වශයෙන්ම, සත්‍යය කෙරෙහි ස්ථිරව සිටීම හා ධර්මය අනුව ක්‍රියා කිරීම සඳහා මහත් වෙහෙසක් දැරිය යුතු වුවද, අවසානයේ ඔබ බලාපොරොත්තු වන දිව්‍ය සැපත ගැන සිතා ඒ සියලුම වෙහෙස සතුටින් විඳ දරාගත යුතුය. සත්‍යය දැනගෙන ආරක්ෂා විය හැක්කේ බුද්ධිමතාට පමණි. අනෙක් අය බන්ධනයට හසුවූවෝ වෙති.

යුගයන් බෙදා ඇත්තේ ප්‍රබල මානසික ක්‍රියාකලාපයන් පදනම් කරගෙනය. ක්‍රිත යුගයෙහි ධර්මය සතුටින් හා තිරුපද්‍රිතව පාද සතරකින් එහා මෙහා ගිය බව කියති. ත්‍රේතා යුගයෙහි ධර්මයට තුබුනේ පාද තුනක් පමණක් වන අතර ද්‍වාපර යුගයෙහි ධර්මයට එහා මෙහා යාහැකි වූයේ පාද දෙකකිනි. මෙම සම්ප්‍රදායට අනුව වර්තමාන කලියුගයෙහි ධර්මයට ඇත්තේ එක් පාදයක් පමණි. සිව් පාද නම් සත්‍ය, දයා, තපස් හා දානය වෙති. යමෙකුට මේ හතරම ඇත්තේ නම් ලිනෙහි සඳහන් යුගය කුමක් වුවද ඔහු ක්‍රිත යුගයෙහි සිටින බව කිව හැක. සත්‍යය යමෙකු තුල ස්ථිරව නොපැවති අනෙක් ගුණයන් තුන ඇත්තේ නම් ඔහු සිටිනුයේ ත්‍රේතා යුගයෙහිය. සත්‍යය හා දයා නොමැතිව තපස් හා දාන පවතින්නේ නම් එවැනි පුද්ගලයින් ද්‍වාපර යුගයෙහි බව ප්‍රකාශ කළ හැක. එම හතරින් අනෙකුත් කරුණු නොමැතිව කෙනෙකුට දාන පමණක් ඇත්තේ නම්, ධර්මය එක් පාදයකින් පමණක් සිටින සේ වන අතර, කාල පිළිවෙල අනුව ඔහු ක්‍රිත යුගයේ සිටියද සිටිනුයේ කලියුගයෙහිය. යුගයන් වෙනස් වනුයේ කාලය ගමන් කිරීම නිසා නොව ධර්මය වෙනස් වීමෙනි. දුෂ්ට හිරණ්‍යකසිපු හා නිර්මල හදවතක් ඇති ප්‍රහ්ලාදද කාල පිළිවෙල අනුව වෙන්වූ එකම යුගයක ජීවත් වූහ. ධර්මිෂ්ඨත්වය හා ශාන්තිය දෘෂ්ඨාන්තව ධර්මජ වශයෙන් පෙනී සිටි එකම යුගයෙහි කපටි වංචාකාර දුර්යෝධනද සිටියේය. එමනිසා එක් එක් අයට යුග වශයෙන් ඇති වනුයේ ධර්මයයි. යමෙකුට ධර්මයේ සිව් ලක්ෂණයන්ම ඇත්තේ නම් ඔහුට ක්‍රිත යුගයෙහි සෑම විටම සිටිය හැක. ඉතිහාසය ඇති හෝ නැති කොට රන් යුගය යකඩ යුගයකට පෙරලනුයේද මිනිසාගේ හැසිරීම වේ.



# දහවෙනි පරිච්ඡේදය

මිලගට දේවත්වය මූර්තිමත් කරන රූපයේ නිවහන, දෙවියන්ගේ නිවස (ආලය නොහොත් මන්දිරය වශයෙන් හඳුන්වන) දේවාලය හා එයට අදාල ධර්ම රීති පිළිබඳවයි. නොයෙකුත් බලධාරීන්ගේ හිතුමතයන් හා අගතින් නිසා මෙම ආයතනයන්හි රීතින් අධික ලෙස වැඩිවී ඇති අතර, ඒවා අනිබවා වැඩී ගොස් එම ආයතන විනාශ කර ඇත. ඔවුන් ධර්මයෙන් හා බ්‍රහ්මන්ගෙන් මනක් නොව තිසි කර්මයන්ගෙන්ද මිනිසුන් ඈත් කර ඇත. ඔවුන්ගේ විවිධත්වය හා අයුක්ති සහගත බව නිසා බැතිමතුන් ව්‍යාකූල කර ඇත. ඔවුන්ට අන්ධත්වයෙන් ක්‍රියා කිරීමට බලකර ඇති නිසා ලෝකයේ ශුභසිද්ධියටද බොහෝ හානි සිදුකර ඇත. ඇත්ත වශයෙන්ම මෙම රීතීන් හා නිරර්ථක චාරිත්‍ර විධීන් දෙවියන් වෙතින් පසුබැස ඇත්වීමේ මුල් පියවර වන්නේය. ඒ නිසා නස්තික වාදය විශාල ලෙස පෝෂ්‍ය කොට ඇත.

දේවාලයේ කාර්යයන් පිළිබඳව ගැඹුරින් සිතා බලන්න. දේවාල, ආධ්‍යාත්මික අපේක්ෂකයින් පියවරෙන් පියවර සත්‍ය දර්ශනයට යොමු කරවන පුහුණු ආයතන වෙති. ඒවා ආත්මය පුහුණු කිරීමේ විද්‍යාලයයන්ය. ඒවා ශාස්ත්‍රයන් පිළිබඳ අධ්‍යයනයන් වැඩි දියුණු කරන විද්‍යා පීඨයන්ය. ඒවා සුපිරිවිද්‍යාවේ විද්‍යාස්ථානයන්ය. ඒවා ජීවිතයේ වටිනාකම් පරීක්ෂා කිරීමේ විද්‍යාගාරයන්ය. ඒවා පුද්ගලයා තුල කාලාන්තරයක් තිස්සේ පැවතෙන 'උත්පත්තිය - මරණය-ව්‍යාධිය' නමැති රෝගයට ප්‍රතිකාර කොට සුව කිරීමේ පමණක් නොව, ශාන්තිය ලබාගැනීමේ රහස නොදත් අයවලුන්ට කරදර පමුණුවන වඩාත්ම දරුණු 'මානසික ආබාධයන්' සුව කිරීමේද රෝහල්ය. ඒවා මිනිසාගේ අවිනිශ්චිත ශක්තිය, හීන වැටහීම සහ ඉහල යන මමත්වය යන දැ සුවකොට මිනිසා අභිවෘද්ධියා කොට සකස් කරන ව්‍යායාම් ශාලාවල්ය. ඒවා මිනිසාගේ සෞන්දර්යාත්මක තත්ත්වයන් හා සඵල බලාපොරොත්තු පිළිබිඹු කරන කැටපත්ය. දේවාලයේ අරමුණ වන්නේ මිනිසා ජීවත්වන මිනිස් ශරීරය දෙවියන්ගේ නිවහන බව විශ්වාස කිරීමට සැලැස්වීමෙන් මානවත්වයේ ඇති මානවත්වය-මිනිස්කමේ ඇති දේවත්වය-අවධි කිරීමට සැලැස්වීමය. එමනිසා සියලුම දේවාල චාරිත්‍ර විධි, පිළිවෙත් හා ආගමික චාරිත්‍ර මගින් ජීවියා ශරීරයේ රළක් පමණක්ය යන සත්‍යය වූ බ්‍රහ්මඥානය අවධාරණය කොට දක්වනු කෙරේ.

සියලුම ක්‍රියාවන් සහ ක්‍රියාකාරකම් අවසානයේ බැඳීම් නැති කිරීමට මග පෙන්විය යුතු බව මිනිසාට ශාස්ත්‍රයන්හි උගන්වනු ලැබේ. මේ ක්‍රමය බ්‍රහ්මඥානය ලබාගනය කර ගැනීම සඳහා වන හොඳම සුදුසුකම වන්නේය. භක්තිය, ඥානය සහ විරාගය යන තුනෙන් භක්තිය රජ බිසව වේ. රීතින් හා ආගමික චාරිත්‍ර

විධි සේවිකාවෝය. නිසැකයෙන්ම රජන කරුණාභරිත කල්පනාවෙන් හා ප්‍රසාදයෙන් සේවිකාවන්ට සලකන්නිය, සැකක් නැත. නමුත් "සේවිකාවන්" හා "උදව්කාරියන්" වන උත්සවයන් රජනව නොසලකා හරින්නේ නම්, ඔවුන් අනුකම්පා රහිතව සේවයෙන් පහකළ යුතුය. එමනිසා දේවාලයන්හි සියලුම නියමයන් හා ආගමික චාරිත්‍ර විධි භක්තිය නමැති රජනගේ ගෞරවයට දෙවැනි විය යුතුය. සියලුම දේවාලයන් හසුරුවා පාලනය කළයුතු ධර්මයෙහි සාරය එය වන්නේය. මිනිසාට අභිමතාර්ථය කරා යා හැක්කේ එවිට පමණි.

මිනිසාගේ මානසික කැලඹීම්ද, ඉන්ද්‍රිය විෂයවූ දෙයද, උද්වේගකර පෙළඹවීම්ද දෙවියන් වෙතට යොමු කිරීම තුළින් ඉතා ලෙහෙසියෙන්ම මූලික බ්‍රහ්මන් සමග එක්වීමේ ප්‍රීතිය ලබාගැනීමට භක්තිය වඩාත්ම උපකාරී වේ. දේවාලයන්හි දෙවියන් පිදීමේ කාර්යයෙහි ඇතුලත් සියල්ල නිර්මානය වූයේ මෙම දෙසටය. 'අළුයම් කාලයේ දෙවියන් අවදි කිරීමේ සිට රාත්‍රී කාලයේ සයනගත කිරීම' දක්වාවූ දේවාලවල විවිධ උත්සවයන්, සිතෙහි භක්ති නැම්ම වඩවන සේ සකස් වූ ඒවා වෙති. සෑම සිධියක්ම, යෝග්‍ය හැඟීම් විශේෂ රමණීයත්වයකින් උත්කෘෂ්ඨ බවට පත්කිරීම සඳහා පිළිවෙළින් උපකාරී වේ. එම අත්දැකීම් පිරිසිදු බවට පත් වන විට පහත් හැඟීම් වල කැලඹීම හිතවි අතුරුදන් වෙයි. සාමාන්‍ය ජීවිතයේ අසහ්‍ය හැඟීම් සවි බලධාරී දෙවියන්ට කරන වැඳීමක හා කැපවීමක තත්ත්වයට උසස් වන්නේය.

දෙවියන් සමඟ සම්බන්ධ වීම සඳහා, එක් එක් තැනැත්තා තුලවූ හැඟීම් දෙවියන් විසින් ප්‍රබෝධමත් කරන අතර දෙවියන් රාක්ෂයෙකු හෝ භූතයෙකු හෝ ලෙස සිතාගතහොත් ඔහු එවැන්නෙකු ලෙස බිය ඇති කරයි. දෙවියන් භූතනාථ (පංච මහා භූතයින්ගේ ස්වාමියා) වශයෙන් සිතා විශ්වාස කරන්නේ නම් ඔහු එලෙස මැවී පෙනේ. එසේ වන්නේ කෙසේදැයි සමහරවිට ඔබ අසනු ඇත.

මෙකල උපදෙස් බෙදා හැරීම විලාසිතාවක් වී ඇත. දැනුම ඇත්තවුන් හා නැත්තවුන් යෙදී සිටින විලාසිතාවකි. උපදෙස් පිළිපදින්නේද නැද්ද යන්න ගැන ඔවුහු නොසලකති. මෙම උපදෙස් දීම නමැති උසස් ආකල්පයට මිනිසුන් පතිනුයේ වැදගත්කම හැඟවීමට හා ඔවුන්ගේ මහත්තත්ත්වය විදහා දැක්වීමට පමණි. ඔවුහු ඔවුන්ගේම අහංකාරයෙන් අන්ධ වී ඇත. මොවුන් ගර්හාවට භාජනය කරනවාට වඩා ඔවුනට අනුකම්පාව දැක්විය යුතුය. 'මේ මේ පරිදි පමණි" යනුවෙන් දෙවියන් පිළිබඳ නියමයන් කිසිවෙකුටත් කළ නොහැක.

එපමණක් නොව, ඥානය සහ විරාගය මැන බැලීමේ යම් මිම් ප්‍රමාණ තිබිය හැකි වුවද, භක්තියේ මිම්ම එහිම ඇත. භක්තිවන්තයාගේ චෛතසික ස්වභාවයට අනුව සැකසී එය නොයෙක් ආකාරයන් ගනී. කම්ස, ජරසන්ධ, සිසුපාල, හිරන්‍යකසිපු ආදීහු දෙවියන්ට විරුඪ ආකල්පයක් ගත්හ. එම නිසා



දෙවියෝ ඔවුන්ගේ විරුඩවාදියා ලෙස මැවී සිට ඔවුන්ගේ ජීවිත කාලයන් හා පරිශ්‍රමයන් අවසන් කළහ. ජයදේව, ගෞරංගා, තුකාරාම්, රාම්දාස්, සූර්දාස්, රාධා, මීරා සහ සක්කුබායි යන අයවළුන් කළ පරිදි දෙවියන් වඩාත්ම ප්‍රේමාන්විත තැනැත්තා ලෙස සිතුවහොත් ඔහු හිතවත් ප්‍රියවන්තයා ලෙස මැවී සිට ආනන්දය නොකඩවා ලබා දෙන්නේය. කුඩා දරුවා ඔහුගේ මවගේ නලලෙහි ඇති කුම් කුම් තිලකයට සූර්යයා සමානයයි සලකයි. නමුත් කරුණු දන්නා වැඩිහිටියා එය ප්‍රභාශ්වර රශ්මියෙන් දීප්තිමත් ගෝලාකාර වස්තුවක් ලෙසට දකී. අවබෝධය ලැබීමේ ක්‍රියාවලියට මනසෙහි මැවෙන රූපයෙහි ඇති බලපෑම මෙයින් පෙනේ. දෙවියන් මෙන්ම දේවාලය පිළිබඳවද මේ නියමය යෙදේ.

දෙවියන්ට මෙන්ම දෙවියන්ගේ වාසස්ථානයටද එනම් දේවාලයටද, මිනිසාගේ උත්තරීතර ආකල්පයක් තිබීම සුදුසුය. මෙම ආකල්පයද විශාල යහපතක් කරන්නේය. මිනිසා විසින් මාධව මිනිස් වෙසින් දැකීම ස්වාභාවික හා සුදුසු වන අතර දෙවියන් සාමාන්‍ය මිනිසෙකු ලෙස පිළිගැනීම ප්‍රඥාගෝචර නොවේ. දෙවියෝ උත්තරීතර ශෝභාවක් ඇති අති සුවිශේෂ පුද්ගලයෙකු ලෙස සිතීම භක්තියෙහි මූලධර්මයකි.

පුද පූජාවන් නිසා හා පුද පූජාවන් අතරතුරදී අවදිවන හැඟීම් කරුණාවන්ත හා මිහිරි විය යුතු අතර භෞතික දෙයට වහල් වූ මිනිසුන්ගේ පහත් ආශාවන් හා තණ්හාවන් අදෘශ්‍යව පරිවර්තනය විය යුතුය. ඒවා මිනිසා තුල ඇති අප්‍රකට තිරිසන් සිතුවිලි අවදි කිරීම හෝ ඇවිස්සීම නොකළ යුතුය. මෙම නිදසුන ගන්න. රාම නිදියහනට දැමීමේ උද්‍යෝගය නිසා ත්‍යාගරාජාට නිදියහනට යාමට අමතක විය. මෙහිදී ඔබ විසින් තේරුම්ගත යුත්තේ ත්‍යාගරාජා විසින් රාම ඔන්චිල්ලාවක නිදීමට සැලැස්වූ බව නොව, රාම විසින් ත්‍යාගරාජාව භක්තිය නමැති ඔන්චිල්ලාවෙහි හිඳුවා නින්ද යාම (නැතහොත් භෞතික සියලු දෙයම අමතක වීම) ට පැදවූ බවයි. රන් හෝ රිදී තොටිල්ලෙහි ඔබගේ ඉෂ්ටදේවතාවා පදවන විට ඔබගේ දරුවා ඔහුගේ තොටිල්ල තුල බව සිතනු වෙනුවට, ඔබ විසින් දරුවා තොටිල්ලෙහි පදවන අවස්ථාවේදී ඔබගේ ඉෂ්ටදේවතාවා, රාම හෝ ක්‍රිෂ්ණා එහි සිටින බව දැකීමේ ආකල්පයක් ඇතිකරගත යුතුය. එමෙන්ම ඔබගේ ඉෂ්ටදේවතාවා ඉදිරියෙහි ඔබ සිටින විට ඔබේ හදවත තුල ඔබේ පැවැත්මේ, අවබෝධයේ සහ සන්තුෂ්ටියේ පදනම වශයෙන් බ්‍රහ්මන් ස්ථාපනය කරගත යුතුය. දේවාල වන්දනා කිරීමේදී පැවැත්වෙන ආගමික චාරිත්‍ර විධි හා උත්සව සකස්කර ඇත්තේ මෙම හැඟීම් සිතට කාවැද්දීම සඳහාය. එම නිසා සීතා-රාමා, රාධා-ක්‍රිෂ්ණා, ලක්ෂ්මි-නාරායන හෝ පාර්වතී-පරමේශ්වර යන අය, පුදපූජා පවත්වනු ලබන කපුවන් විසින් දෙනු ලබන ආහාර වලින් ජීවත්ව, පුදනු ලබන පානයන්ගෙන් පවස නිවාගෙන ඉවකඩ නොමැති දේවාලයන්හි අපහසුවෙන් ජීවත් වන "අනුකම්පා

කළයුතු ජෝඩු වශයෙන් සැලකිය යුතු නැත. දේවාලයෙහි අභ්‍යන්තර දොර විවෘත කිරීම ප්‍රතික්ෂේප කරන කපුවා "දෙවියෝ නිදිය" "දෙවියෝ ආහාර ගන්නේය" යනුවෙන් කියයි. මෙය විහිලුවකි. ඔවුන් සමහරවිට නිශ්ශබ්දතාවය රකින ලෙසද කියනුයේ "දෙවියන් නිදා සිටින හෙයින් ශබ්ද කළහොත් ඉක්මණින් අවදිවේය" යි කීමෙනි. එවැනි අවස්ථාවන්හිදී හදිසි ආයාචනයන් සඳහාද අවස්ථාවක් නැත.

මෙවැනි ප්‍රකාශයන් මිනිසුන්ගේ සිත්හි වැරදි තීරණයන් ඇතිවීම පෙළඹීමට ඉඩ තිබේ. වසතලද කුටිය තුල සිටින විට දෙවියන් ස්වාභාවික අවශ්‍යතාවයන්හි යෙදෙන්නේද යන්න වැනි නොමනා ප්‍රශ්න නැගීම් ඇතිවන අතර එවැනි ප්‍රශ්නයන් අදේව වාදය වර්ධනය කෙරේ. නියම දේවාල වන්දනා නියමයන් පිළිබඳව කපුවන් හා නුවුමනා දොස් සොයන අවිශ්වාසය පදනම් කරගත් අය යන දෙගොල්ලම නොදනිති. ඔවුන්ගේ පහත් හැසිරීමට හේතුව එයයි. පහත් ලෞකික මාර්ගය අත්හැරීමට තරම් ඔබ ශික්ෂා සම්පන්න විය යුතුය.

දේවාලය ලෞකික සිඩාන්තයන් ආශ්‍රයෙන් කිසිසේත්ම ඇගැයිය යුතු නැත. ඔබව පහත් ලෞකික මාර්ගයට වෙනත් හැටියකින් ඇද දමන හැගීම්, උසස් බවට පත්කරගත හැක්කේද, අලංකාර කරගත හැක්කේද භක්තිය නමැති ආකල්පයෙන් පමණි.

ගොතන ලද නවීන අදහස් නිසා මෙකල දේවාලයන් සමච්චලයේ විෂයයක් වී ඇත. මෙය කණගාටුදායක තත්ත්වයකි. එම නිසා දේවාල වන්දනාවේ අභිප්‍රාය කුමක්ද යන්න ප්‍රසිද්ධියේ අනාවරණය කොට ඒවාට උචිත නියම ස්ථානයට උසස් කිරීම අවශ්‍යය. දේවාලය නැවත වරක් දියුණු විය යුතුය. නැලවිලි ගීතයක් ගයන විට ඔබ මෙන් දෙවියන් නිදන්නේය. නැතහොත් යමෙකු උස් හඬින් කථා කළ විට ඔබ මෙන් දෙවියන් අවදිවන්නේය. නැතහොත් යම් ආහාරයක් දෙවියන් අභියස තැබූ විට, ඔබ කරන්නාසේ, පිනවීමට පත් වන්නේය, නැතහොත් ඔබට වන්නා සේ නිත්‍යව ආහාර නොදුනහොත් දෙවියන් දුර්වලත්වයෙන් දුර්වලත්වයට පත් වන්නේය. යන හැගීම් ඇතිව සිටීම කොතරම් මෝඩද? සියලු කල්හි සැම තන්හිම ව්‍යාප්තව පවත්නා ජීව ශක්තිය හා ස්වභාවය වශයෙන් දෙවියන් සැලකිය යුත්තේ, අන්තිම කුඩා පරමාණුව දක්වා විශ්වයම අරා සිටින, කාලය විසින් ලහාවිය නොහැකි, සිතීමට පවා නොහැකි ආකාරයට ප්‍රභාශ්වර වන, බලාපොරොත්තු වනවාට වඩා අනුකම්පා සහගතද වන හෙයින්ය. එවැනි පෞරුෂයෙන් හෙබි දෙවියන්, සැම දෙයෙහිම දොස් දකින්නන්ගේ අනවශ්‍ය විවේචනයන්ට හා අඥානයින්ගේ මිථ්‍යා මතයන්ට භාජනය කිරීම කොතරම් මෝඩද?



භක්තිවන්තයකුට කලහැක්කාසේ දෙවියන් කාලසටහනකට සම්බන්ධකර තැබිය හැක්කේද? භක්තිවන්තයෙකුට යම්කිසි නියමිත කාලයකට ආපදාවන් සිදු නොවේ. එසේ වන්නේද? දෙවියන් නින්දෙන් අවදිවන තුරු භක්තිවන්තයා බලා සිටිය යුතුද? අහෝ මෝඩකමක මහත. දරුවාට මවගේ කිරි සඳහා ඕනැම විටක හැඬිය හැකිය. මවද නින්දෙන් අවදිව තම පියයුරෙන් දරුවාට කිරි දෙන්නීය. ඇය නිදන විට මෝරහඬ දෙන්නේ යැයි කියා උරණවී දරුවා එසෙකට නොකරන්නීය. ඇත්ත වශයෙන්ම දෙවියන් නිදන්නේ නම්, විශ්ව මාතාව වන දෙවියන් කෝටි වාරයක්වත් බාධාවට පමුණුවා නින්දෙන් අවදි කරවෙන්නේය.

ඔබගේ මානසික ශක්තීන්හි ප්‍රගතිය මත එය රඳා පවතී. ඒවා අති ශ්‍රේෂ්ඨ මට්ටමට පත් විය යුතුය. දෙවියෝ සැම තැනකම ව්‍යාප්තයහ. දෙවියන්ට සැම දෙයකම හැකියාව තිබේ. දෙවියෝ විශ්ව සාක්ෂිකරුය. දෙවියන් නොදන්නා කිසිවක් නැත. මෙම සත්‍යයන් සිඩාන්ත ලෙස සැලකිය යුතු අතර සියලුම පුදපූජා පිළිවෙත් හා ආධ්‍යාත්මික ව්‍යායාමයන් සකස් කොට අර්ථකථනය කළ යුත්තේ, එම සත්‍යයන්ට අනුකූලවය. දෙවියන් පිදීමේ කාර්යය හෝ දෙවියන්ගේ නාමය හා රූපය කිසිම පහත් අවමන් හැගීමකට සම්බන්ධ කළ යුතු නැත. එම නිසා උසස්ම භක්තියද එම භක්තිය වැඩීම සඳහා කළ හැකි ආගමික පිළිවෙත්ද ඉතා අවශ්‍ය වේ. දෙවියන්ගේ නින්දට බාධාවේය යනුවෙන් ප්‍රකාශ කිරීමත්, දෙවියන් ආහාර අනුභව කරන හෙයින් කරදර කළයුතු නැති බව කීම හා එවැනි අවස්ථාවලදී දේවාලයේ දොරවල් වසාතැබිය යුතු බව කීමත් අවම වශයෙන් කියතොත් බාල කියමන්ය. එයින් පුළුල් හෝ නිවැරදි ආකල්පයක් නොහඟවන්නේය. භක්තිවන්ත හැගීම මුහුකුරා ගොස් වඩා සම්පූර්ණව විකසිත වන විට පහත් ලෞකික හැගීම් දියවී ශූන්‍ය වේ.

එක්තරා සුළු සිඩියක් මතකයට නැගේ. එක් කාලයක රාණි රස්මානි විසින් කල්කටාවේ තනවන ලද කාලි දේවාලයෙහි ඇති ගෝපාල පිළිමය පෙරළී එහි පාදය ස්වල්පයක් කැඩුනි. කැඩුණු පිළිරුවකට වැඳුම් නොකළ යුතු යැයි ශාස්ත්‍රයන්හි කියා ඇතැයි වැඩිහිටි අය බොහෝ දෙනා ප්‍රකාශ කළ නිසා නිර්මාණ කරුවන් ලවා අලුත් පිළිමයක් තැනීමට රාණි රස්මානි කටයුතු පිළියෙල කළාය. රාමක්‍රිෂ්ණාට මෙය දැනගන්නට ලැබුණෙන් එතුමා රාණිට දොස් නගමින් "මහාරාණි ඔබගේ බෑණා පාදය කඩාගතහොත් ඔබ කුමක් කරන්නේද? කළයුතු නිවැරදි දෙය කුමක්ද? පාදය පටිවලින් වෙලා සකස් කිරීමද නැතහොත් ඔහු වෙනුවට වෙනත් කෙනෙකු ගන්නේද" යි විමසීය. වැඩිහිටියන්ට හා පණ්ඩිතයන්ට කථාකරගත නොහැකි විය. ගෝපාල පිළිරුවෙහි කැඩුනු පාදය සකස් කර පිළිරුව සවිකර පෙර මෙන් පුදපූජා පැවැත්විනි. බලන්න, භක්තිය පිරිසිදු වී වඩා උසස් බවට පත් වන විට කැඩුණු පිළිරුවක වුවත් දෙවියන් ප්‍රකටව ඇත. මෙයද ශාස්ත්‍රයන්හි ප්‍රකාශ කොට ඇති ධර්මය වේ.

දොරවල් වසා තිබෙන විට ඒවා විවෘත නොකළ යුතුයැයි නියමය තිබෙන්නට පිළිවන. එය සාමාන්‍ය නියමයක් පමණි. සංකර, සනන්ද, ජයදේව, චෛතන්‍ය, ගෞරංග ආදීන් පැමිණෙන විට නියමයන් අනුව ක්‍රියා කිරීම නොපිළිවන. එසේ නොවේද? ඌඩිපිහිදී ක්‍රිෂ්ණා දෙවියන් තම භක්තිවන්තයාට දර්ශනය වූයේය. නන්දනාර්ගේ භක්තියෙහි අධික බවට ශිව යටත් විය. දොරවල් වැසීමේ හේතුවට දෙවියන් සම්බන්ධ නැත. එවැනි නියමයන් වැඩිහිටියන් විසින් කර ඇත්තේ දේවත්වයට සම්බන්ධ නැති හේතුන් නිසාය. රීතීන් තිබිය යුත්තේ භක්තිවන්තයාගේ උසස් වැටහීම සමග ගැටීමක් ඇති නොවන පරිද්දෙනි. දේවාලයෙහි සේවකයන් සඳහා කාල සීමාවන් නියම කිරීමක් නොමැතිව, සියලු දෙයම ඔවුන්ගේ හිතුමතයට කිරීමට ඉඩහරිනු ලැබුවහොත් සාමාන්‍ය මිනිසාගේ සිතෙහි භක්තිය ඇතිකිරීමට දේවාලය සමත් නොවේ. භක්තියේ මූලයන් වන ගරුසරු ඇති බිය හා ගෞරවය අවදි කිරීමටද යම් යම් සීමා කිරීම් හා රීතීන් අවශ්‍යය. දේවාලයට ඇතුල්වීම සඳහාත් එය විවෘත කිරීම සඳහාත් කාල සීමාවන් නියමකර ඇත්තේ මේ නිසාය. එවැනි සීමා කිරීම් ප්‍රධාන නියමයන්ට විරුද්ධ නොවේ. එනම් දේවාලයක පරමාර්ථය විය යුත්තේ අභ්‍යන්තර ශික්ෂණත්වය හා ආධ්‍යාත්මික විනය වර්ධනය කිරීම සඳහා ධර්මය දියුණු කිරීමය. දෙවියන් ජීවමානය යන චෛත්‍යන්‍යය වැඩීමේ සියලු අවශ්‍යතාවයන් සඳහා මානුෂික හැසිරීම්, ක්‍රියාවන්, ආකල්ප දෙවැනි විය යුතුය. එබැවින් දේවාල පිළිවෙත් නිවැරදිව කිරීම සඳහා යම් යම් රීතීන් නිසැකයෙන්ම අවශ්‍යය. එසේ නොවුනහොත් සාමාන්‍ය මිනිසුන් අවපලත්වයට, ශ්‍රද්ධාවට හා විනයට යොමු නොවන අතර ඔවුන් භක්තියෙන් වර්ධනය නොවනු ඇත. දේවාලයන් භාරව සිටින කපුවන්ගේ සහ ධර්මකර්තයින්ගේ මෙන්ම පුදපූජා පවත්වන මහජනයාගේද වගකීම ඉතා මහත්ය. දේවාලයන්හි අරමුණු හා ඒවායේ චාරිත්‍ර විධි ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සැම දෙනාම දත යුතුය. සියල්ලටම වඩා ඒවා ශ්‍රද්ධාව හා භක්තිය වර්ධනය කරන්නේය. එම නිසා ඉතා ලැදිව (විමුක්තිය) සොයන්නන්ට වන්දනාමාන කිරීම සඳහා දේවාලයේ දොර ඕනෑම වේලාවක විවෘත කළ හැක්කේය. "දේවාල පැවැත්වෙනුයේ මිනිසාගේ ප්‍රගතිය හා සුභ සිද්ධිය සඳහාය" යන කරුණ කිසිවෙකු විසින්වත් අමතක කොට නොසලකා හැරිය යුතු නැත.



# එකොළොස්වෙනි පරිච්ඡේදය

හින්දු ධර්මයෙහි නියම කර ඇති, ආධ්‍යාත්මික ප්‍රගතිය සඳහා වන ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ගයන්ට අනුව, වර්ග කර ඇති යුග තුනකි.

1. කර්ම නොහොත් ආගමික පුදපූජා පැවැත්වීම් වලට මහත් වටිනාකම් පැවරූ වේද යුගය.
2. අනෙක් සියල්ලටම වඩා ඥානය වැදගත්යයි සැලකූ උපනිෂද් යුගය සහ
3. භක්තිය වඩාත් වැදගත් බව ප්‍රකාශ කොට විස්තර කළ පුරාණ යුගය.

වේද සාහිත්‍යය සම්හිතා, බ්‍රාහ්මණ, අරන්‍යක සහ උපනිෂද් වලින් සමන්විත වේ. මේවායින් මුලින් කී තුන කර්ම පිළිබඳව වන හෙයින් කර්ම කාණ්ඩ ලෙස හැඳින්වෙන අතර, අන්තිමය වන උපනිෂද් ඥානයට අදාල වන හෙයින් එය ඥාන කාණ්ඩ ලෙස හැඳින්වේ.

වේද සම්හිතාවන්හි සඳහන් මන්ත්‍ර සමූහයන් ඉන්ද්‍ර, අග්නි, වරුණ, සූර්ය සහ රුද්‍ර යන දෙවියන්ගේ මහිමයන් ප්‍රකාශ කෙරෙන ස්තෝත්‍රයන්ගෙන් පිරී පවතී. පුරාණ කාලයේ ආර්යයන් සාමය සහ සන්තුෂ්ටිය ලබා ගැනීමද අභිලාෂයන් සපුරාගැනීම ද කරන ලද්දේ මෙම දෙවිවරුන්ට කියන ලද මන්ත්‍ර මාර්ගයෙන් කරන ලද කැප කිරීම් හා පුදපූජා වලිනි. පරමාත්ම සිද්ධාන්තය වන පරමාත්මය එකම දෙය බැව් ඔවුහු වටහා ගත්හ. එහෙත් එය වෙනත් වෙනත් නාමයන් හා රූපයන් යටතේ විවිධව පැහැදිලි වන බවද ඔවුහු වටහා ගත්හ.

බොහෝ ඍග්වේද මන්ත්‍රවල මෙය පැහැදිලිව ප්‍රකාශ කර ඇත.

ඒකම් සත් විප්‍රා බහුධා වදන්ති

අග්නිම් යමම් මාතරිස්වානමාහුඃ

"ඇත්තේ එකක් පමණි: සත්‍යය දුටු අය එය නොයෙක් ආකාරයෙන් වර්ණනා කරති. අග්නි යම මාතරිස්වාන්." දෙවැන්නක් නොමැති මෙම බ්‍රහ්මන් ඍග්වේදයෙහි නම්කොට ඇත්තේ හිරණ්‍යගර්භ, ප්‍රජාපති, විශ්වකර්ම පුරුෂ යනුවෙනි. හිරණ්‍යගර්භ සූක්ත සහ පුරුෂ සූක්ත මෙම දර්ශනයේ ශ්‍රේෂ්ඨ උදාහරණ වෙති.

පුරාණ ආර්යයන් ජීවන ක්‍රමය හැඳින්වූයේ "ධර්ම" වශයෙනි. එය "යාඥා" යනුවෙන්ද හැඳින්විය හැක. ඔවුන්ගේ දෛනික විනය ආගමික චාරිත්‍ර විධි, පූජා, වර්ණනාවන්, භාරවීම් හා කැපවීම් වලින් යුක්ත විය. එමනිසා ඔවුන්ගේ ජීවිත භක්තියෙන් නොහොත් ශ්‍රද්ධාවෙන් පරිපූර්ණ විය. සම්හිතාවන්හි භක්තිය යන්න එලෙසම යොදා නොමැති විය හැක. නමුත් "ශ්‍රද්ධා" යන්න නොමැත්තේද?

ශ්‍රද්ධායාතිඃ සම්ධ්‍යතෙ ශ්‍රද්ධාහුයතෙ හවිඃ

ශ්‍රද්ධාම්, භගස්‍ය මූර්ධනිවචසා වෙදයාමසි

"පූජා ගින්න අවුළුවා පෝෂණය කරනුයේ ශ්‍රද්ධාව මගින් පමණි. ආමන්ත්‍රනය කරනු ලබන දෙවිවරුනට කරනු ලබන පූජාවන් ඔවුන්ට ලැබෙනුයේ ශ්‍රද්ධාව නිසා පමණි. උසස්ම ගණයේ පිදුම් ක්‍රමය වන ශ්‍රද්ධාව අගය කරමු". ශ්‍රද්ධාව කොපමණ බලවත්දැයි බලන්න.

වේද යුගයේ පහසුවෙන් ඉබේම ඇතිවූ විනයත්, පූජා විධි හා චාරිත්‍රානුකූල රීතිවල අධික වර්ධනය නිසා ක්‍රමයෙන් සංකීර්ණ හා ව්‍යාකූල විය. කල් යත්ම, ධර්මයෙහි අවංගුව පවතිනුයේ යාගාව හා හෝම කිරීම බවද ස්වර්ගයට යා හැක්කේ එම ආගමික චාරිත්‍ර විධි අනුගමනයෙන් පමණක් බවද ප්‍රකාශ කෙරිනි. යාගා කිරීම දෙවියන් වැඳීමේ ක්‍රමයක් වුවද, එහි අගය දෙවියන් වෙතින් යාගාවට මාරු කෙරින. "දෙවියෝ මාගියක් පමණි", ස්වර්ගය අපේක්ෂා කරන්නේනම් යාගාව කල යුතුමවේ." ප්‍රකාශය වෙනස් වූයේ එපරිද්දෙනි.

මේ අතර උපනිෂද් යුගය උදාවිය. භෞතික අභිප්‍රායයන්, ස්ථිර වටිනාකම් වලින් ශූන්‍ය බවට, උපනිෂද්හි ප්‍රතික්ෂේප කෙරුනි. ජීවා පහත් බවට ප්‍රකාශ කරන ලදී. ඇත්ත වශයෙන්ම වේදයන්හි සඳහන් කර්මකන්ද, මිනිසාගේ උත්පත්තිය හා මරණය යන බන්ධනයන්ගෙන් මිදී යාමට ඇති ආධාරකයන් සහ සංසාර සාගරය තරණය කිරීම සඳහාවූ නෞකාවන් වශයෙන්, උපනිෂද්හි වෙනස් කිරීම් වලට හා යලි අගැයීමට භාජනය කෙරින. උපනිෂද් වලට සම්බන්ධ ආධ්‍යාත්මික අපේක්ෂකයාගේ දෘෂ්ටිය 'බාහිර ඉන්ද්‍රිය විෂයවූ ලෝකය' බිඳදමා 'අභ්‍යන්තර ලෝකය' කෙරෙහි යොමුවේ. උසස්ම මූලධර්මයේ ස්වභාවය උපනිෂද් ඍෂිවරු සාමූහිකව මෙපරිද්දෙන් ස්ථිර කලහ. 'මෙම නාම රූප ජගත් (වෙනස්වන නාමරූප ලෝකයෙ) හි එකම සදාකාලික සථිර පැවැත්මක් ඇත. එය පරමාත්මය, පරබ්‍රහ්ම වේ. ඥානයෝගයෙන් උත්තරීතර භාවයම අවබෝධකොට ගතහැකිය.' එමනිසා 'තද් විජිඥාසස්ව, තද් බ්‍රහ්ම', 'ඒ පිළිබඳව විමසන්න එය බ්‍රහ්මවේ.' උපනිෂද් (වේදාන්තයෙ) හි උගන්වන බ්‍රහ්ම විද්‍යා මෙය වේ.

මේ හැර උපනිෂද්හි මෙසේද ප්‍රකාශ කර ඇත. 'වේදයන් ප්‍රධාන වශයෙන් මනුෂ්‍ය පරමාර්ථය වන ස්වර්ගයට ළඟාවීම පිළිබඳව සැලකිල්ල දක්වන්නේ වුවද, විමුක්තිය නොහොත් මෝක්ෂය අත්කර ගැනීම සඳහාවූ මූලික පුහුණුවද සලසන්නේය. පරමාත්මයට එක්වීම මුළුමනින්ම හෝ තනිකරම බ්‍රහ්මවිද්‍යා ප්‍රගුණ කිරීම මතම රඳා නොපවතී. අධ්‍යයනයෙන්, පාණ්ඩිත්‍යයෙන් හෝ බුද්ධිමය ජයග්‍රහණයෙන් එය වෙත ළඟාවිය නොහැක. එය අවබෝධ කරගත හැක්කේ උපාසන මගින් පමණි". පණ්ඩිතයා තමාගේ උගත්කමේ බලවත්කම සමගම උපාසනයෙහි නිමග්න වුවහොත් ඇත්ත වශයෙන්ම ඔහුගේ ජීවිතය පූජනීය භාවයට පත් වන්නේය.



එවැනි අපේක්ෂාවන් ඇත්තන් ඉදිරියෙහි දෙවියන් නියම මහිමයෙන් විරාජමාන වන්නේය. ජීවියා හා පරමාත්මය එනම් පුද්ගලයා හා සාර්වභෞමිකත්වය අතර ඇති සම්බන්ධය පිළිබඳව බෘහදාරණ්‍යකෝපනිෂද්හි කර ඇති පහත දක්වන ප්‍රකාශයෙහි අදහස එයයි.

ඒශෝස්‍ය පරම ගති - ඒශෝස්‍ය පුරමම් සම්පද්

ඒශෝස්‍ය පරමෝ ලොකා - ඒශෝස්‍ය පරමානන්දම්

පුද්ගලයකුගේ උසස්ම අභිමතාර්ථය, උසස්ම ධනය, ගැඹුරුම ප්‍රීතිය සාර්වභෞමිකත්වයය. තෛත්තිරීය උපනිෂද්හි මේ ආකාරයෙන් ප්‍රකාශ කර ඇත. පරමාත්මය සන්තුෂ්ටියේ උල්පත වන්නේ, එය රසයේ මූර්තියද, පවිත්‍රතම හැඟීමද වන නිසාය. එම තත්ත්වයට පත්වීමෙන් ජීවියාට සන්තුෂ්ටියෙහි නිමග්න විය හැක. පරමාත්මය හදවතේ අන්තරීක්ෂයෙහි දීප්තිමත්ව නොපවතින්නේ නම් එහි සුන්දරත්වය අත්විඳිය හැක්කේ, ප්‍රාණවත්ව සිටිය හැක්කේ කාටද? පරමාත්මය ආනන්දයෙන් සියල්ලන්ම පෝෂණය කරන්නේය."

වේද සම්හිතාවල විසිරී තිබූ භක්තියෙහි බීජ, උපනිෂද්හි දළුලා වැඩී පුරාණයන්හි මල්වලින් පිරී අතු සහිතව වැවෙන්ට පටන් ගනී.

සත්‍ය වශයෙන්ම භක්තිය යන්නෙහි ලක්ෂණය හා චෛතසික ස්වභාවය කුමක්ද යන්න පිළිබඳව තීරණය කිරීමේදී බොහෝ දෙනාට ව්‍යාකූලත්වයක් පවතී. භක්තිය වශයෙන් හඳුන්වන ගතියෙහි ස්වභාවය කුමක්ද? භක්තිය වනුයේ කුමක්ද, නොවනුයේ කුමක්ද යනු නියම කිරීම කෙනෙකුට අපහසු කාර්යයකි. භක්තියට අප්‍රමාණ මුහුණත් තිබේ. පරිශුද්ධ, මෘදු, විද දරාගැනීමේ ශක්තිය ඇති, ශාන්ත හා ප්‍රේම හරිත උදාර තැනැත්තාටද, ඉස්තරම්ම සාධුන්ටද, සැම කල්හිම යුක්තියෙ ඉටුවනු දක්නට කැමති සමාන භක්තිවන්තයන්ගේ ඇසුරෙහි සිටින හම්සා වරුන්ටද පමණක් එය පරිශුද්ධතාවය සහ ගැඹුරු වටහාගත හැක. ගලක මෘදු භාවයද, ගින්නෙහි සිසිලද, කොහොඹ ගසෙහි පැණි රසයද සොයන්නා සේම පුද්ගලයකු තුළ ඇති භක්තියද අනාවරණය කර ගැනීම අනෙකුත් අයට අපහසුය. භක්තිවන්තයා තම ජීවිතයට වඩා දෙවියන්ට ආදරය කරන්නේය. දෙවියන්ද ඒ හා සමානවම ඔහුට බැඳී සිටින්නේය. භක්තිමත් පුද්ගලයා දෙවියන්ට වඩා උසස් වන බව සමහර මහා පුරුෂයෝද ප්‍රකාශ කරති. වලාකුළු ඒ තුළින් සාගර ජලය කුඹුරු වලට ගෙන ආවද ගොවියා සාගරයට වඩා වලාකුලට ආදරය දක්වන්නේය. සාගරය කෙලින්ම ඔවුන්ගේ කුඹුරු කරා නොඒ. භක්තිවන්තයා හා දෙවියන් අතර ඇති සම්බන්ධය තුල්සි දාස් විස්තර කරන්නේ මෙසේය. වලාකුළු සාගරයේ දයාව, ප්‍රේමය, මහිමය හා ගුවනේ සුගන්ධය ගෙන මුළු භූමිය මතම ඒවා පතිත කරන්නේය. එමෙන්ම භක්තිවන්තයෝ යන යන තැන මෙම විශේෂ

ලක්ෂණයන් රැගෙන යන්නෝය. ආකර තුලින් රන් ලබාගන්නා සේ මෙම ගුණයන්ද මිනිසා තුල ඇති දේවත්වයේම කොටසකි.

භක්තියෙහි ආනුභාවය පරීක්ෂා කිරීමට දිනක් අම්බරීෂගේ මාලිගයට දුර්වාස පැමිණියේය. මේ සඳහා ඔහු විනාශ කිරීම සඳහා ඔහුගේ කෝපයෙන් කෘත්‍ය මවන ලදී. භක්තිවන්තයින්ගේ හදවත් තුල ඇති බිය බිඳලන දෙවියන්ගේ චක්‍රය කෘත්‍ය විනාශ කොට පෘථිවියේ කෙලවර දක්වා දුර්වාස ලුහුබැඳීමට පටන්ගත්තේය. ඔහු කඳු මිටියාවත්, විල්, ගංගා පසුකොට දිවගොස් සත් සමුදුර තරණය කොට දෙව් ලොවෙහි රැකවරණය ගැනීමට තැත් කලේය. නමුත් භක්තිවන්තයෙකුගේ සතුරෙකුට කිසි තැනෙක රැකවරණය ගත නොහැක. අවශානයේ ඔහු, තමා කල වරද පිළිබඳව අතිශයින් වෙහෙසට සහ පසුතැවිල්ලට පත්වී ශෝක වන්නකු සේ වෛකුන්ඨයෙහි නාරායනගේ පාද මූලයෙහි වැඳහොත්තේය. කෙසේ වෙතත් දෙවියන් සැම විටම තම භක්තිවන්තයා සමග බැව් ප්‍රකාශ කල අතර, දෙවියන් එකම පිහිට බැව් විශ්වාස කරන භක්තිවන්තයා අත් නොහරින බැව් දෙවියෝ ප්‍රකාශ කලෝය. "ලෞකික සිතිවිලි ඇත්තවුන් ප්‍රියයැයි සලකන සියලු දෙයම මා වෙනුවෙන් අත්හරින භක්තිවන්තයා පසුපස එළදෙන පසුපස පැටවා යන්නා සේ මමද යමි."

එක් වනාවක ක්‍රිෂණ විසින් උද්ධවට මෙසේ කියන ලදී. "තපස්, ඥාන, විරාග, යෝග, ධම්, ව්‍රත, වන්දනා වලින් අත්කරගනු ලබන කුසල් මගේ භක්තිවන්තයින් විසින් වඩා පහසුවෙන් අත්කර ගනිති." නියම භක්තිවන්ත භාවය කොපමණ වටනේදැයි මෙයින් මෙනෙහි කරන්න. එහි බලය නිසා චණ්ඩාලයකුට වුවද බ්‍රාහ්මණයෙකුට වඩා විශිෂ්ට විය හැක. භක්තිවන්ත නොවන බ්‍රාහ්මණයෙකු භක්තිමත් චණ්ඩාලයෙකුට වඩා පහත් වේ. මෙය පුරාණයන්හි සවිස්තරව දක්වා ඇත. සරලව වේදයන්හි විස්තර කර ඇති "නෙති, නෙති මෙය නොවේ, මෙය නොවේ" යන්න "වචනයන්ට සේන්ද්‍රිය නොහැකි මනසට ග්‍රහණය නොවන" වශයෙන් ප්‍රකාශ කොට ඇති, ඉන්ද්‍රියයන්ට, මනසට හෝ බුධියට ලඟාවිය නොහැකි භාවයක් භාවනාවෙහි නිමග්න වූවෙකුට අත්විඳිය හැක, අත්දැකිය හැක. භක්තිය විසින් එය පහසුවෙන්ම විඥානයට ඇතුල් කරනු ලබන අතර එය භක්තිවන්තයා ප්‍රමෝදයට පත් කරන්නේය.

පුරාණයන්හි විස්තර කර ඇති වටහාගත යුතු දෙය, විශ්ව ස්වරූපය, විශ්වයේ සම්භවය වන දෙවියන් වනුයේ නිර්ගුණ-නිර්විකාර-අද්විතීය බ්‍රහ්මන් පමණක්ම නොවේ. ඔහු සියලුම උදාර, උසස් හා ආකර්ශනීය ගුණයන්හි ගණියද වේ. ඔහු සියලුම ශෝභන හා ප්‍රේමනීය දෙය සිහියට නංවන්නා හා ජීවායේ රක්ෂාස්ථානය වේ. ඔහු ශක්තීන් වර්ධනය කොට පිරිසිදු කරයි. ඉන්ද්‍රියයන් ප්‍රධාන ස්ථානයෙහි තබාගත් පුද්ගලයාට, විශාල පරිශ්‍රමයක් හා වෙහෙසක් නොමැතිව, ඥානමාර්ගයෙහි අග්‍රප්‍රාප්තියේදී හඳුනාගත හැකි වන ප්‍රත්‍යක්ෂ නොවූ නිර්ගුණ බ්‍රහ්මන් ප්‍රත්‍යක්ෂ කරගත නොහැක. පුරාණයන්හි



දෙවියන්ගේ නිර්ගුණ ආකාරයට වඩා සගුණ ආකාරය වඩාත් පැහැදිලි කරනුයේ මේ නිසාය. පළමුවෙන් අපේක්ෂකයා විසින් දෙවියන්ගේ සගුණ පැත්තට සම්බන්ධවූ සාධනයන් ප්‍රගුණ කල යුතුය. මෙය ඔහුට ඒකාග්‍රතාවය ගිම් හර දෙන අතර පසුව සාකල්‍යයේ සිට සියුම් දෙයට යන නීති පිළිවෙල අනුව, නිර්ගුණ බ්‍රහ්මන් සමග ඔහුගේ මනස එක් කල හැක. මිරිඟුව විසින් පිපාසිත මිනිසා ජලාශය කෙරෙන් බැහැරට යවන්නේය. එවිට ඔහු ආපසු හැරී ජලය ඇති ස්ථානයට පැමිණේ. ජලාශයට පැමිණෙන ඔහුට ජලය පානය කොට පිපාසය සංසිඳුවා ගැනීමට හැකිය. මෙය හඳුන්වනුයේ ස්ථූලසෞරම්භිකාන්‍යය යනුවෙනි. එමෙන්ම මෝක්ෂය අපේක්ෂා කරන්නන්ටද නිර්ගුණෝපාසන සඳහා ආශාවක් ඇතිවේ. භක්තිවන්තයන්ට ඇලුම් කරන දෙවියෝ, සාධූන් හා මහාත්මයින් බලාපොරොත්තු වන රූපකායන් ගනිති. දෙවියෝ තම කරුණාවන්ත කමින් පුරුෂාර්ථ හතරම ප්‍රදානය කරන්නෝය.

# දොළොස්වෙනි පරිච්ඡේදය

පැරුන්නෝ දේවාලයන් දේව මන්දිර ලෙස පමණක් නොව විඥාන මන්දිර ලෙසද සැලකූහ. සිහි කල්පනාවෙන් යුක්තවද, අදහස සම්පූර්ණයෙන් අවබෝධ කර ගනිමින්ද සේවය කිරීමෙන් දේවත්වයට පත්විය හැකි බව ඔවුහු දැන සිටියහ. සිතෙහි නියම නිපුනත්වය වර්ධනය කළ දේවාල උසස් විද්‍යා පීඨයන් බැව් ඔවුනට වැටහින. මිනිසා වාසය කළ කුඩා ගම්මානයෙහි වූ දේව නිවස මෙන්ම මිනිස් හදවතෙහි පිහිටි දේව නිවසද පිරිසිදු හා ශුද්ධ වන බව ඔවුහු දැන සිටියහ. ගමක දේවාලය හා එහි අවට ප්‍රදේශය පරීක්ෂා කිරීමෙන් එම ගමෙහි පදිංචිකරුවන්ගේ ගුණාංග ඔබට අනුමාන කළ හැකිය. "දේවාලයේ පරිශුද්ධතාවය සමගම එහි අවට ප්‍රදේශයත් පවිත්‍රව තිබුණහොත්, පරිශුද්ධ ගැමියන් පවට භය බව හා යහපත් මාර්ගයෙහි ගමන් කරන බව" පැරුන්නෝ සිතූහ.

එවැනි දිව්‍යඥාන මන්දිරයන්, එවැනි ආත්මෝපදේශාලයයන් එවැනි ආධ්‍යාත්මික ප්‍රබෝධයේ ආයතනයන් අද "පූජාවන්" බෙදාහරින ස්ථානයන් වී ඇති අතර, ඒවා විනෝද ගමන් යන්නවුන් ප්‍රීති උත්සව පවත්වන ස්ථානයන්ගේ තත්ත්වයට පහත වැටී ඇත. අලසයින් ඒවායේ සීමාවන් තුල රුස්වී කඩදාසි කුට්ටම් හෝ දාදු හෝ වෙනත් ක්‍රීඩා ආදිය කරති. එවැනි කණ්ඩායම් දේවාලයන්හි රුස්වන විට කලි පුරුෂ සතුටින් උදම් වන්නේය.

මෙය ධර්මයට පටහැනිය. දේවාලය ගමේ හදවතයි. එමනිසා හදවතට ඔබින ආකාරයට එය ආරක්ෂා කළ යුතුය. පෝෂණය කළ යුතුය. රැකබලා ගතයුතුය. දෙවියන් දේවාලයෙහි සක්මන් කරන බව විශ්වාස කරන්න. එය දෙවියන්ගේ වාසස්ථානයයි. දෙවියන්ට සේවය කිරීමෙන් ප්‍රීතියක් අත්වන එම වාතාවරණයෙහි පරිශුද්ධතාවය පවත්වාගැනීමේ වගකීමක් සියල්ලන්ටම තිබේ. දේවාලය සියල්ලන්ගේම හදවත බැව් විශ්වාස කරන්න. මෙය ඉටුකළ විට, මිනිසා තුල ඇති මාධවත්වය මාණික්‍යයක් සේ බබලන්නේය. සත්‍යය වනුයේද, දේවාල තැනීමේදී කරනු ලබන වියදමට හා ගනු ලබන වෙහෙසට හේතුව වනුයේද මෙයයි. ග්‍රාම බලධාරීන් හෝ රාජ්‍ය නියෝජිතයින් හෝ බැතිමතුන් ආධ්‍යාත්මික විනය සහ ඥානය වර්ධනය කිරීමට සියලු කටයුතු යෙදිය යුතුය. මිනිසාට දේවත්වයෙන් බැබලී සිටිය හැක්කේ එවිටය. එපමණක් නොවේ. ගෝපුර ආදිය මුදල් නාස්ති කිරීමක් බවට දෝෂ දර්ශනයට භාජනය කරන අති නවීන විවේචකයෝ සිටිති. මෙයින් අනාවරණය වන්නේ දුරදිග බැලීමක් නොමැති කමය. උසස් වැටහීමක් හෝ ඉහලට නැඹුරුවූ දර්ශනයක් ඇති අය එවැනි ප්‍රකාශයන් නොකරති. ගෝපුරම්හි වැදගත්කම පිළිබඳව කථා කරන්නේ නම්, එහි අරමුණ කොපමණ පූජ්‍යද, කොපමණ ගුප්තද, කොපමණ ප්‍රකටදැයි වටහාගත හැකිය. මග වැරදී ගමන් කරන්නන්ටද, සත්‍යයෙන් බැහැරවී ගිය



අයටද ගෝපුරම් මෙසේ සංඥා කරයි. "මිය යන්නවුනි! ශාරීරික ආගාටන් හා මමත්වය වර්ධනය කෙරෙන දුමාරය නිසා හරිහැටි නොපෙනෙන්, අස්ථිර හා අසත්‍ය වන ලෞකික ආශාවන් නමැති විෂ වාතය විසින් මඩනාලද ඔබ සියල්ලන්ගේම ප්‍රභවය හා පැවැත්ම වන මා අමතක කර දමා ඇත. මෙම සදාතනික, සදා පිරිසිදු, සදා සම්පූර්ණ ප්‍රීතියේ බලකොටුවට ගෞරව දක්වන්න. මා අමතක කිරීමෙන් ඔබ දුකෙහි වැතිර සිටින්නේය. ඔබ වාලුකා කාන්තාර මිරිඟුව පසුපස යන්නේය. පැමිණ සදා නොමියන මා කෙරෙහි විශ්වාසය තබන්න. පරිශ්‍රම දරා අඳුරෙන් එළියට අවුත් ආලෝක රාජ්‍යයට අවතීර්ණව ශාන්තිය නමැති රජ මාවතට එන්න. ධර්මයේ මාර්ගය එයයි. එන්න එන්න අනේ එන්න".

සෑම ගමකම නිවෙස් පෙළ මත සිට ඔසවන ලද දෑත් ඇතිව සියල්ලන්ටම ගෝපාල අමතනුයේ එලෙසය.

එබැවින්, වඩාත් උසස්වූ මෙම නිරීක්ෂණ බුද්ධිය තුලින් දකිනවිට, මිනිස් සිතිවිලි හා හැසිරීම් උසස් කිරීමට හේතුභූත වන බවට ගෝපුරම් වලට සැලකිලි කළ හැක. ගෝපුරම් තැනීමේ මූලධර්මයෙහි මූලික අදහස එයයි. මෙම තැනීම් සඳහා පොළඹවනුයේ එම උසස් සිතිවිලි වේ. නිවැරදි අදහස, අත්විඳිය හැකි හා **හැ**ඟෙන අභිප්‍රාය මෙය වේ. ගෝපුරම් මුදුනත ඇති ආලෝකය, සියල්ලන්ටම පිහිටවන ආලෝකයයි. එය, අභ්‍යන්තරයෙහි නොසෙල්වී දැවෙන පහන් සිළුවෙන්ම දල්වුනු, එම පහනේම සංදර්ශකයා වේ. එය "හරි" සමඟ සම්බන්ධවීමෙන් ලබාගත් අභ්‍යන්තරික ආලෝකයයි.

ශෝකය සහ තණ්හාව නමැති රත්වූ පාළු වැලිකතරෙහි අතරමංවූ අයට ක්ෂෙම භූමිය දේවාලයෝය. ඒවා ඔබව සිසිල් සතුට සහිත ශාන්තියට කැඳවන ප්‍රශාන්ති මන්දිර, සන්තෝෂසාධන වෙති. දුකට පත් නොමඟ ගියවුනට ගෝපුරම් මාර්ගෝපදේශකයෙකි. දේව නාමයෙහි ධජය එහි එසවී ඇත. සියල්ලෝම ඒවායින් වන සේවයට කෘතඥ විය යුතුය.

දේවාලය වටා පවතින නිර්මානයන් හා තත්ත්වයන්, චාරිත්‍ර විධි හා සිරිත් විරිත් වල අදහස ඇත්ත වශයෙන්ම මූඨ නවීනයන්ට ප්‍රෙහේලිකාවකි. ඔවුන්ගේ සීමිත අවබෝධය ඉක්මවූ යම් පිළිතුරක වටිනාකම ඔවුන්ට වටහාගත නොහැක. තද උණෙන් පෙලෙන රෝගියෙකුට පැණිරස දේ පවා තිත්ත බව දැනේ. එමෙන්ම ලෞකිකත්වය නමැති තද උණෙන් පෙලෙන අයට සත්‍යයේ නියම මිහිරි රසය විඳිය නොහැක. එම උණ බැස යායුතුය. එවිට ඔවුනට ආත්මයේ අගය ඇති දේ පිළිබඳව හරිහැටි තේරුම්ගත හැකිය.

මනුෂ්‍ය ජීවිතයේ අභිමතාර්ථය කුමක්ද? මිනිසා විසින් ඉෂ්ටකරගත යුතු බලාපොරොත්තුව කුමක්ද? එය, පක්ෂියෙකු හෝ තිරිසනෙකු මෙන් කෑම, බීම, නිදාගැනීම, සුළු සතුටක් හා දුකක් විඳීම සහ අවසානයේ මිය යාම පමණක්ද?

නැත, නියත වශයෙන්ම නැත. සුළු සිතා බැලීමකින් එය එසේ නොවන බව අනාවරණය වේ. අරමුණ නම්, බ්‍රහ්ම සාක්ෂාත්කාරය, බ්‍රහ්මන් වන පරමාත්මය අවබෝධ කර ගැනීමය එය නොමැතිව යමෙකුට ශාන්තියට පත්විය නොහැක. ඔහු එම දේව අනුග්‍රහයේ පරම සන්තුෂ්ටිය දිනිය යුතුය. ලෞකික දේ බහුල කිරීමෙන් සන්තුෂ්ටිය ලැබීම සඳහා කෙනෙකු කොපමණ උත්සාහ කළද, සෑහීමකට පත්වීමේ ප්‍රමාණය ඉතා අල්පය. සාමය නොහොත් ශාන්තිය පිළිබඳව බලන විට යමෙකුට ලෞකික දේ තුළින් කිසිසේත්ම එය ලබාගත නොහැකිය. සිතට ශාන්තිය ලැබිය හැක්කේ එය පරමාත්ම විඥානය, මූලික නිදානය, වෙනස් නොවන පැවැත්ම සමඟ එක්වූ පසුව පමණි.

කෙනෙකුට ශාන්තිය ලබාකර දීම සඳහා, මිනිසා ආශා කරන සුඛෝපභෝගී ද්‍රව්‍යයන්ගෙන් සමන්විත සැපපහසු නිවසක් හෝ වස්තු සම්භාරයක් ප්‍රයෝජනවත් නොවේ. එය දිනිය හැක්කේ යමෙකුගේ භාවයේ ගර්භය, සියලු ජීවයේ හා ජීවත් වන්නවුන්ගේ නිදානය වන දෙවියන්ට භාරවීමෙන් පමණි. මෙය ගැන සලකා බලන්න. ධනය, රත්‍රන්, දේපල හා සැපපහසුකම් ලැබීමේ වාසනාව ලද අයට ශාන්තිය තිබේද? එපමණක් නොවේ. උසස් දැනුමක් ඇති, අතිශය රූමත්, ශාරීරිකව සුපිරි මනුෂ්‍ය ශක්තියක් ඇති අය තමා සමඟ හෝ ලෝකය සමඟ හෝ ශාන්තියෙන් සිටින්ද? මේවායේත් දුඃඛිත භාවයට හේතුව කුමක්ද?

හේතුව නම්, නිර්මාණයේ දිව්‍යමය අත්තිවාරම ඔවුන් විසින් අමතක කොට ඇත. ඔවුනු පරමාත්මයෙහි අභ්‍යන්තර සිද්ධාන්තය නොතකා හැර ඇත. අත්‍යුත්තම දේවත්වය පිළිබඳ විශ්වාසය හා භක්තිය නොමැතිව පවතින ජීවිත නිෂ්ඵලය. දිව්‍යමය මූලධර්මයේ අමෘත රසය නොබැලූ ජීවිත නිෂ්ඵලය.

එය ඇත්ත වශයෙන්ම සිඩීන්ගේ අපූර්ව වෙනස් වීමකි!... ඔබගේ අව්‍යාජ පදනම, ඔබගේ සන්තුෂ්ටියේ උල්පත, ඔබගේ අවසාන ආවශ්‍යකය වූ පරමාර්ථ මූලධර්මය ඔබට බාහිර හා ඇත්වූ, අනවශ්‍ය, ඔබ ප්‍රාර්ථනා නොකරන තත්ත්වයට පත්කොට ඇති අතර ඔබ නොවටිනා සහ නුවුවමනා අලංකාර සහිත ලෝකය සමීප කොට, සහජවී, අවශ්‍ය හා ප්‍රිය උපදවන ලෙස සලකා ඇත.

දෙවියන්ට අවතනවීමෙන් උපදවාගනු ලබන පරම සන්තුෂ්ටිය නොපිළිගනිමින්, මිනිස්සු භක්තියේ නාමයෙන් පූජනීය ස්ථාන, ප්‍රාඥයින් හා ශුඩ ගංගාවන් කරා උමතුව දුවති. ස්වල්ප අව්‍යාජ භක්තිය මෙම මායාවෙන් ඔවුන් අවදි කරනු ඇත. මිනිසුන්ට ශාන්තිය ලබාකරගත හැක්කේ තමාගේ උත්පත්ති නිවසට, එනම් දෙවියන් වෙතට - ආපසු යාමෙන් පමණක් බැවි ඔවුන්ට පැහැදිලි වනු ඇත එතෙක් ගෙදර යාමේ ආශාව නිතර හොල්මන් කරනු ඇත.



දේවාල එම නිවසට යාමට කරන ආරාධනාවන්ය. එතැනට යොමු කෙරෙන සංඥා පුවරුය. එක් අවස්ථාවක ශ්‍රී රාමචන්ද්‍ර, ඔහුට සවන්දීම සඳහා චිත්‍රකූට කන්දට රැස්ව සිටි අයට මෙසේ ප්‍රකාශ කළේය. "අලුයම උදාවී සන්ධ්‍යාව එළඹේ. අලුයම සමග මිනිසා තුළ ගිජුකම අවදි වේ. සැඳෑව සමග කාමය ඔහුව ග්‍රහණය කරයි. මෙය ඔබේ ජීවන ක්‍රමය විය යුතුද? මෙය ඔබේ අරමුණ විය යුතුද? ගතවන සෑම දිනක් පාසාම, මිනිසා විසින් වටිනා අවස්ථාවක් අපතේ යවා ඇත. ඔහු මරණයේ ලෙන දෙසට තවත් පියවරක් තබා ඇත. නමුත් ඔහුගේ ඉරණම පිළිබඳව ඔහු දුක් වන්නේද? අපතේ ගිය දිනය පිළිබඳව ඔහු කණගාටු වන්නේද?" මෙම පණිවිඩය සිතේ තබාගැනීම කොතරම් වටනේද යන බව සිතන්න.

භාරතවර්ෂ සංස්කෘතියේ දෙවියෝ ප්‍රධාන විෂයය වශයෙන් ඇත්තේ එවැනි සිහිගැන්වීම් නිසාය. "භ-රත" යනු දෙවියන් කෙරෙහි "රතිය" නොහොත් ආලය ඇති රට යන්න වේ. විෂය මූලක ලෝකය පාලනය කිරීම සඳහා නිතින් සොයා ගැනීමට බටහිර වැසියන් මුළු හිතින්ම ඇතිවූ භක්තියෙන් සියලු දෙයම අත්හරිද්දී, වටහාගත් විට අචල ශාන්තිය ලබාකර දෙන විශ්වයේ මූලික නිදානය වන පරමාත්මය පිළිබඳව සෙවීමට හා අත්දැකීමට භාරත වර්ෂයෙහි මිනිස්සු සියලු දෙයම අත්හැරියහ.

අපරදිගුන් වහා නැසෙන සුළු දේ සඳහා අත් හැරීම් කරන අතර, මෙහි අත්හැරීම සදාකාලික දේ සඳහා වේ. මෙහි විඥානය සඳහාය. ඔවුන් අඥානය සඳහාය. මෙහි තපස්ය. එහි තමස්ය. ශතවර්ෂ ගණනාවක්ම මිනිසුන්ගේ මුහුණුවල සෘෂි වරුන්ගේ, ප්‍රඥාවන්තයින්ගේ හා යෝගිවරුන්ගේ ශෝභාව අඳන් බබලනුයේ එහෙයිනි. සමහරවිට බලාපොරොත්තු රහිත බුවේ, අධෛර්යයේ හා අසන්තුෂ්ටියේ සෙවනැලි මෙම රටේ මුහුණු හරහා ගියහොත් එයින් පෙන්නුම් කෙරෙනුයේ ධර්මය කෙරෙහි ඇති විශ්වාසය හීනවීම පිළිබඳව කල් ඇතිව දැනුම් දීමකි.

දේවාල වලින් බලාපොරොත්තු වනුයේ මිනිසුන්ගේ හදවත් වසා සිටින බැඳීම් නමැති තිරය ඉවත් කිරීමේ කලාව පිළිබඳව උපදෙස් දීමයි. ත්‍යාගරාජා තිරුපති දේවාලයේදී මෙසේ හඩනගා ප්‍රකාශ කළ හේතුව එයයි. "මා තුළ ඇති තිරය, අහංකාරයේ හා වෛරයේ තිරය ඉවත් කරන්න." මායා නමැති මීහිදුම දේව කරුණාව නමැති කිරණ ඉදිරියේ නැතිවී ගිය නිසා, දිව්‍යමය ශෝභාවේ ප්‍රතිරූපය වටහාගෙන විස්තර කිරීමට "සිවුදනෝ මාධවුදනෝ" යන ගීතයෙන් ඔහුට හැකිවූ අතර එම ස්වභාවයේ රසය බොහෝ සේ විඳීමට හැකිවිය. දිව්‍යමය රීතීන්ගෙන් ඔහුගේ හදවත කළඹා ප්‍රඥාවේ ගිනි පුපුර නිපදවී එය යථාර්ථාවබෝධය නමැති අග්නි ජාලාව දක්වා වැඩී ගියේය.

මෙම කලියුගයේ පමණක් නොව පෙර යුගවූ ක්‍රිත, ත්‍රේතා සහ ද්වාපර යන යුග වලද බන්ධනයෙන් නිදහස්වීමේ රහස නාමස්මරණය විය. නාමස්මරණ ස්වාභාවිකව, ස්වයම් ප්‍රවත්කව හා බාධා වලින් තොරව කල හැකි ස්ථානය වූයේ දේවාලයයි. එම නිසා, එයට යාම අවශ්‍යයෙන්ම කළයුතු වන්නේ කලියුගයෙහි වාතාවරණය තපුරු හා අධාර්මික සිතුවිලි වලින් පිරී ඇති හෙයිනි.

කැපකළ යුතු තිරිසනා වන අඥානය, පූජ්‍යමය වූ අග්නි ජාලාවට පූජා කිරීමට ඇති යාඥාව, එනම් "යාඥාවන් අතර නාම යාඥාව මම වෙමි" යි ක්‍රිෂණා ගීතාවෙහි කියා ඇත්තේ එහෙයිනි. දෙවියන්ගේ නාමය සිහිකළ හැකි දේවාල දුක නැති කිරීම සඳහාත් ප්‍රීතිය ලබාගැනීම සඳහාත් ඉතා අවශ්‍ය වේ. "පරම සන්තුෂ්ටිය සඳහා සමරණය, සමරණය සඳහා දේවාලයන්" අනුපිළිවෙල එයයි. මෙයට වඩා ප්‍රතිඵලදායි හෝ අතිශය දිව්‍යමය හෝ අතිශය රමණීය කිසිවක් නැත. "අතිශයින් චාම් නාමයද, සැම විටම තිබෙන දිව සහ දෙවියන්ගේ මහිමය පිළිබඳව පිනවන හඬකින් ගායනා කිරීමට දෙවියන්ගේ සිත්ගත්තා පිළිරුව සහිත දේවාලයද තිබෙද්දී මිනිසා අපායේ දොරටුවදෙසට පියනගන්නේ ඇයි" දැයි ව්‍යාස පුදුම විය. ඔහු පුදුම වූයේ නාමය සහ එය සමරණයේ සඵලත්වය නිසා ලද ඔහුගේම පලපුරුද්ද නිසාය. තුල්සිදාස්ද එසේමය. ඔහු නිතරම දේවාලයෙහි වාසය කරමින් ඔහු රසවිඳි ප්‍රීතිය පිළිබඳව ගායනා කලෙහිය. "අහෝ! මිනිස්සු නාමය හා දේවාලය අතහැර, වෙනත් ස්ථානවල සතුට සොයන විට, තමාගේ ආහාර පිඟානෙහි තිබෙන ප්‍රණීත හා රසවත් ආහාර අතහැර අනෙකුත් අයගේ පිඟන්වල ඉතිරි කළ දෙය සඳහා දැත් දිගු කරන මෝඩකම පිළිබඳව මට මතක් වේ" යනුවෙන් ඔහු කණගාටු වූයේය.

නාමය සහ සිත නාමයෙහි පිහිටුවා ගැනීම ඉතාමත් වැදගත් බව වේද විනයෙහිද අවධාරණය කර ඇත. "ඕම් ඉත්‍යෙකාක්ෂරම් බ්‍රහ්මම්" "ඕම් - එම එක් වචනයම බ්‍රහ්මය" යනුවෙන් ආයි ඍෂිවරු ප්‍රකාශ කර ඇත. එකද ගාත්තුවරයෙකුටවත් දෙවියන්ගේ නාමය හෝ දෙවියන්ගේ නිවස නොමැතිව ගැලවීමක් ලැබුනේද යන්න ඔබ කැමැත්තේ නම් විමසා බලන්න. ගෞරංගට ජගන්නාථ මන්දිරය ප්‍රබෝධයට හේතුව හා පිහිටද විය. ජයදේවට එය රාධා ක්‍රිෂණා මන්දිරය විය. යථාර්ථාවබෝධය සඳහා තන්දනාර්ට චිදම්බරම්හි දේවාලය හේතු වූයේය. වල්ලභාචාර්ය, කබීර්, නානක්, මීරා, රාධා, රාමනුජ, මධ්වාචාර්ය, සංකරාචාර්ය, නාම්දේව්, තුල්සිදාස්, ත්‍යාගරාජා යන සියලු දෙනාම දිව්‍යමය දෘෂ්ටියට, ඊටත් වඩා දිව්‍යමය ඥානයට පත් වූයේ දේවාල තුලින් හා මගිනි. වෙනත් වැඩි විස්තර කුමටද? මෑත කාලයේදී රාමක්‍රිෂණා පරමහංස දිව්‍යමය සැපත රසවිඳ ඔහුගේ අනන්‍යතාවය අනාවරණය කරගත්තා ලද්දේද රාණි රස්මානි විසින් තනවන ලද කාලි දේවාලයේදී නොවේද?



එවැනි දේවාලයයන් වැරදි ලෙස පරිහරණය කිරීමද , ඒවායේ පවිත්‍ර පරිසරය විනාශ කිරීමද, ඒවායින් කෙරෙන ආගමික මෙහෙයයන් අමනාප කිරීමද, ඒ තුල පවත්නා චාරිත්‍ර විධි හා සිරිත් ගර්හාවට ලක් කිරීමද, එසේ කිරීමෙන් ඒවායේ පහත වැටීමට හා කෙලෙසීමට මග සැලසීමද නියතයෙන්ම අධර්මය වේ. ධර්මය නොවේ. මේවා කරන්නවුනට අභ්‍යන්තර හෝ බාහිර ආලෝකයක් නොමැත. ඔවුහු සම්පූර්ණයෙන්ම අඳුරේය. දේවාල වන්දනාව, මහා ප්‍රඥාවන්තයින්ගේ ඇසුර, නාමස්මරණය, පිළිරූ හෝ ලිංග නමස්කාරය යන මේවා බාහිර ආලෝකය සඳහා හේතුවේ. භාවනාව, තපස, අභ්‍යන්තරය පිළිබඳ ධ්‍යානය-මේවා අභ්‍යන්තරික ආලෝකය සඳහා හේතුවේ. මේ දෙකින්ම තොරවූවහොත් මිනිසුන් දිව්‍යමය මහිමයේ දෘෂ්ටිය අත්විඳින්නේ කෙසේද?

තුල්සිදාස් ගෝස්වාමි වරෙක මෙසේ ප්‍රකාශ කිරීම පුදුමයට කරුණක් නොවේ. "ඔබට ආලෝකය නිවස තුළට මෙන්ම පිටතටද අවශ්‍ය වන්නේද? එසේ නම් පහන එළිපත්ත මත තබන්න. එමෙන්ම ශාන්තියේ ආලෝකය ඔබගේ අභ්‍යන්තරයෙහි මෙන්ම බාහිරවද පැතිරවීමට අවශ්‍යද? එසේ නම් ඔබගේ පෞද්ගලිකත්වයේ එළිපත්ත වන දිව මත දෙවියන්ගේ නාමය තබන්න. දිව මත තබන ලද පහන කිසිම කුණාටුවක් විසින් චලනය කිරීම, අඩු කිරීම හෝ නිවීම කළ නොහැක. එය ඔබටද, ඔබට මුණගැසෙන අයටද මුළු ලෝකයටමද ශාන්තිය ලබා කර දෙන්නේය.

එමනිසා පුද්ගලයාගේ ගැලවීම සඳහා රූපයේ දෘෂ්ටිය පහළ කරගන්න. නාමස්මරණය රූපයේ දෘෂ්ටිය උපදවන්නේය. ආධ්‍යාත්මය අපේක්ෂා කරන්නන් ප්‍රබෝධ කිරීම සඳහා රූපය, එහි ඇති වශීකෘත භාවය හා තේජස සමග දේවාලවල දක්වා ඇත. ඒවා සාමාන්‍ය ඇසට පෙනුනත් නොපෙනුනත් ආත්මීය සත්‍යය සොයන්නන්ට දේවාල අත්‍යාවශ්‍යක වන්නේය.

# දහතුන්වෙනි පරිච්ඡේදය

ධර්මයට අගතියක් හෝ පක්ෂපාතීත්වයක් නොමැත. එය සත්‍යයෙන් හා යුක්තියෙන් පරිපූර්ණ වී ඇත. එම නිසා මිනිසා ධර්මයෙහි ස්ථිරව සිටිය යුතුය. එයට විරුද්ධ නොවන බවට ඔහු වගබලා ගත යුතුය. එම මාර්ගයෙන් මිදියැම නොමනාය. මිනිසා අනෙකුත් අය කෙරෙහි ඇති කරගන්නා වෛරය බැහැර කොට අන්‍යෝන්‍ය එකමුතුකම හා මිත්‍රත්වය දියුණු කළ යුතු බව ධර්ම මාර්ගයෙහි අවශ්‍යතාවය වේ. එකමුතුකම හා මිත්‍රත්වය තුලින් ලෝකය දිනෙන් දිනම සන්තුෂ්ටිය ඇති ස්ථානයක් බවට පත්වේ. මේවා හොඳින් ස්ථාපිත වුවහොත් ලෝකය නොඉවසිලිවන්ත භාවයෙන්ද, අවිනයෙන්ද, කැළඹීමෙන් හා අයුක්තියෙන්ද මිදුනේ වේ.

ඔබ කුමක් පිළිබඳව ක්‍රියා කළද පළමුවෙන් ඔබ එහි නියම අර්ථය ග්‍රහණය කරගත යුතුය. ඉන්පසු එය ඔබගේ ප්‍රයෝජනය සඳහා දිනෙන් දින දියුණු කළ යුතුය. මේ ක්‍රමයෙන් ප්‍රඥාව වැඩී නිත්‍ය ප්‍රීතිය අත්වේ. මූලික කරුණු දෙක නම්: ධර්ම සහ කර්ම වේ. අපක්ෂපාතී හා අගතියෙන් තොර, ධර්මයට අනුකූල ප්‍රඥාසම්පන්න අය වේදයන්හි දක්වා ඇති පරිදි සත්‍ය මාර්ගයෙහි ගමන් කරති. අද සිටින සියලුම 'මිනිසුන්' සඳහා මාර්ගය එය වේ.

ධර්මය පිළිබඳව දැනීමකට ලඟාවීම පියවර තුනකින් සිදුවේ.

1. ධර්මය සිතට කාවද්දාගෙන ඇති විද්වතුන් යටතේ පුහුණුවක් ඔබ ලැබිය යුතුය.
2. ඔබ ආත්ම ශුද්ධියට, ස්ව-පරිශුද්ධතාවයට සහ සත්‍යයට ළඟාවීමට අපේක්ෂා කළ යුතුය.
3. පරමේශ්වරගේ භාෂිතය වූ වේද විද්‍යාවෙහි වටිනාකම ඔබ විසින් වටහාගත යුතුය.

මේ තුන සම්පූර්ණ කළ විට මිනිසාට සත්‍යය වැටහෙන අතර එම සත්‍යය අසත්‍යයෙන් වෙන්කර ගන්නා සැටිද වැටහේ. සත්‍යය පිළිබඳ මෙම සෙවීම් මිත්‍රත්වයෙන් හා සහයෝගයෙන් කළ යුතුය. සියල්ලන්ගේම යහපත සඳහා සත්‍යය සොයා ගැනීමට සියලු දෙනාම එකලෙස උත්සුක විය යුතුය. ධර්මයේ, පොදු යහපතේ නොහොත් සර්වලෝක හිතෛෂී භාවයේ උරගල මත සෑම අයෙකුගේම මතය උරගා බැලිය යුතුය. මෙම පරීක්ෂණයේ පිළිගත් සිද්ධාන්තයන් විශේෂයෙන් වෙන්කොට තබාගෙන ඒවා මනුෂ්‍ය ශුභසිද්ධිය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට ලොව පතල කළ යුතුය. මේ ක්‍රමයෙන් සියල්ලෝම සමානව ප්‍රීතිය හා සතුට වර්ධනය කර ගනිති.



"සමිතිඃ සමානි" යනුවෙන් ධර්ම ග්‍රන්ථයේ සඳහන් වේ. අධ්‍යාපනය ප්‍රේම, ඥානය සහ එයට ළඟාවීම සඳහා සියල්ලන්ටම සමාන අයිතියක් ඇත. එමනිසා සියල්ලෝම උදාර හා පිරිසිදු ක්‍රියාවන් කළ යුතුය. කරවිය යුතුය.

අයහපත් ක්‍රියාවන් අත්හැරීම, ආශාවන් අත්හැරීම යන දෙකම ඉටු කරනු ලබන්නේ මනස නොහොත් සිත නමැති එකම උපකරණයෙනි. පුරුෂාර්ථ නොහොත් මනුෂ්‍ය ජීවිතයේ අභිප්‍රායයන් ඉටුකර ගත යුත්තේ එතුලින් පමණි. නොනැවතී කරනු ලබන පුහුණුවේ ප්‍රතිඵලය වශයෙන්. සිත ඔබගේ යහපතට එකඟවීමට ඉගෙන ගනී. අනෙක් අතට, චිත්තය ඔබගේ අතීත හා වර්තමාන අත්දැකීම් ඔබ ඉදිරියේ තබා, ඒවායේ අන්‍යෝන්‍ය සම්බන්ධය අනුව සිතා බැලීමට සලස්වා ඒවාට හේතුවූ පසුබිම සමඟ සසඳා විමසා බැලීමට සලස්වයි. සිතෙහි පවත්නා මෙම ක්‍රියාවලිය තුලින් සමචිත්තතාවයට පත්විය යුතුය. එනම් ඒක චිත්ත භාවයට පත්වීමය.

සර්ව මානව සුබ නොහොත් මනුෂ්‍ය වර්ගයාගේ සුභසිද්ධිය නමැති මාර්ගයෙහි මනස සහ චිත්තය යන දෙකම සෘජුව තබාගත යුතු බව සිතේ තබා ගන්න. ධර්මය දීප්තිමත්ව බැබලී ආලෝකවත් වනුයේ සියල්ලන්ටම සේවය කරන සහ සියල්ලන්ටම ප්‍රීතිය ලබාකර දෙන අයවළුන් තුළ පමණි. එවැනි අයවළුන්ට දෙවියන්ගේ අනුග්‍රහය ලැබෙනු පමණක් නොව දෙවියන් සමග එක්වීමේ පරම වරප්‍රසාදයද හිමිවන්නේය. ඔබ යමෙකුට යමක් දෙන විට හෝ වෙනත් අයෙකුගෙන් යමක් ගන්නා විට ධර්මයේ සීමාවන් ඉක්මවා නොයන බවට වගබලා ගත යුතුය. එහි නියමයන්ට විරුද්ධව නොයන්න. මෙය ඔබගේ පරම යුතුකම බැව් විශ්වාස කොට සෑම විටම එය අනුගමනය කරන්න. ඔබගේ ශක්තියෙහි සෑම අංශුවක්ම ධර්මයේ සාරයෙන් පුරවාගෙන, සෑම ගතකරන දිනයක් පාසාම එම මාර්ගයෙහි වැඩි වැඩියෙන් ගමන් කිරීමට උත්සාහ කරන්න.

ධාර්මික පුද්ගලයා ඔහුගේ සෑම ක්‍රියාවකදීම තීරණාත්මක අධිෂ්ඨානය හා උද්‍යෝගිමත් ප්‍රමුදිත භාවය ප්‍රකට කරන්නේය. ඔහු ධර්මයට බැඳී සිටිය යුත්තේ එම ක්‍රමයටයි. දෙවියන් සෑම තැනක්ම හා සෑම දෙයක්ම දකින්නේය යන බිය සහිත ආකල්පයක් ඇතිවීමද, පාපය කරා නොදැනුවත්වම යොමු වේය යන්න නිරතුරුවම තේරුම් ගැනීමද, ස්වාභාවිකව සත්‍යය කරා නැමුනු ගතියද, නිවැරදි පැවැත්ම කෙරෙහි නැඹුරු වීමද යන සදාචාර ශක්තීන් මනස දායාද කොට ඇත්තේය. ඔබේ කටයුත්ත වනුයේ එම මනස සියලුම මනුෂ්‍යයින්ගේ ශුභ සිද්ධිය සඳහා නැඹුරු කිරීම හා යෙදවීමයි. ධර්මය කෙරෙහි විශ්වාසය තැබීම සතුට ලබාදී වර්ධනය කරයි. එයට, යමෙකු අනෙකුත් අය කෙරෙහි වර්ධනය කෙරෙන වෛරය බැහැර කළ හැක. වෙනත් කෙනෙකු දුක් විඳින විටදී හෝ කණගාටු වන විටදී හෝ එය ඔබ අහංකාරයෙන් ඉඳිමීමට නොසලස්වයි. එවැනි දුෂ්ටකමකින් ඔබට සන්තුෂ්ටිය ලබාකර දිය හැක්කේද? ඔබට සතුටුවිය හැක්කේ සියල්ලන්ම සතුටුවන විටදී පමණක් බැව් මතක තබාගන්න. සෑම විටම ප්‍රේමය පතුරා සත්‍යය පමණක් අනුගමනය කරන්න. බොරුව කිසි දිනක හිතකර නොවේ.

මිනිස්සු ගෞරව හා නින්දා කරති. නමුත් අසත්‍යයට වංචාවට හා අයුක්තියට කිසිවෙකුත් ගරු නොකරන බව ඔබට පෙනේ. සියල්ලෝම සත්‍යය, ඍජු භාවය හා යුක්තිය ගෞරවයෙන් පිළිගනිති. වේදයන්හි නියම කර ඇති පරිදි ධර්මය අත්හදා බැලෙන අතර අත්හදා බැලීමට භාජනය කළ හැක්කේය. එය අපක්ෂපාති හා සාධාරණ වේ. එය කෙරෙහි ඇතිවන විශ්වාසය ව්‍යවහාරය සමග වැඩේ. දෙවියන් වන්දනා කිරීම වේදයන්හි නියම කර ඇති රීතින්ට අනුව කළ යුතුය. මෙම ක්‍රමයෙන් මිනිස්සු ධාර්මික ගතිපැවතුම්හි ශක්තිමත් වෙති. මෙම ධර්මය දෙවියන්ගේ විධානය වේ. එය දෙවියන්ගේ සත්‍ය හඬ වන නිසා සියල්ලන් විසින්ම එය හොඳින් අනුගමනය කළ හැකිය. දේවතා යනු කවරෙක්ද? තමාගේ එදිනෙදා ජීවිතයෙහි ව්‍රතය ලෙස සත්‍යය පිළිපදින තැනැත්තා සඳහා වූ නාමය එය වේ.

දෙවියන් විසින් මිනිසාට කොපමණ නිපුනත්වයක් දී ඇත්තේද යන වග සිතා බලන්න. එම උරුමය තුළින් සත්‍යයේ අවශ්‍යතාවයන්හි ස්ථිරව සිටිමින් පුරුෂාර්ථයන් සපුරාලමින් දෙවියන් කරා යන මාර්ගයේ ඉදිරියටම යන්න. නිපුනත්වය ප්‍රයෝජනයට ගත යුත්තේ එලෙසටය. එම දායාදයෙහි අදහස එයයි. යම් යම් දේ බැලිය හැක්කේ දෘෂ්ටිය ඇති අයට පමණි. අන්ධයින්ට එම වාසනාව නොමැත්තේය. එමෙන්ම, සත්‍යය නම් දායාදය ලත් අයට පමණක්, පුරුෂාර්ථයන්ට ඇලුම් කරමින් ධර්මානුකූලව සිටින විට දෙවියන් දැකිය හැකිය. අනෙකුත් සියල්ලෝම අන්ධයහ. මිනිසාට ඔහුගේ බුද්ධිය හා විමංශන බුද්ධිය වර්ධනය කර ගැනීමට අවශ්‍ය මෙවලම්ද දෙවියන් විසින් දී ඇත්තේය. ඔහු ඒවා නිසි පරිදි ප්‍රයෝජනයට ගෙන තමා අවබෝධ කරගැනීමට තැත් කරන්නේ නම්, දෙවියන් මහත් පරිශ්‍රම දරන්නන්ට අනුග්‍රහය දක්වන නිසා, ඔහු වෙතට නව හැකියාවන් හා නව ශක්තීන් එක් කරන්නේය. මිනිසා ධර්මය අනුගමනය කිරීමට උත්සාහ ගන්නා විට, ඔහුටම සත්‍යයද අනාවරණය වන්නේය.

සත්‍යයේ විනය පිළිබඳව ඔබ සැලකිල්ල නොදක්වන්නේ නම්, ධර්මය විසින් ඔබට නියම කෙරෙන සෑම යුතුකමක්ම හා ධර්මය විසින් පොළඹවනු ලබන සෑම ක්‍රියාවක්ම මහත් බරක් සේ දැනෙනු ඇත. මේ සියලුම විද්‍යමාන දේ පිටුපස ඇති යථාර්ථය සොයන්න. එවිට ධර්මානුකූල ක්‍රියාවන් සැහැල්ලු හා ප්‍රසන්න වනු ඇත. දෙවියන් විසින් කුමන ආකාරයෙන් මිනිසා සකස් කර ඇත්තේද යත් ඔහු දෙවියන් දෙසට නැඹුරුව ඔහුගේ දෘෂ්ටිය පුළුල් වීමේදී සොම්නස් වන අතර, චරිතවත් හා ධර්මිෂ්ඨ වන විට සතුටු වේ. එම නිසා ඔහුගේ මූලික ස්වභාවයේ ස්ථිරව සිටිමින්ද, බ්‍රහ්මන් පිළිබඳව මෙනෙහි කරමින්ද, සත්‍යය පුහුණු කොට ධර්මානුකූලව හැසිරෙමින්ද මිනිසා විසින් ඔහුගේම උත්තරීතර යහපත සඳහා කටයුතු කළ යුතුය. "සත්‍යෝනාව්‍රත", සියලුම තර්ක රීතීන් ආශ්‍රයෙන් සත්‍යය සොයා පරීක්ෂා කළ යුතුය.



විනය සමන්විත වනුයේ ඔජස්, ධර්මය දැඩිලෙස අනුගමනය කිරීමේ පරාක්‍රමය, තෙජස්, අජිත ස්වයං පාලනය, සහස්, ජීවිතයේ උස් පහත් කම් නිසා ඇතිවන සතුටු හා දුක් හැඟීම් ඉවත ලීම, සත්‍යය හා ධර්මය පිළිබඳව නොවෙනස්වන විශ්වාසය, බලමව, විනයෙන් හා බ්‍රහ්මචර්යාවෙන් අත්කරගන්නා ලද උසස් ගණයේ මානසික හා ශාරීරික නිරෝගී බව, වාක්‍ය, සත්‍යය හා ප්‍රේමය පුරුදු පුහුණු කිරීමෙන් ඍජුව හා මිහිරිව කථා කිරීමට ඇති ආගාව හා හැකියාව, ඉන්ද්‍රියමොහ, ඥානේන්ද්‍රිය පහ සහ කර්මේන්ද්‍රිය පහ අවකල්ක්‍රියාවෙන් හා පව්න් බැහැර කොට, සත්‍යයේ සේවය සඳහා සියලුම ඉන්ද්‍රියයන් උසස් තත්ත්වයට පත් කිරීම, ශ්‍රීස්, ස්වයං ජයග්‍රහණය තුළින් අභ්‍යන්තර ලෝකය දිනාගෙන සියලුම ලෝකයන්හි අධිපතිත්වය දිනීම, ධර්මස්, තමාගේ අගතීන් විනාශ කොට සෑම කල්හිම සත්‍යය පරිශීලනය කිරීම - "වමක" යෙහි දක්වා ඇති පරිදි "මේ සියල්ලම මා වෙත ප්‍රදානය වේවා" යන ප්‍රාර්ථනාව මිනිසා විසින් කළ යුතුය. (ඔජස්මෙ ආදිය)

ධර්මය සියල්ලන්ටම යහපත ලබා කෙරේ. එය මෙහිදී හා මින් පසුවත් ආනන්දය ලබාදේ. මෙම සර්වභෞමික ධර්මයෙහි මහිමය මුළු මනුෂ්‍ය වර්ගයා විසින්ම තේරුම් ගැනීම මෙකලට අවශ්‍යය. උසස් හා යහපත් ආකාරයේ දැනීම, සුචරිතය, ඉතා උතුම් හා ප්‍රයෝජනවත් ආකාරයේ ක්‍රියා හා ආදර්ශයෙන් සදාචාරය පැතිරවීම යන වැදගත් ලක්ෂණයන්ගෙන් බ්‍රාහ්මණයා ප්‍රකට වන්නේය. කවුරුන් හෝ වේවා, මේවා වැඩි දියුණු කර පුහුණු කරන සහ වර්ධනය කරන තැනැත්තා බ්‍රාහ්මණයෙකි. බ්‍රාහ්මණයෙකු විසින් පවත්වාගත හැකි ආධිපත්‍යය සඳහා වූ සුදුසුකම එයයි. උසස් උගත්කමක් ඇතිව එම උගත්කමට සුදුසු පරිදි හැසිරෙන්නාට පමණක් එම තත්ත්වය යෝග්‍ය වේ. එම තත්ත්වය යුක්ති යුක්ත කිරීමට උත්සුක වන්නන්ගේ වැයම විය යුත්තේ මෙම සුදුසුකම් ලබා ගැනීමයි.

දැන් ක්ෂත්‍රියයන්ගේ ලක්ෂණයන් ගැන ඔවුන්ගේ සියලුම කර්තව්‍යයන්හිදී නිපුණ භාවයද, වීරත්වය හා ධෛර්‍යයද, නිර්භීත ක්‍රියාවන්ද, දුෂ්ටයන්ට දඬුවම් දීම හා ශිෂ්ටයන් ආරක්ෂා කිරීමට උත්සුක වීමද වේ. එවැනි ගති ගුණයන් දායාද කොටගත් අයවළුන් ක්ෂත්‍රිය භාවයට සුදුස්සෝ වෙති. එම හැඟීම ඇතිව සියලුම කර්තව්‍යයන් ඉටු කළ යුතු අතර, තම නිවසේදී සියල්ලන්ටම වැදගත් හා සුභවාදී වන රීතීන්හි පිහිටිය යුතු වන්නේය.

මීලඟට වෛශ්‍යයන් ගැන : වාණිජමය ක්‍රම පහසුවෙන් වේගවත්ව ගලායාමට සැලැස්වීමටද ජාතීන් සමස්ත ප්‍රජාවක් වශයෙන් බඳවා තබන සන්දේශන සම්බන්ධයන් ඉදිරියට ගෙනයාමට, සහ ලොව ධනය වැඩි දියුණු කිරීමට සැලැස්වීමටද ඔවුන් උත්සාහ කළ යුතුය. ඔවුන්ගේ කාර්යය එයයි. මිනිස් ජාතීන් අතර එකමුතු බව නොබිඳී අඩු නොවී තිබෙන බවට ඔවුන් වගබලා ගත යුතුය. ඔවුන් විසින් "යසස්" (උතුම් ක්‍රියාවන් හා උදාර

ජයග්‍රහණයන් සකස් කිරීම) සහ "වර්වසා" (පාසල් සහ රෝහල් වැනි ආයතන ඇති කොට අධ්‍යාපනය හා සෞඛ්‍යය වර්ධනය කිරීමට ඉවහල්වන දේ කිරීමේ දක්ෂතාවය) සඳහා උත්සාහ කළ යුතුය. සියලුම වටිනා අභිප්‍රායයන් වර්ධනය කිරීම සඳහා ඔවුන්ගේ ධනය කැප කළ යුතුය. එමගින් සදාචාරය හා යහපත් බව පෝෂ්‍ය වේ.

දැන් ශුද්‍රයන් හා ඔවුන්ගේ විශිෂ්ට ලක්ෂණ: ඔවුන් ධර්ම මාර්ගයෙන් බැහැරව නොගොස් වටනා දේ නිපදවා රැස්කළ යුතුය. ඔවුන් මනුෂ්‍ය ජීවිතයේ අරමුණු සැම විටම අවබෝධ කරගැනීමට උනන්දු වෙමින් හා ඒ සඳහා පරිශ්‍රම දරමින් නිෂ්පාදනයන් බුද්ධිමත්ව ගබඩා කොට ආරක්ෂා කළ යුතු අතර පොදු යහපත සඳහා නව නවත් නිෂ්පාදනය කළ යුතුය. මෙසේ එක්රැස් කරන ලද දේ අව්‍යාජ දක්ෂ භාවය පැතිරවීම සඳහාත් යහපත් මිනිසුන්ගේ පැවැත්ම හා තඩත්තුව සඳහාත් නොමසුරුව පාවිච්චි කළ යුතුය.

මේ ආකාරයට මෙම සිවු මිනිස් වර්ගයාගේ උත්සාහයෙහි සාමූහික දක්ෂතාවයෙන් ධනය වර්ධනය වී වැඩි වන අතර මිනිසාට සතුට ගෙනදේ. සමාජ ක්‍රමය සකස් වී ඇත්තේ ලෝක ධර්මය පවත්වාගෙන යාමේ උසස් පරමාර්ථය ඇතිව බව මේ සිවු වර්ණයටම හැඟී යා යුතුය. එක් එක් වර්ණය ඔවුන්ගේ යුතුකම්හි බැඳී සිටින්නේ නම් නිසැකයෙන්ම ලෝකයේ යහපත සහතික වේ. ඊටත් වඩා වැදගත්වන ආත්මයේ පරම සන්තුෂ්ටිය දිනීමට සැම අයෙකුටම හැකිවේ. අනෙක් අතට, ඇත්තේ එකම වර්ණයක් බවත්, සියල්ලන්ම සඳහා වූ එකම යුතුකම් පද්ධතියක් හා රීති මාලාවක් බවත් සියල්ලන්ටම හැගේ නම්, ලෝකයේ අභිවෘද්ධිය හා ආරක්ෂාව අනතරාදායක වේ.

සියල්ලෝම අලෙවි කිරීමේ ක්ෂෙත්‍රයට අවතීර්ණ වුවහොත් භාණ්ඩ මිලට ගැනීම හා පරිභෝජනය කරනුයේ කවුරුන්ද? සියල්ලෝම ගුරු වෘත්තියෙහි යෙදුනහොත් ඉගෙනීම් කොට ක්‍රියා කරනුයේ කවුරුන්ද? සියල්ලෝම අණ කළහොත් පිළිගන්නෝ කවුරුන්ද? සියල්ලෝම නිෂ්පාදනය හා වගාව කළහොත් ඔවුන්ගේ ශ්‍රමයේ ප්‍රතිඵල ලබාගනුයේ කවුරුන්ද? වර්ණ ධර්මයන් අනුව ජීවත්වීම සඳහා මාර්ගය දෙවියන් විසින් නියම කර ඇත්තේ, සත්‍යය හා ධර්මය සැම පුද්ගලික හා සමාජයීය ක්‍රියාවක් තුලින්ම පුහුණු කොට එක්සත් භාවයට දායක වන නානාවිධත්වය ඇති කිරීම සඳහාය.

වෘත්තිය වර්ණය අනුව පැවතියේය යනුවෙන්ද, රැකියාව වර්ණය මත රඳා පැවතියේය යනුවෙන්ද විශ්වාස කෙරේ. නැත, වෘත්තීන්හි පදනම මත පමණක් වර්ණයන් එසේ නම් කරන ලදී. මෙකල වර්ණ හෝ වෘත්තීන් හෝ නොමැත. අද එක් වෘත්තියකි. හෙට තවෙකකි. එක් වර්ණයක් අදය, තවෙකක් හෙටය. අද ලෝකයේ ඇති කැළඹුනු වාතාවරණයට හා පැතිරී ඇති අසහනයට මුල් වී ඇත්තේ මෙම අස්ථිර භාවයයි.



සැම වෘත්තියක් හා රැකියාවක්ම අභ්‍යන්තර සදාචාරයෙන්ද, සැම විටම සත්‍යයට සම්බන්ධ කිරීමෙන්ද, ධෛර්යය වික්ෂිප්ත භාවයට පත් නොකෙරෙන සමචිත්තතාවයෙන්ද යුක්ත කොටගෙන වර්ණයෙහි නියමිත වගකීම් සමග එහි රාජකාරී වල නියුක්ත වන්න. - ශ්‍රේෂ්ඨ අර්ථ සිද්ධිය, උත්තරීතර ආශිර්වාදය එයයි. ඔබට මෙය කිරීමට නොහැකි වුවහොත් මිනිසාගේ ඉරණම වන්නේ දුඃඛිත භාවය හා දුඃසාධ්‍ය දිළිඳු කමයි. තෝරා ගැනීම පළමු ශ්‍රී රාමරක්ෂ හා දෙවනු දුර්භික්ෂයේ ලෝකසික්ෂ අතර වේ. එම සික්ෂයෙන් (දඬුවමින්) ඔබේ රක්ෂ (ආරක්ෂකයා) මේ ධර්මසික්ෂණ (ධර්මය ඉගෙනීම) වන්නේය.

ISBN 955-8711-00-4